# වාර්ෂික වාර්තාව 2010



ශ්‍රී ලංකා
විදුලි සංදේශ නියාමන
කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව 2010

ශ්‍රී ලංකා
විදුලි සංදේශ නියාමන
කොමිෂන් සභාව



# අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය

දශක තුනක කාලයක් තිස්සේ නිරන්තරව ත්‍රස්තවාදීන්ගේ ප්‍රධාන ඉලක්ක බවට පත්ව තිබූ විදුලි සංදේශ මධ්‍යස්ථාන විනාශයට පත්ව තිබියදී වුවත් අද ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපයේ පුළුල් සම්බන්ධතා සහිත රටවල් අතරට පැමිණ තිබේ. අපි දැන් ක්‍රමයෙන් විදුලි සංදේශනය හා තොරතුරු තාක්ෂණය සතු ඉමහත් විභවය සාමය ශක්තිමත් කිරීම හා සංවර්ධනය සඳහා යොදා ගැනීමට ක්‍රමානුකූලව කටයුතු කරමින් සිටිමු.

මෙම වාර්තාවේ තිබෙන තොරතුරු ජංගම දුරකථන අංශය ප්‍රමුඛත්වය ගෙන තිබෙන විදුලි සංදේශ කර්මාන්තය වේගවත්ව වර්ධනය වන ක්ෂේත්‍රයක් ලෙස පසුගිය දශකයේ සිදුවූ සංවර්ධනයට ලබා දී ඇති මහගු දායකත්වය පෙන්වා දෙයි. රටෙහි විශාල ප්‍රදේශයක් සංවර්ධනය සඳහා විවෘත වූ පශ්චාත් ගැටුම් සමය තුළ මෙම වර්ධනය විශේෂයෙන් ශක්තිමත් වී තිබේ. විදුලි සංදේශ

කර්මාන්තය සහ නියාමන අධිකාරිය සාර්ථකව මුහුණ දුන්නා වූ මෙම තත්වය ව්‍යවසායට සහ ආයෝජනයට අභියෝගයක් වේ.

තොරතුරු තාක්ෂණයේ සැලකිය යුතු ප්‍රසාරණයක්ද අපට දැකිය හැකි අතර 2005 සිට පස් අවුරුදු කාලයක් තුළ, සියයට පහකටත් අඩුවෙන් පැවැති පරිගණක සාක්ෂරතාව ආසන්න වශයෙන් සියයට තිහ දක්වා වර්ධනය වී තිබේ. සාධාරණ ප්‍රක්ෂේපන අනුව ඉදිරියේදී මෙම වර්ධනය වඩා වේගවත් වනු ඇත. රටෙහි ආර්ථික සංවර්ධනයේ නව ක්‍රමෝපායන් තුළ ඉංග්‍රීසි භාෂාව හැදෑරීම වේගවත් කිරීමට හා තොරතුරු තාක්ෂණය ව්‍යාප්ත කිරීමට රජය විසින් වැදගත් ස්ථානයක් වී තිබෙන සංදර්භය තුළ මෙම තත්ත්වය විශේෂයෙන් දිරිගන්වන සුළුය.

තොරතුරු භාවිතා කරන දැනුවත් සමාජයක වැදගත්කම හා අවශ්‍යතා හඳුනාගැනීමෙන් පසු පරිගණක තාක්ෂණය හා තොරතුරු තාක්ෂණය රටෙහි දුරස්ථ ප්‍රදේශවලට, විශේෂයෙන් රටෙහි ජනගහනයෙන් වැඩි කොටසක් සිටින ග්‍රාමීය අංශයට රැගෙන යාමට අපි කැපවී සිටිමු. මේ නිසා ග්‍රාමීය ආර්ථිකයේ දියුණුව සඳහා අවශ්‍ය තොරතුරු රැගෙන එන, ග්‍රාමීය ව්‍යාපාර සංවර්ධනයට සහාය වන හා ග්‍රාමීය අධ්‍යාපනය ඉහළ නංවන නැණසල හෙවත් දැනුම් මධ්‍යස්ථාන හයසියයකට වඩා වැඩි ප්‍රමාණයක් සියළුම පලාත් වල සාර්ථකව පිහිටුවීමට හැකි වි තිබේ.

විදුලි සංදේශනයේ සහ තොරතුරු තාක්ෂණයේ සැළකිය යුතු දියුණුවක් ඇතිකරවන අතරම, දියුණුවට රුකුල් නොදෙන සමාජයෙහි නව බෙදීම් වලට මඟපාදන "සංඛ්‍යාංක බෙදීම" මඟින් සිදුවන අනතුරු පිළිබඳව විමසිලිමත්ව සිටිම අවශ්‍ය වේ. එබැවින් වර්ධනය වෙමින් ඉදිරියට ගමන් කරන මෙම තාක්ෂණ ක්ෂේත්‍රයන්හි දියුණුව සෑම අතකින්ම සමාජයේ සියළුම කොටස් වලට ප්‍රතිලාභ ලැබෙන සේ සිදුවන බවට වගබලා ගත යුතු වේ.

තොරතුරු තාක්ෂණයෙන් හිමිවන වාසි අගයන අතර අන්තර්ජාලයෙන් සහ මාධ්‍ය අංශවලින් අනාගතය සඳහා ජාතියේ වැදගත්ම සම්පත වන ළමා හා තරුණ පරපුරට එල්ල විය හැකි අනතුරු පිළිබඳවද අපි විමසිලිමත්වී සිටිය යුතු වෙමු. නූතන සමාජයේ දියුණුව පිළිබඳව සැලකිලිමත්ව සිටින අයගේ අවධානය යොමුවී තිබෙන සයිබර් අවකාශයේ අනතුරු වලින් එයට ගොදුරු විය හැකි සමාජ කොටස් ආරක්ෂා කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ සාධාරණ යයි සැලකිය හැකි සියළු පියවර ගැනීමට රජය කැපවී සිටී.

විදුලි සංදේශ ක්ෂේත්‍රය දියුණු මාවතක දිවෙන සේ හැසිරවීම සහ රට තුළ තොරතුරු තාක්ෂණය අධීක්ෂණය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සුභාෂිංශනය කරමි.

එයට අනාගතයේ තිබෙන අභියෝගාත්මක ඉලක්ක සාක්ෂාත් කරගැනීමට හැකිවේවා යයි පතමි.



මහින්ද රාජපක්ෂ - ජනාධිපති



# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ පණිවුඩය

සංඛ්‍යාංක සහ තොරතුරු තාක්ෂණයේ විප්ලවකාරී පෙරට යාමත් සමග විදුලි සංදේශ යටිතල ව්‍යුහයේ දියුණුව මත ආර්ථිකයේ සියළු අංශ වල ඵලදායිතාව රඳා පවතී. සංවර්ධනයට විවිධාකාරයෙන් බලපෑම් ඇති කල තිස් අවුරුදු යුද්ධයෙන් ඇති වූ බාධක තිබියදීත් කලාපය තුළ ඉතාමත් නවීන විදුලි සංදේශ කර්මාන්ත සහිතව ශ්‍රී ලංකාව අද දකුණු ආසියාවේ ඉහළ තැනක වැජඹේ.

කලාපය තුළ පළමු තැන ගැනීමේන් ශ්‍රී ලංකාව කීර්තියට පත්වූ අවස්ථා කිහිපයක් තිබෙන අතර ජංගම සන්නිවේදන සඳහා ගෝලීය පද්ධතිය (G.S.M.), සංකේත බෙදුම් බහු ප්‍රවේශය (CDMA), ස්ථාවර රැහැන් රහිත දුරකථන සේවා සහ පොදු පැකට්ටු ගුවන් විදුලි සේවය වැනි තාක්ෂණ හඳුන්වා දීමේදී පළමු තැන ගැනීම ඊට ඇතුළත් වේ.

මෙහි ප්‍රතිඵලය වන්නේ මිලියන විස්සකට ස්වල්ප වශයෙන් වැඩි ජනගහණයක් තුල ජංගම දුරකථන ප්‍රතිග්‍රාහකයන් මිලියන 17.3 ක් සහ ස්ථාවර දුරකථන මිලියන 3.6 ක් ඇතුලත්ව 2010 වසර අවසන් වන විට 100.9 ක ප්‍රතිශත සංයුක්ත ව්‍යාප්තියක් සහිතව අප සමාජය තුළ සැලකිය යුතු දුරකථන ව්‍යාප්තියක් පැවතීමයි. පසුගිය පස් වසර තුළ පරිගනක සාක්ෂරතාව දළ වශයෙන් 30% ක් දක්වා එළැඹීම හා අන්තර්ජාලයට වැඩි වැඩියෙන් ප්‍රවේශවීමට හැකිවන පරිදි විදුලි සංදේශනය ව්‍යාප්තවීමත් සමග රටෙහි තොරතුරු තාක්ෂණය 'ව්‍යාප්තියෙහි ප්‍රශංසනීය දියුණුවක් සිදුවී තිබේ. පසුගිය දශකයේදී අන්තර්ජාලය භාවිතය 2000 දී 0.5 ක ප්‍රතිශතයක් වූ සුළු මට්ටමක සිට 2009 දී 5.5 ක ප්‍රතිශතයක් දක්වා වැඩිවී 2010 දී එය 8.3 ක ප්‍රතිශතයක් දක්වා ක්ෂණික ඉහළ යාමක් පෙන්නුම් කර තිබේ. මෙය විදුලි සංදේශන හා තොරතුරු තාක්ෂණ අංශවල යුද්ධයෙන් පසු කාල පරිච්ඡේදය තුළ සිදුවූ ප්‍රගතිය දැක්වීමට කදිම නිදසුනක් වේ. මෙම වේගවත් දියුණුව ඉංග්‍රීසි අධ්‍යාපනය සහ තොරතුරු තාක්ෂණය ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රමුඛත්වයදිමේ රාජ්‍ය ප්‍රතිපත්තිය සමග ඒකාබද්ධවීම හේතුවෙන් අන්තර්ජාලය ජනතාවට වඩා සමීප වී ඇති අතර, ඒ සමගම වැඩිදෙනෙක් එදිනෙදා ව්‍යාපාර ගනුදෙනු සඳහා අන්තර්ජාලය භාවිතා කිරීම, අන්තර්ජාලය ග්‍රාමීය අංශයට

පැතිර යාම සහ විද්‍යුත් පාලනය හරහා පරිපාලනය සුසංවිධිත කිරීමට වැදගත් පියවර ගැනීම සිදුවී තිබේ.

මෙම දියුණු තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව 2006/07 දී ජාල සූදානම් දර්ශකය (Network readiness Index) අනුව 86 වන ස්ථානයේත් 2008/09 දී 72 වන ස්ථානයේත් රැඳී සිට 2010/11 දී රටවල් 138 ක් අතරින් 66 වන ස්ථානයට පත්ව තිබේ. මෙම සැලකිය යුතු දියුණුව ලබා ගත හැකි වූයේ විදුලි සංදේශන සහ තොරතුරු තාක්ෂණ වර්ධනයේ නව අභියෝග වලට මුහුණ දීමට රාජ්‍ය සහ පුද්ගලික යන අංශ දෙකෙන් ලැබුණු නොමඳ දායකත්වය නිසා වේ.

පසුගිය දශකය තුළ විශේෂයෙන්ම මහත් අභියෝගයන් මෙන්ම මහගු අවස්ථා උදාකළ යුද්ධයෙන් පසු කාල පරිච්ඡේදයේ දී මෙම අංශවලට මග පෙන්වීමේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව) භූමිකාව පිළිබඳව සඳහන් කිරීමද අවශ්‍ය වේ. ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව විසින් ගනු ලැබූ ඉතා වැදගත් පියවරක් වනුයේ විදුලි සංදේශ කර්මාන්තයේ ස්ථාවරත්වයට තර්ජනයක් එල්ල කල අපත්තිදායක තරගකාරී අයකුම පැකේජ වලක්වාලීමට පාදස්ථ මිල ගණන් සහ අන්තර් සබඳතා මිල ගණන් හඳුන්වාදීම වේ. පුළුල් පරාස අන්තර්ජාල සේවා සැපයීම හා සම්බන්ධිත සේවාවේ ගුණාත්මක භාවය අධීක්ෂණය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ADSL, WIMAX සහ HSPA සඳහා ප්‍රමිති සැසඳීමේ ක්‍රියාමාර්ගයක්ද හඳුන්වා දුනි.

ආසියානු විදුලි සංදේශ ජාලයේ කලාපීය කේන්ද්‍රය බවට ශ්‍රී ලංකාව පත් කිරීම මහින්ද චින්තනයේ වැදගත් අභිප්‍රායන් අතරින් එකක් වේ. රජයේ සංවර්ධන ක්‍රමෝපායෙහි ඇතුළත් වන අනෙකුත් අපේක්ෂිත කලාපීය කේන්ද්‍ර එනම් ශක්තිය, වාණිජ්‍යය හා වෙළඳ කටයුතු, නාවුක/සමුද්‍රාසන්න සහ ගුවන් සේවා සහ දැනුම යන අංශ වල සාර්ථකත්වය සහ විදුලි සංදේශන වලද සාර්ථකත්වය බෙහෙවින් රඳා පවතිනු ඇත්තේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ දියුණුව මත වේ. ඉදිරි කාලය තුළ මෙම අභිප්‍රාය ඉටුකර ගැනීමට විදුලි සංදේශ කර්මාන්තය මනා ලෙස හැසිරවීම ජාතික සංවර්ධන අරමුණ ඉටුකර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය කරුණක් වේ.

ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව මෙම වගකීම පිළිබඳව දැනුවත්ව සිටින අතර මෑත අවුරුදු වල ලබා ඇති ජයග්‍රහණ වලින් දිස්වන පරිදි, ගුණාත්මක සේවාවකට ඇති ඉහළ ඉල්ලුම් සපුරාලීම, ඉතා හොඳින් නියාමන කටයුතු පවත්වාගෙන යාම, ලංකාවේ ආර්ථික වර්ධනයට ප්‍රබෝධකයක් වන නවතම තාක්ෂණය ලබාගැනීම හා ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම ආදිය කෙරෙහි අවධානය යොමු වී තිබේ. තාක්ෂණික දියුණුව තරගකාරිව ඉහළ යමින් පවතින පරිසරයක් තුළ ශ්‍රී ලංකාවට ඉතාමත් යහපත් තත්ත්වයක් උදා කර ගැනීම පිණිස එය කැපවීමක් වනු ඇත.

ලලිත් වීරතුංග මහතා
සභාපති



## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

මෙම වාර්තාවේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විවිධ අංශ/ඒකක වල කාර්යයන් හා කාර්ය සාධනය ඇතුළත් වේ. කාර්ය සාධනය යටතේ 2010 වසර තුළ දී ඉටුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව සාකච්ඡා කර තිබේ. පනතේ විධි විධාන ක්‍රියාවට නැංවීම සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන් බලපත්‍ර වල සඳහන් කොන්දේසි වලට අනුව ක්‍රියාකරන බවට නිසැක වීම, බලපත්‍රලාභී ක්‍රියාකාරුවන් අතර සාධාරණ සහ තිරසාර තරඟකාරීත්වය අභිවර්ධනය කිරීම, විදුලි සංදේශ සේවාවන් සඳහා සාධාරණ මිලක් නියම කර ඇති බවට වගබලා ගැනීම, පාරිභෝගිකයින් ආරක්ෂා කරගැනීම, සමාජ නියාමනය, බාධක සහිත පහසුකම් හා දුබල සම්පත් නියාමනය, උසස් තත්ත්වයේ විදුලි සංදේශ සේවා ලබාදීමට වගබලා ගැනීම, පාරදෘශ්‍ය තීරණ ගැනීමේ ක්‍රියාමාර්ගයක් තුළින් යහපාලනය ප්‍රවර්ධනය කිරීම සහ නූතන තොරතුරු හා සන්නිවේදන යුගයේ "දැනුවත්" සාමාජිකයන් බවට සිවිල් සමාජය පත් කිරීමට සහායවීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන වගකීම වේ.

විදුලි සංදේශ කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව විසින් පියවර ගණනාවක් ගෙන තිබේ. 2010 වසර අවසන් වනවිට ස්ථාවර දුරකථන ක්‍රියාකරුවන් හතර දෙනෙක්, ජංගම ක්‍රියාකරුවන් පස් දෙනෙක්, බාහිර දොරටු ක්‍රියාකරවන් තිස්තුන් දෙනෙක් සහ අන්තර්ජාල සේවා සපයන්නන් අට දෙනෙකුගෙන් විදුලි සංදේශ සේවා අංශය සමන්විත විය. 2010 අග වන විට පනතේ 17 වගන්තිය යටතේ විදුලි සංදේශ පද්ධති ක්‍රියාකරවීම පිණිස නිකුත් කර තිබූ සමුච්චිත බලපත්‍ර සංඛ්‍යාව 64 කි. ක්‍රියාකරුවන් විශාල සංඛ්‍යාවක් පිවිසීමත් සමග වෙළඳ පොල ඉතා තරඟකාරී තත්ත්වයකට පත්විය. විදුලි සංදේශ වෙළඳ පොලහි තියුණු තරඟකාරිත්වය හේතුවෙන් අවුරුදු කිහිපයක් තිස්සේ සේවා වල මිලෙහි පහත වැටීමක් සිදුවිය. ඉතා තරඟකාරී අයකුම පැකේජ මගින් ක්‍රියාකරුවන්ගේ ලාභ කෙරෙහි අහිතකර බලපෑම් ඇති වී වෙළඳපොල අස්ථාවර වී විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ස්ථාවරත්වයට තර්ජනයක් එල්ල විය. මිලෙහි තරඟකාරීත්වය හේතුවෙන් කර්මාන්තය පිරිහීමට පත්වීම වැළැක්වීමේ අදහසින්, ශ්‍රී.ලං.වි.සං.නි.කො.

සභාව ජංගම දුරකථන කර්මාන්තය සඳහා පාදස්ථ මිල ගණන් හා අන්තර් සබඳතා මිල ගණන් නියම කළේය. සියළුම ස්ථාවර සේවා සඳහා ව්‍යාප්ත කරන ලදී. මෙම පියවර මගින් අපත්තිදායක මිල තරගය වැළකී වෙළෙඳපොළොහි නියැලි අයට බොහෝ දුරට සාධාරණ මිල නියමවීමක් හා ඔවුන් අතර සාධාරණ තරඟයක් පවත්වාගෙන යාමට ඉඩ සැලසීමක් සිදුවී කර්මාන්තය ස්ථාවර වීමට රුකුලක් ලැබුණි.

ඇතැම් රටවල රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන විදුලි සංදේශ ග්‍රාහකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඉදිරියට පැමිණෙති. එවැනි යාන්ත්‍රණයක් රටෙහි නොමැතිවීම නිසා මෑතක සිට ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවට වැඩි බරක් ඉසිලීමට සිදුවී තිබේ. විශේෂයෙන්ම එයට හේතුවී ඇත්තේ පවත්නා තරඟයට මුහුණදීම සඳහා පුළුල් පරාසය ක්‍රියාකරවන අය සදාචාරමය ක්‍රියාමාර්ග වලට අනුකූල නොවී කටයුතු කිරීමයි. එබැවින් විදුලි සංදේශ නියාමක වශයෙන් ශ්‍රී.ලං.වි. සං.නි.කො. සභාව ක්‍රියාකරුවන් පුළුල් පරාස සේවාවන් සැපයීමේදී පාරිභෝගිකයන්ට ආචාරශීලිව සලකන්නේද යන්න පිළිබඳව නිරන්තර සෝදිසියෙන් සිටී. සියළුම පුළුල් පරාස සේවාවන් අධීක්ෂණය සඳහා විශේෂ ඒකකයක් ශ්‍රී.ලං.වි. සං.නි.කො. සභාවේ පිහිටුවා තිබේ. මෙම ක්ෂේත්‍රය ඉතා දුර්වල මට්ටමක පවතින බව අපගේ නිරීක්ෂණ වලින් පැහැදිලි විය. ඒ අනුව, ස්ථාවර පුළුල් පරාස සේවා වල (ADSL සහ WIMAX) ප්‍රමිතිය ඇගයීම සඳහා වැඩ පිළිවෙලක් ආරම්භ කරන ලදී. සෑම සේවා සැපයුම්කරුවෙකුගේම ගුණාත්මක බව සහ වේගය අධීක්ෂණය කර, ප්‍රතිඵල ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ වෙබ් අඩවියෙහි පල කරන ලදී. ප්‍රමිති සැසඳීමේ මෙම ක්‍රියාමාර්ගය නිසා ක්‍රියාකරුවන්ට තම සේවා වැඩිදියුණු කිරීමට සිදු විය. සොයා ගැනීම් ප්‍රසිද්ධ කිරීමට ප්‍රථම ක්‍රියාකරුවන්ට තම සේවා වැඩි දියුණු කර ගැනීම පිණිස සහන කාලයක් ලබා දෙන ලදී.

පුළුල් පරාස ග්‍රාහකයන්ගේ යහපත උදෙසා ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව මාර්ගෝපදේශ ගණනාවක් නිකුත් කර තිබේ. ජාතික පුළුල් පරාස උපදේශක කමිටුව විසින් මෙම මාර්ගෝපදේශ සකස් කරන ලදී. මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමෙන් පසු මෙම ක්ෂේත්‍රයේ ප්‍රබල වැඩි දියුණු වීමක් සිදුවිය. එය ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ මහඟු ජයග්‍රහණයකි.

ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව පරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට වෙනම ඒකකයක් ස්ථාපිත කර ඇති අතර ග්‍රාහකයන් විශාල සංඛ්‍යාවකට මෙම ඒකකයේ සේවා වලින් ප්‍රයෝජන සැලසී තිබේ. ආබාධිත පුද්ගලයන් සඳහා විදුලි සංදේශ සේවා ලබාදීමට ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබේ. පනතේ නියමයන්ට අනුව විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකරුවන්, විශ්ව විද්‍යාල සහ අනෙකුත් පර්යේෂණ ආයතනවල සහයෝගය ඇතිව පියවර ගෙන තිබේ. ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංවිධානය (CTO), දකුණු ආසියාතික විදුලි සංදේශ නියාමකයන්ගේ කවුන්සිලය (SATRC), ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාව වැනි ජාත්‍යන්තර සංවිධාන ගණනාවක වැඩ කටයුතු වලට දායක වී තිබේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සංවර්ධනය සමඟ, අන්තර්ජාලය බහු ආංශික මෙවලමක් වී තිබේ. සන්නිවේදනය සහ විනෝදාස්වාදයට අමතරව මෙම විශ්මය ජනක මෙවලම, ටෙලි මෙඩිසින් (විදුලි සංදේශ තාක්ෂණයෙන් වෛද්‍ය සේවා ලබාගැනීම), ප්‍රජා සේවා, ආපදා කළමනාකරණයේදී සහාය වීම වැනි අවස්ථා බොහොමයකට භාවිතා කළ හැකිවේ. කෙසේ වෙතත් දැනට ගනුදෙනු සඳහා අන්තර්ජාලය (e - transaction ) භාවිතා කරනු ලබන්නේ ජනගහනයෙහි කුඩා ප්‍රතිශතයක් වේ. මෙම තත්ත්වය ඉදිරියේදී වෙනස් වනු ඇත. මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් වනුයේ ජනතාව දැනුවත් කිරීම සහ ජනතාවට දැරිය හැකි

මිලකට හා පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි මෙම සේවාව ලබාදීම වේ. අන්තර්ජාලය සංවර්ධනය වීම හා ව්‍යාප්තවීමත් සමග එය ආශ්‍රිත පැමිණිලිවල වැඩිවීමක්ද සිදුවී තිබේ. උසාවි නියෝග අනුව, ශ්‍රී.ලං.වි. සං.නි.කො. සභාවට සමාජයට හානිකර ඇතැම් වෙබ් අඩවි අවහිර කිරීමට පියවර ගැනීමට සිදුවිය.

විදුලි සංදේශනය වේගයෙන් සංවර්ධනය වන ක්ෂේත්‍රයක් වන බැවින් විදුලි සංදේශ නියාමනයෙහි නිරත කාර්ය මණ්ඩලය තම දැනුම හා කුසලතා නිරන්තරයෙන් යාවත්කාලීන කර ගත යුතු වේ. ඒ අනුව ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාල පුහුණු වැඩසටහන්, වැඩමුළු, සම්මන්ත්‍රණ, රැස්වීම් වලට සහභාගී වීමේ අවස්ථාව කාර්යය මණ්ඩලයට ලබාදී තිබේ.

විදුලි සංදේශ කර්මාන්තය ජාතික නිමැවුමට ඍජුව හා වක්‍රව සැලකිය යුතු දායකත්වයක් ලබා දී තිබේ. 2010 වසරේදී කර්මාන්තයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලට රුපියල් බිලියන 27 ක මුදලක් යවා තිබේ.

රජයේ ප්‍රතිපත්ති ලේඛනය වන මහින්ද චින්තනයේ වැදගත් අභිප්‍රායක් වනුයේ ශ්‍රී ලංකාව ආසියානු විදුලි සංදේශ ජාලයේ කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම වන අතර, සියළු පාර්ශවයන්ගේ සහයෝගය ඇතිව මෙම අභිප්‍රාය නුදුරු අනාගතයේදී සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව වෙහෙස දරමින් සිටී.

අනූෂ පැල්පිට මහතා
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ
නියාමන කොමිෂන් සභාව

# 2010 දෙසැම්බර් 31 වන දිනට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංයුතිය හා කාර්ය මණ්ඩලය

## කොමිෂන් සභාව

ලලිත් වීරතුංග මහතා
-සභාපති

අනූෂ පැල්පිට මහතා
-සාමාජික

එස්.එස්. සහබන්දු මහතා
-සාමාජික

ප්‍රසන්න ද සිල්වා මහතා
-සාමාජික

## විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්ය මණ්ඩලය

අනූෂ පැල්පිට මහතා
-අධ්‍යක්ෂ ජනරාල්

## කොමිෂන් සභා කාර්යාලය

ඒ.කේ.ඒ. සිල්වා මිය
-කොමිෂන් සභාවේ ලේකම්

## පාලන අංශය

යූ.එන්. රුද්‍රිගු මහතා
-උපදේශක/අධ්‍යක්ෂ පරිපාලන (වැ.බ)

එස්.පී.එස්. පෙරේරා මහතා
-නියෝජ්‍ය අධ්‍යක්ෂ පරිපාලන සහ මානව සම්පත්

## ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශය

එම්.කේ. ජයසේකර මහතා
-නියෝජ්‍ය අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා

අයි.එම්. ජවුසි මහතා
-සහකාර අධ්‍යක්ෂ / ජාත්‍යන්තර සබඳතා

ආර්.එම්.ජේ.කේ.බී. රත්නායක මහතා
-සහකාර අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති

## ආර්ථික කටයුතු අංශය

එච්.එන්. ජයවීර මහතා
-අධ්‍යක්ෂ ආර්ථික කටයුතු

චම්පා වරාගොඩ මිය
-නියෝජ්‍ය අධ්‍යක්ෂ / අනුගතවීම්

එච්.ඩබ්ලිව්.කේ. ඉන්ද්‍රජිත් මහතා
-වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ/තරගකාරිත්වය සහ සහකාර අධ්‍යක්ෂ - අංශික විශ්ලේෂණ

එච්.පී.එම්. පතිරණ මහතා
-සහකාර අධ්‍යක්ෂ/ක්‍රියාකරු විශ්ලේෂණ

සී.එන්. පලිහවඩන මහතා
-සහකාර අධ්‍යක්ෂ/අයක්‍රම

ශ්‍රියානි මාවැල්ලගේ මිය
-සහකාර අධ්‍යක්ෂ/පරිභෝගික සබඳතා

## වර්ණාවලි කළමනාකරණ (ව.ක.) අංශය

ආර්.ජී.එච්.කේ. රණතුංග මහතා
-නියෝජ්‍ය අධ්‍යක්ෂ - වර්ණාවලි කළමනාකරණ

ඊ.එන්.පී.කේ. රත්නපාල මහතා
-සහකාර අධ්‍යක්ෂ/ව.ක./විකාශන සහ ආවේක්ෂණ

කේ.එස්.එම්. විශාඛා මෙනෙවිය
-සහකාර අධ්‍යක්ෂ/ව.ක./ස්ථාවර සේවා/චන්ද්‍රිකා සේවා

කේ.ඒ.ඩී. ප්‍රනාන්දු මහතා
-සහකාර අධ්‍යක්ෂ/ව.ක./තොරතුරු තාක්ෂණ

ආර්.එම්.ටී.කේ.පී. ලිවේරා මිය
-සහකාර අධ්‍යක්ෂ/ව.ක./ජංගම සේවා

එස්.ඒ.ආර්. කමලනයනා මිය
-සහකාර අධ්‍යක්ෂ/ගුවන් හා සමුද්‍ර සේවා

එස්.ඊ. වාකිෂ්ට මහතා
-සහකාර අධ්‍යක්ෂ/ආවේක්ෂණ/දත්ත/ආධුනික

එම්.පී. ගුණසිංහ මහතා
-සහකාර අධ්‍යක්ෂ/ පුද්ගලික ජංගම ගුවන් විදුලි

## ජාල අංශය

ඩබ්ලිව්.ඩී. ද අල්විස් මහතා
-නියෝජ්‍ය අධ්‍යක්ෂ / ජාල

එල්. ගනේෂ්මූර්ති මහතා
-සහකාර අධ්‍යක්ෂ/තාක්ෂණික ප්‍රමිති

එම්.සී.එම්. ෆාරුක් මහතා
-සහකාර අධ්‍යක්ෂ/මාදිලි අනුමැතිය සහ දත්ත හුවමාරුව

ජේ.ඒ.එස්. ගුණානන්ද මහතා
-සහකාර අධ්‍යක්ෂ/අන්තර් මෙහෙයුම්

## බලපත්‍ර පාලන අංශය

එච්.පී. කරුණාරත්න මහතා
-නියෝජ්‍ය අධ්‍යක්ෂ/බලපත්‍ර පාලන

## නීති අංශය

ජී.සී.පී. මොරගොඩ මිය
-සහකාර අධ්‍යක්ෂ / නීති

ආර්.එස්. ගුණරත්න මිය
-සහකාර අධ්‍යක්ෂ/නීති

## තොරතුරු සහ ලේඛණ ඒකකය

කපිල ජයවර්ධන මහතා
-තාක්ෂණික නිලධාරී/සහකාර අධ්‍යක්ෂ තොරතුරු සහ ලේඛණ (වැඩ ආවරණ)

ප්‍රියානි හෙට්ටිආරච්චි මිය
-පුස්තකාලයාධිපති

දමයන්ති සමරකෝන් මිය
-පුස්තකාලයාධිපති

## ගිණුම් අංශය

ආර්.සී. රත්නායක මහතා
-නියෝජ්‍ය අධ්‍යක්ෂ/ගිණුම්

ආර්.පී. අබයදීර මහතා
සහකාර අධ්‍යක්ෂ/වැය

ඒ.එස්. හපුආරච්චි මහතා
-සහකාර අධ්‍යක්ෂ/ආදායම්

## අභ්‍යන්තර විගණන අංශය

යූ.ඒ. සමරතුංග මිය
-ප්‍රධාන අභ්‍යන්තර විගණක



කොමිෂන් සභාව




1. ලලිත් වීරතුංග මහතා - සභාපති
2. අනූෂ පැල්පිට මහතා - සාමාජික
3. එස්.එස්. සහබන්දු මහතා - සාමාජික
4. ප්‍රසන්න ද සිල්වා මහතා - සාමාජික





1. ලලිත් වීරතුංග මහතා
2. අනුෂ පැල්පිට මහතා
3. යූ. එස්. රොඩ්රිගෝ මහතා
4. එම්. එන්. ජයවීර මහතා
5. ඒ. පී. ඒ. ගුණසේකර මහතා
6. මනෝද එස්. ගමගේ මහතා
7. සනත් සිරිවර්ධන මහතා
8. සේනක කුමාර් වීරරත්න මහතා
9. යූ. ඒ. සමරතුංග මහත්මිය
10. ඩබ්. ඩී. ද අල්විස් මහතා
11. ආර්. ජී. එච්. කේ. රණතුංග මහතා
12. එම්. කේ. ජයසේකර මහතා
13. ඒ. එස්. හපුආරච්චි මහතා
14. එච්. ඩබ්. කේ. ඉන්ද්‍රජිත් මහතා
15. ආර්. එස්. ගුණරත්න මිය
16. ආර්. එම්. ටී. කේ. පී. ලිවේරා මහත්මිය
17. ඊ. එම්. පී. කේ. රත්නපාල මහතා
18. එම්. සී. එම්. ෆාරුක් මහතා
19. ආර්. එම්. ජේ. කේ. බී. රත්නායක මහතා
20. ජේ. ඒ. එස්. ගුණානන්දන මහතා
21. එල්. ගනේෂමූර්ති මහතා
22. ආර්. පී. අබයදීර මහතා
23. ජී. සී. පී. මොරගොඩ මහත්මිය
24. ශ්‍රියාණි මාවැල්ලගේ මහත්මිය
25. අයි. එම්. ජවුසි මහතා
26. එන්. ඒ. ආර්. කමලනයනා මහත්මිය
27. සී. එන්. පලිහවඩන මහතා
28. එස්. ඊ. වාකිෂ්ට මහතා
29. එම්. සී. ගුණසිංහ මහතා
30. කේ. එන්. ජයවර්ධන මහතා
31. ඩබ්. එල්. ඒ. කේ. ඒ. ගුණතිලක මහතා
32. එච්. පී. එච්.එම්. පතිරණ මහත්මිය

# පටුන


පිටුව

1. පරිච්ඡේදය ... 22
විදුලි සංදේශ අංශය පිළිබඳ සමස්ත විග්‍රහය

2. පරිච්ඡේදය ... 27
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (ශ්‍රී.ලං.වි.සං.නි.කො.ස)
ආරම්භය, දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ, වගකීම් සහ කාර්යයන්

3. පරිච්ඡේදය ... 32
ප්‍රතිපත්ති සහ අන්තර්ජාතික සබඳතා අංශය

4. පරිච්ඡේදය ... 40
ආර්ථික කටයුතු අංශය

5. පරිච්ඡේදය ... 46
වර්ණාවලි කළමනාකරණ අංශය

6. පරිච්ඡේදය ... 55
ජාල අංශය

7. පරිච්ඡේදය ... 60
බලපත්‍ර පාලන අංශය

8. පරිච්ඡේදය ... 65
පරිපාලන සහ මානව සම්පත් අංශය

**9. පරිච්ඡේදය** 74

නීති අංශය

**10. පරිච්ඡේදය** 77

තොරතුරු සහ ලේඛණ ඒකකය

**11. පරිච්ඡේදය** 80

අභ්‍යන්තර විගණන අංශය

**12. පරිච්ඡේදය** 83

ගිණුම් අංශය

87

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් වාර්තාව

101

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

# වගු


| | | |
|---|---|---|
| වගුව 1 | විදුලි සංදේශ ක්‍රියාකරවන්නන් විසින් කරන ලද ආයෝජන 2009-2010 | 42 |
| වගුව 2 | ස්ථාවර සහ ජංගම ක්‍රියාකරුවන්ගේ ආදායම 2009-2010 | 42 |
| වගුව 3 | ස්ථාවර සහ ජංගම කර්මාන්තයේ ශුද්ධ ලාභය/පාඩුව 2009-2010 | 43 |
| වගුව 4 | 2010 වසරේදී පරික්ෂාවට බඳුන් වූ අනුගතවීම්වලට අදාල ගැටළු | 44 |
| වගුව 5 | 2010 වසරේදී වෙන්කරනු ලැබූ මුළු සංඛ්‍යාත සංඛ්‍යාව | 48 |
| වගුව 6 | 2010 වසරේදී වර්ණාවලිය භාවිතා කරන්නන් සඳහා නිකුත් කරනු ලැබූ මුළු බලපත්‍ර සංඛ්‍යාව | 49 |
| වගුව 7 | 2010 වසර තුලදී ලැබුණු පැමිණිලි සහ සිදුකරන ලද අන්වේශන | 49 |
| වගුව 8 | 2010 වසරේදී හඳුනාගත් නීති විරෝධී පුද්ගලයින් සහ ඊට අදාලව ගනු ලැබූ නිවාරණ ක්‍රියාමාර්ග | 49 |
| වගුව 9 | 2010 වසරේදී නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා | 50 |
| වගුව 10 | IBRD ලියාපදිංචි වූ සංඥා සම්ප්‍රේෂක | 54 |
| වගුව 11 | 2010 වසරේදී ජාල අංශය විසින් ක්‍රියාවට නැංවූ වැඩකටයුතු වලට අදාල සංඛ්‍යා ලේඛණ | 56 |
| වගුව 12 | 2010 වසරේදී වෙන්කරනු ලැබූ කෙටි සංකේත | 59 |
| වගුව 13 | 2010 වසර අවසාන වන විට විදුලි සංදේශ පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරන ලද සමුච්චිත බලපත්‍ර සංඛ්‍යාව | 61 |
| වගුව 14 | 2010 වසරේදී ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ කාර්ය මණ්ඩලය සහභාගී වූ පුහුණු වැඩසටහන් / අධ්‍යයන ශිෂ්‍යත්ව / සම්මන්ත්‍රණ | 66 |
| වගුව 15 | 2010 වසරේදී තොරතුරු තාක්ෂණ ඒකකය විසින් ඉටුකරනු ලැබූ ක්‍රියාකරකම් | 78 |
| වගුව 16 | 2010 වසරේදී අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කරනු ලැබූ වර්තා වල ලැයිස්තුව | 81 |
| වගුව 17 | 2009 සහ 2010 වසර වල ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ ආදායම | 84 |
| වගුව 18 | 2009 සහ 2010 වසර වල මහා භාණ්ඩාගාරය වෙත යැවීම සඳහා P.S.T.N. ක්‍රියාකරුවන්ගෙන් එකතු කර ගනු ලැබූ බදු මුදල් | 85 |
| වගුව 19 | 2010 ඇස්තමේන්තුගත අයවැය සහ සත්‍ය අයවැය | 85 |

# රූප සටහන්


| | | |
|---|---|---|
| 1 රූපය | 2000 - 2010 තුල ග්‍රාහකයන්ගේ වර්ධනය | 24 |
| 2 රූපය | 2010 වසරේදී පළාත් අනුව ස්ථාවර දුරකථන ව්‍යාප්තිය | 24 |
| 3 රූපය | 2010 වසරේදී පළාත් අනුව A.D.S.L. ව්‍යාප්තිය | 25 |
| 4 රූපය | ජාලයෙන් බාහිර ජංගම දුරකථන ගාස්තු වල සාමාන්‍යයෙහි ප්‍රවනතාව | 41 |
| 5 රූපය | ජාලය තුළ ජංගම දුරකථන ගාස්තු වල සාමාන්‍යයෙහි ප්‍රවනතාව | 41 |
| 6 රූපය | 2009 - 2010 වසර වල මුළු ආදායමට ප්‍රතිශත දායකත්වය | 43 |
| 7 රූපය | පුළුල් පරාස ග්‍රාහක සංඛ්‍යාව වෙනස් වීම 2009 - 2010 | 44 |
| 8 රූපය | ජංගම දුරකථන හඳුනාගැනීම ක්‍රියාත්මක කිරීමේ පද්ධතිය (IMEI) | 52 |

# කෙටි යෙදුම් ලැයිස්තුව

(අවබෝධ කර ගැනීමේ පහසුව සඳහා ඉංග්‍රීසි කෙටි යෙදුම් වලට අදාල ඉංග්‍රීසි පදය සඳහන් කර ඇත)

| | |
|---|---|
| 3G | Third Generation<br>තෙවන පරම්පරාව |
| ADSL | Asymmetric Digital Subscriber Line<br>අසමමිතික සංඛ්‍යාංක ග්‍රාහක රැහැන |
| APT | Asia Pacific Telecomunity<br>ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාව |
| ARO | Amateur Radio Operator<br>ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරු |
| BOI | Board of Investment<br>ආයෝජන මණ්ඩලය |
| CDMA | Code Division Multiple Access<br>සංකේත බෙදුම් බහු ප්‍රවේශය |
| CECB | Central Engineering Consultancy Board<br>මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය |
| CEO | Chief Executive Officer<br>ප්‍රධාන විධායක නිලධාරී |
| CID | Criminal Investigation Department<br>අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුව |
| COSPASAT | Cosmischeskaya Sistema Poiska Aveariynyh Sudoy<br>කොස්මි චෙස්කෙයා සිස්ටමා පොයිස්කා ඇවරින්හ් සුඩෝව් මෙම රුසියන් පද වලින් හදුන්වන්නේ ආපදාවකට ලක්වූ නැව් සොයා ගැනීම සඳහා වූ අභ්‍යාවකාශ පද්ධතියකි. |
| CTO | Commonwealth Telecomunications Organization<br>පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංවිධානය |
| ELT | Emergency Locator Transmitter<br>අවදානම පිහිටි ස්ථානය සොයා ගැනීමේ ට්‍රාන්ස්මීටරය |
| FM | Frequency Modulation<br>සංඛ්‍යාත අනුකලනය |
| FUP | Fair Usage Policy<br>සාධාරණ භාවිත ප්‍රතිපත්ති |
| GPRS | General Packet Radio Service<br>ජංගම සන්නිවේදනය සඳහා ගෝලීය පද්ධතිය |
| GSM | Global System for Mobile<br>ජංගම සන්නිවේදනය සඳහා ගෝලීය පද්ධතිය |
| HSPA | High Speed Packet Access<br>අධිවේග පැකැට්ටු ප්‍රවේශය |
| IBRD | International Beacon Registration Database<br>අන්තර්ජාතික සංඥා ලියාපදිංචි දත්ත මූලය |
| ICT | Information and Communication Technology<br>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය |
| ICTAD | Institute for Construction Training and Development<br>ඉදිකිරීම් පුහුණු සහ සංවර්ධන ආයතනය |
| IDF | Institutional Development Fund<br>ආයතන සංවර්ධන අරමුදල |
| IMEI | Implementation of Mobile Equipment Identity<br>ජංගම උපකරණ හඳුනාගැනීම ක්‍රියාත්මක කිරීමේ පද්ධතිය |
| IMO | International Maritime Organization<br>ජාත්‍යන්තර සමුද්‍ර සංවිධානය |
| INGAF | Institute of Government Accounting and Finance<br>රාජ්‍ය ගිණුම් සහ මූල්‍ය ආයතනය |
| IP | Internet Protocol<br>අන්තර්ජාතික මූල ලේඛය |
| ISP | Internet Service Provider<br>අන්තර්ජාල සේවා සැපයුම්කරු |
| ITU | International Telecomunications Union<br>ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය |
| ITU-T | ITU - Telecommunication Standardization Sector<br>ITU - විදුලි සංදේශ ප්‍රමිතිකරණ අංශය |
| Kbps | Kilo bytes Per Second<br>තත්පරයකට කිලෝ බයිට් |

| | |
|---|---|
| LAN | Local Area Network<br>සීමිත ප්‍රදේශයක වූ පරිගණක ජාලය |
| LECO | Lanka Electricity Company (Private) Limited<br>සීමාසහිත ලංකා විදුලි සංගමය (පුද්ගලික) |
| MDGs | Millennium Development Goals<br>සහස්‍ර සංවර්ධන අරමුණු |
| MHz | Mega Hertz<br>මෙගා හර්ට්ස් |
| MNP | Mobile Number Portability<br>ජංගම දුරකථන අංක හුවමාරුව |
| NBN | National Backbone Network<br>ජාතික කශේරු ජාලය |
| NGAN | Next Generation Access Network<br>මතු පරම්පරා ප්‍රවේශ ජාලය |
| PC | Procurement Committee<br>ප්‍රසම්පාදන කමිටුව |
| PLB | Personal Locator Beacon<br>පුද්ගල ස්ථානගතවීම් හැඳින ගැනීමේ සංඥා උපකරණ |
| PSTN | Public Switching Telephone Network<br>පොදු මංමාරු දුරකථන ජාලය |
| QoS | Quality of Service<br>සේවා ගුණාත්මක භාවය |
| SAR | Specific Absorption Rate<br>විශේෂිත අවශෝෂණ අනුපාතිකය |
| SAARC | South Asian Association for Regional Co-Operation<br>කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික සංගමය |
| SAFIR | South Asia Forum for Infrastructure Regulation<br>යටිතල නියාමනය සඳහා වූ දකුණු ආසියාතික සංගමය |
| SARSAT | Search and Rescue Satellite - AIded Tracking<br>චන්ද්‍රිකා නිරීක්ෂණ මගින් සොයා ගැනීම හා මුදාහැරීම |
| SATRC | South Asian Telecom Regulators' Council<br>දකුණු ආසියාතික විදුලි සංදේශ නියාමකයන්ගේ කවුන්සිලය |
| SIM | Subscriber Identity Module<br>ග්‍රාහක අනන්‍යතා මොඩියුලය |
| SL | Sri Lanka<br>ශ්‍රී ලංකා |
| SMS | Short Message Service<br>කෙටි පණිවුඩ සේවාව |
| TAC | Type Allocation Code<br>වර්ග වෙන්කිරීමේ සංකේතය |
| TEC | Technical Evaluation Committee<br>තාක්ෂණික ඇගයීම් කමිටුව |
| TOR | Terms of Reference<br>කාර්යභාර කොන්දේසි |
| TRCSL | Telecommunication Regulatory Commission of Sri Lanka<br>ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ලං.වි.සං.නි.කො.ස.) |
| TRIVES | TRCSL Imei Verfication System<br>ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජංගම උපකරණ<br>අනන්‍යතාව අංක තහවුරු කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම,<br>ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව |
| TV | Television<br>රූපවාහිනිය |
| UCSC | University of Colombo School of Computing<br>කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසල |
| USD | United State Doller<br>එක්සත් ජනපද ඩොලරය |
| USO | United Satellite Organization<br>එක්සත් චන්ද්‍රිකා සංවිධානය |
| WG | Working Group<br>වැඩෙහි නිරත කණ්ඩායම |
| WIMAX | World Wide Interperability for Micro Wave Access<br>ක්ෂුද්‍ර තරංග ප්‍රවේශ සඳහ ලෝක ව්‍යාප්ත අන්තර් මෙහෙයුම් සත්‍යතාව |
| WSIS | World Summit on the Information Society<br>තොරතුරු සමාජය පිළිබඳ ලෝක සමුළුව |
| WTISD | World Telecommunications and Information Society Day<br>ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය |
| WTSA | World Telecommunication Standardization Assembly<br>ලෝක විදුලි සංදේශ ප්‍රමිතිකරණ පර්ෂදය |

1 පරිච්ඡේදය

# විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ විමසුමක්

කොළඹ සහ ගාල්ල අතර ටෙලි ග්‍රැෆික පරිපථය ආරම්භයත් සමග ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ඉතිහාසය 1858 දක්වා දිවයයි. 1880 වසරේදී පළමු දුරකථන රැහැන ස්ථාපනය කරන ලදී. 1896 දී රජයට පවරාගන්නා තෙක් එය පෞද්ගලික දුරකථන සමාගමට අයත්ව තිබුණි. 1991 මුල්භාගයේදී විදුලි සංදේශ අංශයේ පාලන රීති හා සීමා ඉවත් කර විවෘත තත්වයට පත් කරන තෙක් 1896 සිට 1991 දක්වා කාලය තුළ විදුලි සංදේශ කටයුතු රාජ්‍ය ඒකාධිකාරීත්වය යටතේ පැවතුණි. 1991 දී පළමු දත්ත සන්නිවේදන බලපත්‍රය සීමා සහිත ලංකා සන්නිවේදන සේවා (පුද්ගලික) සමාගමටත්, පළමු ජංගම දුරකථන බලපත්‍රය සෙල්ටෙල් ලංකා පුද්ගලික සමාගමටත් නිකුත් කරන ලදී. එතැන් පටන් ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ වෙළඳපොල දේශිය සහ විදේශීය ආයෝජකයින්ට ආකර්ෂණීය ආයෝජන ක්ෂේත්‍රයක් විය. වර්තාමනයේ විදුලි සංදේශ අංශය පාලනය වනුයේ 1996 අංක 27 දරණ පනතින් සංශෝධිත 1991 අංක 25 දරණ පනත මගින් සහ එම පණත යටතේ ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ලං.වි.සං.නි.කො.ස) මගිනි. මෙම වාර්ථාවේ පනත යනුවෙන් 1996 අංක 27 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 1991 අංක 25 දරණ විදුලි සංදේශ පනත අදහස් වේ. කොමිෂන් සභාව යනුවෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ලං.වි.සං.නි.කො.ස.) අදහස් වේ.

විදුලි සංදේශ කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය සංවර්ධනයෙහි වැදගත් භූමිකාවක් ඉටුකර තිබේ. පසුගිය දශක දෙක තුළ ශ්‍රී ලංකාවේ සේවා කර්මාන්තයේ වර්ධනයෙහි වැඩි ප්‍රමාණයකට දායකවී ඇත්තේ විදුලි සංදේශ කර්මාන්තයේ ප්‍රවර්ධනයයි. රට අභ්‍යන්තරයේ මෙන්ම ඉන් බාහිරවත් සන්නිවේදනයේ වැඩි දියුණුවීම් සහ තොරතුරු ලබාගැනීමට ඉහල ප්‍රවේශයක් තිබීමත් මගින් ජනගහනයෙන් සෑම කොටසකටම වාගේ දිවි පෙවෙත්, ජීවන රටා සහ ජීවන තත්වයේ ගුණාත්මක බව වැඩි දියුණු වී තිබේ. දශක තුනකට ආසන්න කාලයක් පැවති යුධ ගැටුම් නිමවී සාමය නැවත ස්ථාපිත වීමත් සමග මෑත කාලයේදී ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තය සීඝ්‍රයෙන් වර්ධනය වී තිබේ.

රටේ උන්නතිය සඳහා විදුලි සංදේශනය, රූපවාහිනිය, ගුවන් විදුලිය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා මනා ලෙස ප්‍රයෝජනයට ගත යුතුවේ. ජාතික මෙන්ම අන්තර්ජාතික අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය වන්නා වූ විදුලි සංදේශ ජාලය මනා ලෙස සහ කාර්යක්ෂම ලෙස මෙහෙයවීම මගින් විදුලි සංදේශ ක්‍රියාකරුවන්ට, පාරිභෝගිකයින්ට සහ අනෙකුත් අදාල පාර්ශවයන්ට බොහෝ ප්‍රයෝජන අත්වේ.

පසුගිය දශකයේදී ජංගම දූරකථන අංශය ප්‍රමුඛත්වය ගත්තා වූ විදුලි සංදේශ කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයේ වේගවත් වර්ධන ක්ෂේත්‍රයක් වී තිබේ. ඇත්ත වශයෙන්ම මෑත අතීතයේදී ජංගම දූරකථන අංශයේ ඝාතීය වර්ධනයක් (Exponential growth) සිදුවී තිබේ. 44.7% ක සංයුක්ත වාර්ෂික වර්ධන වේගයක් (Compound annual growth rate) පෙන්නුම් කරමින් වසර 2000 දී 430,202 ක් පමණක් වූ ජංගම දූරකථන ග්‍රාහකයින් සංඛ්‍යාව 2010 වසර වන විට 17,267,407 තෙක් වේගවත්ව ඉහල නැග තිබේ. කෙසේ වෙතත් සක්‍රීය ග්‍රාහක අනන්‍යතා මොඩියුල් පත් (sim cards) සැලකිය යුතු ප්‍රමාණයක් තනි හා එකම පුද්ගලයකු විසින් භාවිත කරනු ලබන බව ඇස්තමේන්තු කර ඇති බැවින් මෙම සංඛ්‍යා වලින් නියම තත්වය පිළිබිඹු නොවන අතර සත්‍ය ජංගම දූරකථන භාවිතය පහළ මට්ටමක පවතී. මෙමගින් ජංගම දූරකථන භාවිතය තවදුරටත් ඉහල නැංවීමට ඉඩකඩ තිබෙන බව පෙන්නුම් කෙරේ. සංචලතාවේ වාසියට අමතරව අගය එකතු කරන ලද සේවා සැපයීමට හැකියාව ඇති ජංගම සන්නිවේදන තාක්ෂණ ගෝලීය පද්ධතිය (GSM) හඳුන්වාදීම, කාර්යයන් වැඩි ගණනක් ඉටු කර ගැනීමට හැකි වඩා ලාභදායි අතේ රැගෙන යා හැකි දූරකථන (handsets) සුලභවීම, අඩු අය ක්‍රම (ක්‍රියාකරුවන් අතර තරඟය හේතුවෙන්), ව්‍යාපාර කටයුතු ඉහළ මට්ටම් වල පැවතීම හා වැයකල හැකි ශේෂ ආදායම ඉහල යාම ආදී කරුණු ජංගම දූරකථන භාවිතය මෙතරම් ඉහළ යාමට හේතුවී තිබේ. වසර 2000 දී 767,411 වූ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහකයින් සංඛ්‍යාව 2010 වසර වන විට 3,578,463 දක්වා වැඩි වීමෙන් 16.7% ක සංයුක්ත දූරකථන භාවිතය (පුද්ගලියන් 100 දෙනෙකුට තිබෙන ජංගම හා ස්ථාවර දූරකථන සංඛ්‍යාව) 2010 වසරේදී 100.9% දක්වා වැඩිවී ඇති අතර මෙම වර්ධනයට වැඩිපුරම දායක වී තිබෙන්නේ ජංගම දූරකථන ක්ෂේත්‍රයයි. (1රූපය)

1 රූපය
ග්‍රාහක වර්ධනය 2000 - 2010




2010 වසරේදී පළාත් අනුව ස්ථාවර දුරකථන ප්‍රතිශත ව්‍යාප්තිය 2 ප්‍රස්තාරයේ දක්වා ඇත. රටේ අගනගරය පිහිටි බස්නාහිර පළාතේ 40% ක් ස්ථාවර දුරකථන තිබෙන බව එයින් දැකගත හැකිවේ. කොළඹ අගනගරයට පසුව විශාලතම නගර දෙක පිහිටා ඇති දකුණ හා මධ්‍යම පළාත් දෙක පිළිවෙලින් දෙවන හා තෙවන ස්ථාන ගෙන ඇත. 2000 වසරේදී 40,497 ක් ස්ථාවර සේවක අන්තර් ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහකයින් සංඛ්‍යාව 2010 වසරේදී 280,000 (තාවකාලික) දක්වා හත් ගුණයකින් වැඩිවී තිබේ. ස්ථාවර සේවා අන්තර් ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහකයින්ට අමතරව 2010 වසරේදී පුළුල් පරාස ජංගම දුරකථන ග්‍රාහකයින් 292,470 ක් ද විය. අන්තර් ජාලය සහ විද්‍යුත් තැපැල් ග්‍රාහකයින්ට අමතරව 2010 වසරේදී පුළුල් පරාස ජංගම දුරකථන ග්‍රාහකයින් 292,470 ක් ද විය. අන්තර් ජාලය සහ විද්‍යුත් තැපැල් භාවිතා කරන්නන් සංඛ්‍යාව සබඳතා සංඛ්‍යාවට වඩා ඉතා වැඩි බව සටහන් කළ යුතු අතර එයට හේතුව බොහෝ අවස්ථා වලදී එක් සබඳතාවක් පුද්ගලයින් කිහිප දෙනෙකු විසින්ම භාවිතා කරන අවස්ථා තිබීමයි. (උදා: කාර්යාල, අන්තර්ජාල කැෆේ). තවම අන්තර් ජාලය හා විද්‍යුත් තැපැල භාවිතය පහල මට්ටමක පවතින අතර මෙය වැඩිදියුණු කළ යුතුව තිබෙන ක්ෂේත්‍රයක් වේ. බොහෝ රටවල සේම අන්තර්ජාලය තිබෙන හා අන්තර්ජාලය නොමැති අය අතර සංඛ්‍යාත්මක බෙදීමක් (digital divide) පවතී. අන්තර්ජාල පහුසකම් තිබෙන්නා වූ වැඩි දෙනෙක් නාගරික ප්‍රදේශ වල සිටින අතර එම පහසුකම් නොමැති වැඩි දෙනෙකු වෙසෙන්නේ ග්‍රාමීය ප්‍රදේශයන්හි වේ. 2010 වසරේදී පළාත් අනුව අසම්මතික සංඛ්‍යාංක ග්‍රාහක රැහැන් (ADSL) ව්‍යාප්තිය 3 රූපයේ දැක්වේ. රටෙහි වඩාත්ම නාගරික පලාත වූ බස්නාහිර පළාතේ 71% තරම් ඉහල ADSL ප්‍රතිශතයක් තිබෙන බව පැහැදිලිව

2 රූපය
පලාත් අනුව ස්ථාවර දුරකථන ව්‍යාපෘතිය 2010



3 රූපය
පලාත් අනුව ඒ ඩී එස් එල් ව්‍යාප්තිය 2010




පෙනේ. වෙළෙඳ පොලට ක්‍රියාකරුවන් විශාල සංඛ්‍යාවක් ඇතුළු වී එය ඉතා තරඟකාරී තත්ත්වයකට පත් කර තිබේ. 2010 වසර අග වන විට ස්ථාවර රැහැන් ක්‍රියාකරුවන් හතරක්, ජංගම ක්‍රියාකරුවන් පහක්, බාහිර ක්‍රියාකරුවන් තිස් තුනක් සහ අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් අට දෙනෙකුගෙන් විදුලි සංදේශ ක්ෂේත්‍රය සමන්විත විය.

විදුලි සංදේශ වෙළෙඳ පොලෙහි අධික තරඟකාරීත්වය හේතුවෙන් වසර කිහිපයක් තිස්සේ සේවාවන්හි මිලෙහි පහළ යෑමක් සිදුවිය. ජංගම ක්‍රියාකරුවන් දෙදෙනෙකු විසින් උපහාර සහ බ්ලාස්ටර් පැකේජයන් හඳුන්වාදීමත් සමඟ ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන සේවා වල මිලෙහි ක්ෂණික පහළ යෑමක් සිදුවිය. ඉතා තරඟකාරී මෙම අයකුම පැකේජ මඟින් ක්‍රියාකරුවන්ගේ ලාභ කෙරෙහි අහිතකර බලපෑම් ඇති කර වෙළෙඳ පොල අස්ථාවර වී විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය කෙරෙහි තර්ජනයක් එල්ල විය. තරඟකාරීත්වය අපත්තිදායක තත්ත්වයට පත් කරමින් තවදුරටත් මිළ පහළ යෑම මඟින් කර්මාන්තය පිරිහී යෑම වැළැක්වීමේ අදහසින් වි.සං.නි.කො.සභාව විසින් 2009 වසර මැද භාගයේදී ජංගම කර්මාන්තය සඳහා පාදස්ථ මිල ගණන් හා අන්තර් සබඳතා මිල නියමයන් හඳුන්වා දෙන ලදී. පසුව මෙම මිල නියමයෙන් සියළුම ස්ථාවර සේවා සඳහාද ව්‍යාප්ත කරන ලදී. පාදස්ථ මිල ගණන් හා අන්තර් සබඳතා මිල නියමයන් හඳුන්වා දෙන ලදී. පසුව මෙම මිල නියමයන් සියළුම ස්ථාවර සේවා සඳහාද ව්‍යාප්ත කරන ලදී. පාදස්ථ මිල ගණන් හා අන්තර් සබඳතා මිල නියමයන් හඳුන්වා දීම සමඟ ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවට තරඟකරුවන් අතර මිල සම්බන්ධයෙන් වූ තරඟය සෑහෙන දුරට අවම කිරීමට සහ කර්මාන්තය ස්ථාවර කිරීමට හැකිවිය. ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව විසින් ADSL සහ WIMAX සේවා වල ගුණාත්මකභාවය සහ වේගවත් බව ආවේක්ෂණය සඳහා ප්‍රමිති සැසඳීමේ ක්‍රියා මාර්ගයක්ද හඳුන්වා දෙන ලදී.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය අමෙරිකානු ඩොලර් බිලියනයක් තරම් වූ කර්මාන්තයකි. විදුලි සංදේශ කර්මාන්තය ජාතික නිමවුමට ඍජු හා වක්‍ර ලෙස සැලකිය යුතු දායකත්වයක් දී තිබේ. 2010 වසරේදී රජයේ ඒකාබද්ධ අරමුදලට රුපියල් බිලියන 27 ක මුදලක් කර්මාන්තයෙන් ලබාදී ඇති අතර එය 2009 වසරේ ලබා දුන් මුදලට වඩා සැලකිය යුතු වැඩිවීමකි. 2010 වසරේදී කර්මාන්තය සඳහා විදේශීය ඍජු ආයෝජන සැලකිය යුතු ප්‍රමාණයක් ලැබුණි.

ශ්‍රී ලංකාවට තම අති නවීන විදුලි සංදේශ කර්මාන්තය පිළිබඳව ආඩම්බර විය හැකි

අතර එය ඇතැම් විට බොහෝ සංවර්ධිත ජාතීන් සමග සම මට්ටමක පවතී. G.S.M. (ජංගම සන්නිවේදනය සඳහා ගෝලීය පද්ධතිය), CDMA (සංකේත බෙදුම් බහු ප්‍රවේශය), ADSL (අසමමිතික සංඛ්‍යාත ග්‍රාහක රැහැන), GPRS (පොදු පැකැට්ටු ගුවන් විදුලි සේවා) අන්තර්ජාල ප්‍රවේශය, WIMAX (ක්ෂුද්‍ර තරංග ප්‍රවේශ සඳහා ලෝක ව්‍යාප්ත මෙහෙයුම් ශක්‍යතාව) පුළුල් පරාස සේවා, 3G (තෙවන පරම්පරාව) සහ 3.5G ජංගම සන්නිවේදන සහ HSPA (අධිවේග පැකැට්ටු ප්‍රවේශය) ජංගම පුළුල් පරාස අන්තර් ජාල සේවා හඳුන්වාදීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ පුරෝගාමියෙකු වී තිබේ.

අනාගතයේදී ග්‍රාහකයෙක් විසින් භාවිතයට ගනු ලබන මිනිත්තු සංඛ්‍යාව හා මිනිත්තුවකට ආදායම යන ප්‍රධාන පරාමිතීන් දෙකම අඛණ්ඩව වර්ධනය වී කර්මාන්තය ඉදිරියට යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන්ට ඉදිරියේදී සුභ කාලයක් උදාවනු ඇත. කර්මාන්තයේ සක්‍රිය බව සුරැකීම සඳහා වූ නියාමන ක්‍රියාමාර්ග වලින් ශක්තිමත් වූ ආර්ථික පුනර්ජීවනයේ ප්‍රතිලාභ භුක්ති විඳීමට ඔවුනට හැකිවනු ඇත. විදුලි සංදේශ කර්මාන්තයේ වර්ධනය සමග තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය අතිනත් ගෙන ඉදිරියට යයි. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය රජය ප්‍රමුඛත්වය දෙන ක්ෂේත්‍රයක් වන අතර මහින්ද චින්තනයේ වැදගත් අභිප්‍රායන්ගෙන් වලින් එකක් වනුයේ ශ්‍රී ලංකාව ආසියාතික විදුලි සංදේශ ජාලයේ කලාපීය කේන්ද්‍රය බවට පත්කිරීම වේ. මෙම අභිප්‍රාය නුදුරු අනාගතයේදී සාක්ෂාත් කර ගැනීම සඳහා විදුලි සංදේශ කොමිෂන් සභාව ඇප කැපවී සිටී.

2 පරිච්ඡේදය

# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ලං.වි.සං.නි.කො.ස.) ආරම්භය, දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ, වගකීම් සහ කාර්යයන්

## 2.1 ආරම්භය

ප්‍රධාන ප්‍රඥප්තිය වූ 1991 අංක 25 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1996 අංක 27 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත මගින් ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ කොමිෂන් සභාව රජයේ ව්‍යාවස්ථාපිත ආයතනයකි. විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කිරීම සඳහා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සියළුම දේපල, අයිතිවාසිකම් සහ බැඳීම්, 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ටෙලිකොම් නැමති සංස්ථාවට පැවරීම සඳහා සහ (192 වන අධිකාරිය වූ) විදුලි සංදේශ ආඥා පනත ඉවත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධව හෝ ඊට ආනුශංගික සියළු කරුණු සඳහා විධි විධාන සැලැස්වීම පිණිස ප්‍රධාන ප්‍රඥප්තිය 1991 දී පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ කොමිෂන් සභාව විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයේ අනුප්‍රාප්තිකයා වේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ කොමිෂන් සභාව විදුලි සංදේශ සේවා සැපයීම සිදු නොකරන නමුත් ක්‍රියාකරුවන් විසින් එම සේවා කාර්යක්ෂමව සහ නියමාකාරයෙන් සැපයීම දිරි ගන්වයි.

### 2.2 දැක්ම

විද්‍යාත්මක හා නියාමන විශිෂ්ටතාව මගින් දියුණු වෙමින් ඉදිරියට යන සංදේශන කර්මාන්තයේ ලෝක නායකයෙකු වශයෙන් පිළිගැනීමට ලක්වීම.

### 2.3 මෙහෙවර

කුලතාවෙන් පිරිපුන් සදාචාර සම්පන්න ශ්‍රම බලකායක් මගින් තරඟකාරී වෙළඳ පලෙහි සාධාරණත්වය හා යුක්තිය ප්‍රවර්ධනය කිරීමෙන් පිළිගත හැකි ගුණාත්මක බවකින් හා දැරිය හැකි මිලකින් යුක්ත සේවාවක් දීප ව්‍යාප්තව කලට වේලාවට ලබාදීමට වගබලා ගැනීම.

### 2.4 අභිමතාර්ථ

විදුලි සංදේශ පනතට අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාක්ෂාත් කරගත යුතු අභිමතාර්ථ පහත දැක්වේ.

2.4.1. ජාතික යහපත පිණිස යැයි සළකුණු ලැබිය හැකි හදිසි සේවා, පොදු දුරකථන මැදිරි සේවා, නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා සහ ග්‍රාමීය සේවා ඇතුලත් වූ සියළුම සාධාරණ ඉල්ලීම් ඉටු කළ හැකි විශ්වසදායී සහ කාර්යක්ෂම ජාතික හා අන්තර් ජාතික විදුලි සංදේශ සේවාවක් සපයනු ලබන බවට වග බලා ගැනීම.

2.4.2 බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමනාකරණ සම්පත් ඇති බවට සහ ඔහු විසින් ඒවා යොදාගනු ලබන බවට වග බලා ගැනීම.

2.4.3 අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සහ විදුලි සංදේශ උපකරණවල තත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, ගැනුම්කරුවන්ගේ සහ අනෙකුත් පාවිච්චි කරන්නන්ගේ රුචිකත්වය සහ පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

2.4.4 විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතුවල නිරත තැනැත්තන් අතර ඵලදායි තරඟකාරීත්වයක් පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම හා ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාවය සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.

2.4.5 අභ්‍යන්තර හා ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් වල සීඝ්‍ර සහ තිරසාර සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

2.4.6 අනවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන්ගෙන් හෝ අවහිරතාවලින් තොර විශ්වාසදායි සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමේ තම වගකීම් ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකියාව තිබෙන බවට නිසැක කිරීම.

2.4.7 විදුලි සංදේශ සහ ඊට සම්බන්ධිත ක්ෂේත්‍ර වලට නව තාක්ෂණික ක්‍රම සංවර්ධනය සහ භාවිතය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය

2.4.8 ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති විදුලි සංදේශ සේවා බහුල වශයෙන් භාවිතා කරන්නන් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම පිණිස දිරිගැන්වීම.

2.4.9 ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

### 2.5 ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ වගකීම්

2.5.1 පණතේ විධිවිධාන ක්‍රියාවට නැංවීම සහ බලපත්‍ර ලත් ක්‍රියාකරුවන් විසින් බලපත්‍රවල සඳහන් කොන්දේසි පිළිපදින බවට නිසැකවීම.

2.5.2 බලපත්‍රලාභී ක්‍රියාකරුවන් අතර සාධාරණ සහ තිරසාර තරඟකාරීත්වය අභිවර්ධනය කිරීම.

i) ක්‍රියාකරුවන් විසින් මහජන රුචිකත්වයන් සහ අභිමතාර්ථයන් ඉටු කරනු ලබන්නේදැයි නිශ්චය කිරීම සඳහා තරඟකාරීත්වය ආවේක්ෂණය කිරීම.
ii) ජාල හා සේවාවන් අතර සුමුදු සබඳතා පවතින බවට වගබලා ගැනීම.
iii) විවෘත ප්‍රවේශයක් ඇති, පීඩාකාරී නොවන, පාරදෘශ්‍ය බලපත්‍ර ලබාදීමේ පොදු රාමුවක් ස්ථාපනය කිරීම.

2.5.3 මිල නියම කිරීම

මිල දැරිය හැකි බව වැනි කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් විදුලි සංදේශ සේවාවන්ට සාධාරණ මිලක් නියම කරන බවට වගබලා ගැනීම.

2.5.4 පාරිභෝගික ආරක්ෂාව

පාරිභෝගික ආරක්ෂාව සැළසීම සහ පාරිභෝගිකයන් හා මහජනතාව විසින් කරනු ලබන පැමිණිලි පරීක්ෂා කිරීම මගින් මහජන සහභාගීත්වය විවෘත සංවාද දිරිමත් කිරීම.

2.5.5 සමාජ නියාමනය

i) විශ්ව ප්‍රවේශය/සේවාවන්
ii) ග්‍රාමීය ප්‍රජාවන්ට, වයස්ගතවූවන්ට සහ වෙනස් හැකියාවන් ඇත්තවුන්ට විශ්ව ප්‍රවේශය / සේවාවන් සපයන බවට වග බලා ගැනීම.
iii) හදිසි අවස්ථාවන්ට සූදානමින් සිටීම.
iv) ආබාධිත පුද්ගලයන් සඳහා විදුලි සංදේශ සේවාවන් ලබාදීමට කටයුතු කිරීම.

2.5.6 බාධක සහිත පහසුකම් සහ දුලබ සම්පත් නියාමනය

i) වර්ණාවලි කළමනාකරණය
ii) අංකනය
iii) මාර්ග පාවිච්චි කිරීමේ අයිතිය
iv) අවකාශ බණ්ඩය

2.5.7 විදුලි සංදේශ සේවා උසස් තත්වයේ සහ යුක්ති සහගත, සාධාරණ සහ මිල දැරිය හැකි සහ පාරිභෝගික අවශ්‍යතා සපුරාලනු ලබන උසස් තත්වයේ සේවාවන් වන බවට වග බලා ගැනීම.

2.5.8 යහපාලනය ප්‍රවර්ධනය කිරීම

මහජන සහභාගීත්වය දිරිමත් කරමින් සහ ස්වභාවික යුක්තියේ මූලධර්ම අනුගමනය කිරීම මගින් කාලෝචිත තීරණ ලබාදීමෙන් පාරදෘශ්‍ය තීරණ ගැනීමේ ක්‍රියාවලියක් සිදුවන බවට වග බලා ගැනීම.

2.5.9 තීරණ සාධාරණ හා අපක්ෂපාතී වන බවට වග බලා ගැනීම

2.5.10 නූතන තොරතුරු හා සන්නිවේදන යුගයේ "දැනුවත්" සමාජයක් බවට සිවිල් සමාජය ගොඩනැංවීමට සහායවීම

2.6 ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ කාර්යයන්

ඉහතින් දක්වන ලද අභිමතාර්ථයන් සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව පහත සඳහන් නියාමන කාර්යයන් ඉටුකරයි.

2.6.1 අයදුම්පත් පිළිබඳ කටයුතු කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම.

2.6.1.1 පනතේ 17 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍ර

පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව කිසිම තැනැත්තෙකු විසින් කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් ප්‍රදානය කරන ලද බලපත්‍රයක අධිකාරිය නොමැතිව ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක නොකළ යුතුය. කෙසේ වෙතත් බලපත්‍ර ලබාගැනීමේ අවශ්‍යතාවක් නොමැති අවස්ථා කිහිපයක් තිබෙන අතර මෙවැනි පනතේ 20 වැනි වගන්තියේ දක්වා තිබේ.

**2.6.1.2** පනතේ 22 වැනි වගන්තිය යටතේ ගුවන් විදුලි සංඛ්‍යාත භාවිතය සහ ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ භාවිතය සඳහා බලපත්‍ර

විදුලි සංදේශ පනතේ 22 (1) වගන්තිය අනුව කිසිම තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකා දේශීය ජල තීරයේ යම් කොටසක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද නැවක හෝ ගුවන් යානයක යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ යම් ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් භාවිතා කිරීම තත්කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ හැර කරනු නොලැබිය යුතුය.

**2.6.1.3** පනතේ 20 (2) (අ) වගන්තිය යටතේ පුද්ගලික ජාලයක් ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍ර

පනතේ 20 වන වගන්තියේ (I) උප වගන්තියේ (ඇ) ඡේදය අනුව බලපත්‍රයක් අවශ්‍ය නොවන විදුලි සංදේශ පද්ධතියක්, පද්ධතිය ක්‍රියාත්මක කරන තැනැත්තාගේ පරිශ්‍ර සීමාව ඉක්මවන අවස්ථාවක කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය වේ.

**2.6.1.4** පනතේ 21 වගන්තිය යටතේ විකුණුම් බලපත්‍ර

පනතේ (21) (1) වගන්තියට අනුව විදුලි සංදේශ කොමිෂන් සභාවෙන් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරය යටතේ හැර යම් විදුලි සංදේශ උපකරණයක් යම් තැනැත්තෙකු විසින් වෙළඳමක් වශයෙන් නිෂ්පාදය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පැවරීම, කුලියට දීම, බදු දීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම නොකළ යුතුය.

**2.6.1.5** පනතේ 22 (අ) (1) වගන්තිය යටතේ කේබල් ඇදීමේ වැඩ සඳහා බලපත්‍ර

පනතේ 22 (අ) (1) වගන්තියට අනුව කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ හැර කිසිම තැනැත්තෙකු විසින් කේබල් ඇදීමේ වැඩ නොකළ යුතුය.

**2.6.2** අයකුම නියාමනය

**2.6.2.1** පනතේ 5 (ඔ) වගන්තියට අනුව කොමිෂන් සභාවට අමාත්‍යවරයා විමසා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සම්බන්ධයෙන් ක්‍රියාකරුවන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ගාස්තු ක්‍රම හෝ ගාස්තු ක්‍රම තීරණය කිරීමට ඇති බලතල අනුව අමාත්‍යවරයා විමසා බදු ක්‍රම තීරණය කිරීම.

**2.6.2.2** මිල ගණන් පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය

**2.6.3** බලපත්‍ර ලත් ක්‍රියාකරුවන් විසින් පනතට අනුකූලව කටයුතු කරන බව (පනත යටතේ සකස් කරනු ලැබූ රීති හා නියාමයන් ඇතුළත්ව) සහ බලපත්‍ර වලට අනුකූල වන බවට වගබලා ගැනීම සහ ඊට අදාල ආවේක්ෂණ කටයුතු

**2.6.4** ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය මනා ලෙස භාවිතා කරන බවට වග බලා ගැනීම සහා එම කටයුතු ආවේක්ෂණය

**2.6.5** පාරිභෝගික පැමිණිලි වලට ප්‍රතිචාර දැක්වීම සහ පරික්ෂණ / සෝදිසි කිරීම් සිදුකිරීම.

පනතේ 9 (1) වගන්තියට අනුව ක්‍රියාකරුවෙකු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවය පිළිබඳව ග්‍රාහකයෙකු හෝ මහජනයා අතුරෙන් කෙනෙකු හෝ විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කරනු ලැබූ විට අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන විමර්ශනයක් පැවැත්විය හැකි අතර කාරණයට අදාළ අවස්ථාගත කරුණු අනුව ගතයුතු ප්‍රතිකර්ම යෙදීමට සැලැස්විය යුතුය.

පනතේ 9 (1) වගන්තිය අනුව යම් විමර්ශනයක් පැවැත්වීමේදී ඒ පැමිණිල්ලට හේතු වූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍යයැයි කොමිෂන් සභාවට පෙනීයන පියවරක් ගන්නා ලෙස කොමිෂන් සභාව විසින් ඒ ක්‍රියාකරුට විධාන කළ හැකි අතර උචිත අවස්ථාවලදී මුදල් සහන සලසන ලෙසද විධාන කළ හැකිය.

**2.6.6** විදුලි සංදේශ සේවා වල ගුණාත්මක බව හා විවිධත්වය පිළිබඳ මහජනතාවට තොරතුරු සැපයීම සහ පොදු ක්‍රියකාරකම් (public processes) හා මහජනතාවගේ අදහස් ලබාගැනීම මගින් ජනතා සහභාගීත්වය දිරිගැන්වීම.

**2.6.7** නියෝග, විධාන හා තීරණ නිකුත් කිරීම. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියෝග, විධාන හා තීරණ නිකුත් කිරීමේදී පාරදෘශ්‍ය පටිපාටියක් අනුගමනය කර තිබේ. අදහස් ඉදිරිපත් කිරීමට හා වෙනත් සංසද වලට සහභාගීවීමට කර්මාන්තයෙහි නියැලි පුද්ගලයන්ට, පාරිභෝගිකයන්ට හා උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශව වලට බොහෝ අවස්ථා සලසා දී තිබේ.

ඉහත සඳහන් කාර්යයන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විවිධ අංශ / ඒකක මගින් ඉටුකරන ලදී. 2010 වසරේ විවිධ අංශ / ඒකක වල කාර්යයන් හා ඒවායේ කාර්ය සාධනය මතු දැක්වේ. ඇතැම් ක්‍රියාකාරකමක් / ක්‍රියාකාරකම් කිසියම් අංශයක් / ඒකකයක් යටතේ සඳහන් කර ඇතත් එම ක්‍රියාකාරකම / ක්‍රියාකාරකම් අදාල අංශය / ඒකකය මගින් ඉටු කරනු ලැබ ඇත්තේ අනෙකුත් අංශ / ඒකක වල සහාය ඇතිව බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

3 පරිච්ඡේදය

# ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය

ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය ඒකක දෙකකින් එනම් ප්‍රතිපත්ති ඒකකය සහ ජාත්‍යන්තර සබඳතා ඒකකය යන ඒකක වලින් සමන්විත වන අතර ඒවායේ කාර්යයන් පහත දැක්වේ.

## 3.1 කාර්යයන්

### 3.1.1 ප්‍රතිපත්ති ඒකකය

- විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ වන කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය උපදෙස් සැපයීම.
- විශ්ව විද්‍යාල වල හා පර්යේෂණ ආයතන වල සහයෝගයෙන් අධ්‍යයන පර්යේෂණ.
- ව්‍යාපෘති

### 3.1.2 ජාත්‍යන්තර සබඳතා ඒකකය

- විවිධ ජාත්‍යන්තර සංවිධාන [උදා: ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාව (APT), කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික සංගමය (SAARC)]
- ජාත්‍යන්තර සංවිධාන වලින් ලැබෙන තොරතුරු කොමිෂන් සභාව තුල බෙදා හැරීම.
- ශ්‍රී ලංකාව සාමාජිකත්වය දරන ජාත්‍යන්තර සංවිධානවල අවශ්‍යතා අනුව, කොමිෂන් සභාව තුළින් හා රට තුළින් තොරතුරු එක් රැස්කිරීම සම්බන්ධීකරණය
- අවශ්‍ය තොරතුරු ජාත්‍යන්තර සංවිධාන වලට සැපයීම.

## 3.2 කාර්ය සාධනය

ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය 2010 වර්ෂය තුළදී පහත සඳහන් කාර්යයන් ඉටුකර ඇත.

### 3.2.1 විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංවර්ධන

1991 අංක 25 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (සංශෝධිත පරිදි) අනුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ එක් කාර්යයක් වනුයේ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල සහ පර්යේෂණ සහ සංවර්ධන, ක්‍රියාකරුවන්ගේ සහයෝගය ඇතුව හෝ අන්‍යාකාරයකින් ප්‍රවර්ධනය කිරීම වේ.

වැඩසටහනේ පරමාර්ථ වනුයේ:

- විදුලි සංදේශ අංශයේ අධ්‍යයන පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ පැවැත්වීමට විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල හා ශිෂ්‍යයන් දිරි ගැන්වීම.
- අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ වල සොයාගැනීම් භාවිතා කිරීම වේ.

2010 දෙසැම්බර් මාසයේදී විශ්ව විද්‍යාල වලින් හා පර්යේෂණ ආයතන වලින් පර්යේෂණ යෝජනා කැඳවන ලදී.

### 3.2.2. පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංවිධානයේ (CTO) අටවන වාර්ෂික සංසදය

2010 සැප්තැම්බර් මස 13 සිට 15 දක්වා පවත්වන ලද ඉහත සංසද සමුළුව සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) සහයෝගය ඇතිව සත්කාරය දැක්වීය. මෙම කාර්යය සාර්ථකව නිම කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සියළුම අංශ දායක වූහ.

සංසදයේ තේමාව වූයේ "සංඛ්‍යාංක පොදු රාජ්‍ය මණ්ඩලයක් කරා : සියළු දෙනා සඳහා පුළුල් පරාස සබඳතාව" යන්නයි. තොරතුරු සන්නිවේදන තාක්ෂණ අමාත්‍යවරුන්, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්, නියාමන නියෝජිත ආයතන ප්‍රධානීන්, අන්තර් ජාතික තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රවීණයන් සහ පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල විදුලි සංදේශ ක්ෂේත්‍රයේ අනෙකුත් නියෝජිතයින්ගෙන් සමන්විත සම්භාවනීය පිරිසක් මධ්‍යයේ සැප්තැම්බර් 13 වන දින පෙරවරුවේ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංවිධානයේ 8 වන සංසදය විවෘත කරන ලදී.



අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා 8 වන සංසදය 2010 සැප්තැම්බර් 13 වන දින විවෘත කළ වගයි.

පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංවිධානයේ 50 වන කවුන්සිලය රැස්වීම සහ වාර්ෂික සංසදය අමතමින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා "දශක තුනක පමණ කාලයක පැවති කුරිරු ත්‍රස්තවාදයෙන් මිදුණු රටක් වන ශ්‍රී ලංකාව වර්තමානයේ දකුණු ආසියාතික කලාපයේ බෙහෙවින් සබඳතා සහිත රට වලින් එකක් බව ප්‍රකාශ කළේය. දැනට මිලියන විස්සකට සුළු

වශයෙන් වැඩි වූ ජනගහනය තුල මිලියන දාහතරකට වැඩි ජංගම දුරකථන භාවිතා කරන්නන් එනම් ජනග්‍රහනයෙන් 2/3 කට වැඩි පිරිසකට ජංගම දුරකථන තිබෙන අතර සෑම දිනකම වාගේ මෙම සංඛ්‍යාව වැඩි වෙමින් පවතී.මෙය රැහැන් රහිත සහ කේබල් සබඳතා සහිත ස්ථාවර දුරකථන භාවිතා කරන මිලියන 3.5 කට ආසන්න පිරිසට අමතර වශයෙනි. විදුලි සංදේශනයේ වර්ධනය කෙතරම් වේගවත් හා පුළුල් ද යත් විදේශීය ආයෝජකයින් මෙම අංශය ඉතා ලාභදායි බව අවබෝධ කරගෙන ඇති අතර සාර්ථකත්වයේ පෙර නිමිති වර්ධනය වෙමින් පවතී. විදුලි සංදේශනයේ වර්ධනය සමග තොරතුරු තාක්ෂණයේ වර්ධනය එකක් පසුපස එකක් යන්නා වූ සිද්ධීන් වන අතර එය ද සන්තුෂ්ටියට හේතුවක් වේ. 2005 සිට අද දක්වා වූ වසර පහක කෙටි කාලය තුළ ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාව 5% අඩු මට්ටමක සිට ආසන්න වශයෙන් 30% දක්වා වර්ධනය වී තිබේ. ප්‍රක්ෂේපණ වලට අනුව අනාගත වර්ධනය මීටත් වඩා වේගවත් වනු ඇත. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ නව ප්‍රවනතා වල ප්‍රධාන අංගයන් වනුයේ ඉංග්‍රීසි භාෂාව ඉගෙනුම හා තොරතුරු තාක්ෂණය ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙනු ලබන ප්‍රතිපත්තීන් වේ. වසර 2020 වන විට ත්‍රිභාෂා ජාතියක් වීමේ අවශ්‍යතාවද අපට තිබේ. මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණයේ දියුණුව සහ පරිගණක තාක්ෂණයේ ඉහල මට්ටම් දායක වනු ඇත. තම ප්‍රජාවන්ගෙන් වැඩි ප්‍රතිශතයකට පුළුල් පරාසය ඵලදායි ලෙස යුහුසුළුව ලබාදීමට සහ ඊට ප්‍රවේශ වීමට ඇති ඉඩ කඩ වැඩි කිරීමට වගබලා ගැනීම සඳහා ඉක්මන් පියවර ගනු ලැබුව හොත් පොදු රාජ්‍ය මණ්ඩලීය ජාතීන්ට විශේෂයෙන්ම දියුණු වෙමින් පවතින රටවලට තම ආර්ථිකයන් වේගවත්ව වර්ධනය කළ හැකි බව සංසදයේ දී කථා කළ කථිකයින්ගේ පොදු අදහස විය. සංවර්ධනය වෙමින් පවතින රට වල අන්තර්ජාලය, පුළුල් පරාසය සහ අනෙකුත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වල පූර්ණ විභවය පිළිබඳ මනා අවබෝධය ඉහල නැංවීම සඳහා ගතයුතු නිශ්චිත ක්‍රියාමාර්ග පිළිබඳව සමුළුව ගවේෂනයක යෙදුණි. වඩාත් උචිත ප්‍රායෝගික ප්‍රතිපත්ති, නියාමන, ආයෝජන විකල්ප හඳුනාගැනීම සහ හැකි ඉතාමත් කෙටි කාලයක් තුළ අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල පාරිභෝගිකයින් සම්බන්ධ කිරීම පිණිස යෙදිය හැකි උපාය මාර්ග, පාරිභෝගිකයින් විසින් වැඩි වශයෙන් පුළුල් පරාසය භාවිතා කිරීමෙන් අත්වන වාසි ප්‍රමිතිකරණ අවශ්‍යතා සහ ආසියා ශාන්තිකර කලාපය තුළ ප්‍රමිතිකරණ පරතරය මැනීම සහ එය විසඳීමේදී ඇතිවන ගැටළු සහ පාරිභෝගිකයින්ට පුළුල් පරාසය දැරිය හැකි මිලකට ලබාදීම සඳහා දිරි ගැන්වීමේ නියාමන ආදී කරුණු සමුළුවේදී සාකච්ඡා විය. දායක අරමුදල් ඵලදායි ලෙස භාවිත කිරීම සහ පුළුල් පරාස යටිතල ව්‍යුහ සහ සේවාවන් සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ අරමුදලක් ඇති කිරීම සඳහා සංවිධානයේ මූල පිරිමද ඇතුළත්ව වෙනත් අරමුදල් සැපයීමේ යාන්ත්‍රණ ආදී කරුණු සමුළුවේදී සාකච්ඡාවට භාජනය විය. රටවල් වල පුළුල් ආර්ථික වර්ධනය, ජාතීන් අතර කලාපීය සමෝදානය, තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ නියැලි සමාගම් වලට ලැබෙන ලාභය සහ සමස්ථ ගෝලීය සමෘද්ධිය කෙරෙහි පුළුල් පරාස ජාල සංවර්ධනය දායක වන ආකාරය පිළිබඳවද මෙහිදී පරීක්ෂා කෙරිණ.

පුළුල් පරාසය ලබාගැනීමට ඇති හැකියාව, මිල දැරිය හැකි බව සහ එයට ප්‍රවේශවීමේ හැකියාව වැනි කරුණු වලට අදාලව නිර්මාණශීලී විසඳුම් සෙවීමට සහයෝගීව හවුල් වී කටයුතු කිරීමේ අවශ්‍යතා අවධාරණය කරමින් සංවිධානයේ (CTO) ප්‍රධාන විධායක නිළධාරී ආචාර්ය එක්වෝච් ස්පියෝ ගාබ්‍රා මහතා "උතුරු දකුණු බෙදීම සහ නාගරික - ග්‍රාමීය ආර්ථික අසමතා අඩු කිරීම පිණිස තොරතුරු වලට සහ සබඳතාවට (connectivity) ප්‍රවේශවීම ඉතාමත් වැදගත් වන යුගයක, සාක්ෂරතාව, අධ්‍යාපනය, දැනුම, වෙළෙඳ සහ ව්‍යාපරික අවස්ථා සහ ස්වයං බලසම්පන්න වීම වැඩි දියුණු කිරීම පිණිස සෑම පුද්ගලයෙකුටම මූලික පුළුල්

පරාස සබඳතාවට ප්‍රවේශය ඇති බවට වගබලා ගැනීමට ලෝක ප්‍රජාව සමායෝජනයෙන් කටයුතු කළ යුතු බව ප්‍රකාශ කළේය. බොහෝ වරප්‍රසාද නොලත් පුද්ගලයන් සහ ප්‍රජාවන් විශ්ව ගම්මානයේ වැදගත් හා අත්‍යවශ්‍ය පුරවැසියන් බවට පත් කිරීම සඳහා පුළුල් පරාස සබඳතාව ඉතාමත් නිසැක මෙවලම් නොමැති, විශේෂයෙන්ම සේවා ඌන කලාපවල පුද්ගලයන්ට, බාහිර ලෝකය සමග සන්නිවේදනය කිරීම පිණිස මෙම සබඳතාව සැපයීමට වගබලා ගැනීමට එක්ව කටයුතු කිරීම අපගේ යුතුකම වේ." "කලාපීය සහ මහාද්වීපික පුළුල් පරාස සබඳතාව ව්‍යාප්ත කිරීම සඳහා වූ උපාය මාර්ග, සැලසුම් සහ වැඩසටහන් වලට අදාළ වූ ගැටළු මෙන්ම විශේෂයෙන්ම භෞමික පුළුල් පරාස ආයෝජන සඳහා ඇති අරමුදල් ඌනතා පිළිබඳව සාකච්ඡා කිරීමට මෙම සංසදය අනගි අවස්ථාවක් සපයන බව" ආචාර්ය ස්පියෝ ගාබ්‍රා මහතා වැඩි දුරටත් සඳහන් කළේය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් අනූෂ පැල්පිට මහතා නියෝජිතයින් පිළිගනිමින් "ශ්‍රී ලංකාව විදුලි සංදේශනයේ ඉතාමත් නවීන තාක්ෂණයන් භාවිතයට කැපවී සිටින රටක් බවත් මෙම ඓතිහාසික අවස්ථාවට සත්කාරය දැක්වීමට ලැබීම රටට ගෞරවයක් බවත්" සඳහන් කළේය. ඔහු තව දුරටත් "සංසදයේ සාකච්ඡා වන කරුණු සහ මින් පසුව පැවැත් වෙන කවුන්සලයේ පනස් වැනි රැස්වීමේදී සාකච්ඡාවන කරුණු ඵලදායි ප්‍රතිඵල ගෙන දෙනු ඇති බවත්, දකුණු ආසියාතික කලාපයේ වේගවත් පුළුල් පරාස ව්‍යාප්තිය සඳහා උදව් වන බවත් සඳහන් කළේය. සන්නිවේදන පහසුකම් විශේෂයෙන් පුළුල් පරාසය හරහා සිදුවන ව්‍යාප්තිය ශ්‍රී ලංකාවේ වේගයෙන් වර්ධනය වෙමින් පවතින අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මෙම පහසුකම් සහ එමගින් පරිභෝගිකයින්ට ලැබෙන ප්‍රතිලාභ විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල වාසය කරන පුද්ගලයින්ට ව්‍යාප්ත කිරීමට කැපවී සිටී. පුළුල් පරාසය යොදා ගැනීම හා භාවිතා කිරීම සම්බන්ධයෙන් රටේ ජාතික අභිමතාර්ථ වලට විශේෂයෙන් අදාල විය හැකි ජාත්‍යන්තර අත්දැකීම් සහ වෙනත් රට වල පුළුල් පරාස ක්‍රමෝපායන් පිළිබඳ අවබෝධය තුළින් මෙම සමුළුවෙන් ශ්‍රී ලංකාවට ඉමහත් ප්‍රතිලාභ ලැබෙනු ඇත. ශ්‍රී ලංකාවේ පුළුල් පරාස ක්‍රමෝපායන් සමාලෝචනය කිරීමේ හැකියාව එමගින් ශක්තිමත් වනු ඇත."

**3.2.3 පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංවිධානයේ 50 වෙනි කවුන්සල රැස්වීම.**

පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංවිධානයේ 8 වන වාර්ෂික සංසදයේ සම්මේලනයෙන් අනතුරුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සත්කාරයෙන් පො.ම.වි.සං. සංවිධානයේ 50 වන කවුන්සිල රැස්වීම සැප්තැම්බර් 16-17 කලාය තුල පැවැත්වින.

පැසිපික් කේබල් මණ්ඩලය වශයෙන් 1901 දී ඓතිහාසිකව ආරම්භ වූ පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංවිධානය සියළුම පොදු රාජ්‍ය මණ්ඩල රට වලින් (පූර්ණ පො.ම.වි.සං.සංවිධානයේ අරමුණු වලට අනුකූල වූ කාර්යයන් හා ක්‍රියාකාරකම් සහිත ඒකක වලින් (අංශ සාමාජිකත්වය) සාමාජිකයින් බඳවා ගන්නා වූ විශිෂ්ට ගනයේ ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයකි. පො.ම.වි.සං. සංවිධානය විදුලි සංදේශනය, තොරතුරු තාක්ෂණය හා ගුවන් විදුලි ප්‍රචාරය මෙන්ම අන්තර්ජාලය පිළිබඳව විශේෂිත ක්ෂේත්‍රයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම සම්බන්ධයෙන් දැනුම බෙදා හදා ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

ලන්ඩන්හි තම මූලස්ථානය පිහිටියා වූද යුරෝපය, කැරිබියන්, අමෙරිකා, අප්‍රිකා සහ ආසියා ශාන්තිකර කලාපය තුළ ග්‍රාහක රටවල් පිහිටියා වූද, පො.ම.වි.සං. සංවිධානය අඛණ්ඩ හා පෘථුල ලෙස ජාත්‍යන්තර සන්නිවේදන

සංවර්ධනය සඳහා අරමුදල් සැපයීම, සහයෝගීතා දැක්වීමේ හා සහායක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කේන්ද්‍රස්ථානය වී තිබේ. වඩා කාර්යක්ෂම ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම මගින් ගෝලීය දරිද්‍රතාව අඩු කිරීම පො.ම.වි.සං.සංවිධානයේ මෙහෙවර වන අතර එහි සවංර්ධන න්‍යාය පත්‍රයෙහි එක්සත් ජාතීන්ගේ සහස්‍ර සංවර්ධන අරමුණු (MDGS) පිළිබිඹු වේ.

2010 සැප්තැම්බර් 16 සිට 17 දක්වා කොළඹ දී පැවති 50 වන කවුන්සිල රැස්වීමේදී පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංවිධානයේ සභාපති ලෙස ජනාධිපති ලේකම් හා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති ලලිත් වීරතුංග මහතා ඒකමතිකව තෝරා පත් කර ගන්නා ලදී.



3.2.4 බල රහිත/ආන්තික ප්‍රජාවන් සඳහා තොරතුරු තාක්ෂණය (ITU / TRCSL සහාය ව්‍යාපෘතිය)

විශේෂිත අවශ්‍යතා සහිත කායික/මානසික හැකියාවන්ගෙන් හීන හා ආබාධිත පුද්ගලයන්ගේ ප්‍රයෝජනය සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අන්තර්ජාතික විදුලි සංදේශ සංගමය හා එක්ව සාමූහික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධන වැඩසටහනක් (ව්‍යාපෘතියේ දෙවන පියවර) ක්‍රියාත්මක කළේය. මෙම වැඩසටහන යටතේ 2010 වසර තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් නිම කරන ලදී.

i. කායික/මානසික හැකියාවන්ගෙන් ඌන හා ආබාධිත පුද්ගලයන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය තේමා කරගනිමින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ හා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සාමූහික ව්‍යාපෘති වැඩසටහන යටතේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා රුපියල් මිලියන 8.5 ක් වටිනා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික උපකරණ පාසැල්, වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන, රණවිරු ගම්මාන හා විශ්ව විද්‍යාල වලට භාරදීමේ උත්සවයක් 2010 ජනවාරි මස පවත්වන ලදී. විශ්ව විද්‍යාල 02 ක්, පාසැල් 33 ක්, වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන 17 ක් හා රණවිරු ගම්මාන 17 ක් ඇතුලත් වූ මධ්‍යස්ථාන 69 කට පරිගණක මේස සහ පුටු, මල්ටිමීඩියා ප්‍රක්ෂේපණ යන්ත්‍ර, බ්‍රේල් උපකරණ සහ ඡායා පිටපත් යන්ත්‍ර සපයනු ලැබිණ.

ii. මෙම ව්‍යාපෘතිය යටතේ අවුරුදු දෙකක කාලයකට අයකිරීමකින් තොරව ශ්‍රී ලංකා ටෙලිකොම් (පී.එල්.සී.) ආයතනය විසින් මධ්‍යස්ථාන නමයකට ඒ.ඩී.එස්.එල් (ADSL) සබඳතාද මොබිලේ (පුද්ගලික) සමාගම විසින් තවත් මධ්‍යස්ථාන දහයකට එච්.එස්.පී.ඒ. (HSPA) අන්තර්ජාල පහසුකම්ද සපයන ලදී.

iii. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් අනුෂ පැල්පිට මහතා හා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සාමාජික ජනාධිපති නීතිඥඑස්.එස්. සහබන්දු මහතාගේ ප්‍රධානත්වයෙන් එෆ් එම් ශ්‍රව්‍ය පද්ධතියක් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපකරණ

පහසුකම් සහිත නව පරිගණක හා කථනය පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් මොණරාගල දිස්ත්‍රික්කයේ කුඹුක්කන වෙල්ලස්ස සුභාගයා පාසලේදී විවෘත කරන ලදී.






iv. ශ්‍රී.ලං.වි.ස.නි.කො. සභාව විසින් රණවිරු සේවා අධිකාරිය සමග රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට පැරඩයිස් වත්ත රණවිරු ගම්මානයේදී තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපකරණ පහසුකම් සහිත නව පරිගණක මධ්‍යස්ථානයක් 2010 පෙබරවාරි 18 දින ආරම්භ කරන ලදී.

**3.2.5 මතු පරම්පරා ජාල (NGN) සහ සංක්‍රමණ ක්‍රමෝපායන් පිළිබඳ වැඩමුළුව**

ශ්‍රී ලංකාවේ මතු පරම්පරා ජාල හා සංක්‍රමණ ක්‍රමෝපායන් පිළිබඳ වැඩමුළුව විදුලි සංදේශ කොමිෂන් සභාවේ සම්මන්ත්‍රණ ශාලාවේදී 2010 ඔක්තෝබර් 28-29 දිනවල පැවැත්විණ. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සම්බන්ධව සංවිධානය කල අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් එයට සත්කාරය දක්වන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් අනූෂ පැල්පිට මහතා විසින් පිලිගැනීමේ කථාව පවත්වන ලදී. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ජ්‍යෙෂ්ඨ උපදේශක සමීර් ෂර්මා මහතා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ උපදේශක ඔස්කාර ජී. සෝතෝ මහතා සහ ජාත්‍යන්තර සංවිධාන සහ ක්‍රියාකරුවන් කිහිපයක් නියෝජනය කළ වෙනත් කථිකයන් කිහිප දෙනෙක් මෙම අවස්ථාවේදී කථා පැවැත්වූහ.

මතු පරම්පරා ජාලයේ සංවර්ධන ප්‍රවනතා, මතු පරම්පරා ජල නිර්මාණ ශිල්පය සහ ප්‍රමිතිකරණය, ම.ප.ජා. සංක්‍රමණ ක්‍රමෝපායන්, ම.ප.ජා. නියාමන ගැටළු, NGN ආරක්ෂක ගැටළු NGN ගුණාත්මකභාවය, සිද්ධි අධ්‍යයන හා NGN පොදු ගැටළු මෙම වැදගත් රැස්වීමේදී සාකච්ඡාවට ගන්නා ලදී.

**3.2.6 ජාල හා ක්‍රමෝපායන් පිළිබඳ දකුණු ආසියාතික විදුලි සංදේශ නියාමයන්ගේ කවුන්සලයේ (SATRC) වැඩ කණ්ඩායම**

කලාපය තුල ජාල හා සේවා ශක්තිමත් කිරීමට අදාල ක්‍රමෝපායන් සැලසුම් කිරීම පිණිස දකුණු ආසියාතික රටවල් අටක හා ඉරානයේ විදුලි සංදේශ නියාමන ආයතන නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ නිළධාරීහු 2010 ජුලි 15 හා 16 දිනවල කොළඹදී රැස්වූහ. 2009 නොවැම්බර් 24 සිට 26 දක්වා කොළඹ පැවති දකුණු ආසියාතික විදුලි සංදේශ නියාමකයින්ගේ කවුන්සිලයේ (SATRC) 11 වන රැස්වීමේදී

ගනු ලැබූ තීරණයකට අනුව ස්ථාපනය කරන ලද "ජාල හා සේවා පිළිබඳ වැඩ කණ්ඩායමට" මෙම නිලධාරීන් අයත්වූහ. 2010 - 2011 කාල පරිච්ඡේදය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ තුන් වන අදියර ක්‍රියාත්මක වීම මෙම ව්‍යායාමයෙන් නිරූපනය විය. රැස්වීමේ මූලික පරමාර්ථ වූයේ වැඩ කණ්ඩයාමේ වැඩ සටහනට ඇතුලත් විය යුතු කාර්යභාරය කොන්දේසි සකස් කිරීම හා ස්ථාපනය කිරීම විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් මෙම වැඩ කණ්ඩායමේ රැස්වීම් වල සභාපතීත්වය උසුලනු ලැබීය. මෙම කණ්ඩායම ඊළඟ දකුණු ආසියාතික විදුලි සංදේශ නියාමකයින්ගේ කවුන්සිල රැස්වීමේදී සාකච්ඡා කිරීම/සම්මත කර ගැනීම සඳහා පනත දක්වා ඇති විෂයයන් පිළිබඳ අධ්‍යයනයක යෙදී ඒවාට අදාල නිර්දේශ/වාර්තා/මාර්ගෝපදේශ ඉදිරිපත් කළේය.

- දකුණු ආසියාතික පාරිභෝගිකයන්ට ගුණාත්මක ජංගම අත් යන්ත්‍ර (mobile hand sets) ලැබෙන බවට වගබලා ගැනීම.
- මතු පරම්පරා ජාලය හා මතු පරම්පරා ජාල ප්‍රවේශය : දකුණු ආසියාතික විදුලි සංදේශ නියාමකයින්ගේ කවුන්සලයට අයත් රටවල් තුල අන්තර් සබඳතා අයකුම.
- සිල්ලර අයකුම : අන්තර් ජාල මූල සේවය පාදක සේවාවන් සඳහා සේවයේ ගුණාත්මක බව සමඟ සංවේදී වූ මිල නියම කිරීම.
- රෝමිං සහ අන්තර්ජාතික අයකුම.

නේපාලය, ඉන්දියාව, භූතානය හා ශ්‍රී ලංකාවේ නිලධාරීහු ඉහත මාතෘකා ආවරණය කරමින් දේශන පැවැත්වූහ.

### 3.2.7 ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය (WTISD)

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය සැමරීම සඳහා 2010 මැයි 17 දින වැඩසටහනක් සංවිධාන කළේය.

මැයි 17 දිනය පළමු ජාත්‍යන්තර ටෙලිග්‍රාෆ් සම්මුතිය අත්සන් කිරීමේ සංවත්සරය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) පිහිටුවීම සනිටුහන් කරයි. 1865 දී ITU පිහිටුවීම හා පළමු ජාත්‍යන්තර ටෙලිග්‍රාෆ් සම්මුතිය අත්සන් කිරීම සනිටුහන් කරමින් 1969 සිට ලෝක විදුලි සංදේශ දිනය මැයි 17 දින සමරා තිබේ. තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ වැදගත්කම හා තම සමුළුව විසින් පෙන්වා දී ඇති තොරතුරු සමාජයට (information society) අදාල වූ පුළුල් පරාසයක දිවෙන ගැටළු පිළිබඳව අවධානය යොමු කිරීම පිණිස මැයි 17 දින ලෝක තොරතුරු සමාජ දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලෙස තොරතුරු සමාජය පිළිබඳ ලෝක සමුළුව (WSIS) එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයෙන් 2005 නොවැම්බර් මාසයේ දී ඉල්ලීමක් කළේය. සෑම වර්ෂයකම මැයි 17 දින ලෝක තොරතුරු සමාජ දිනය සැමරිය යුතු බවට 2006 මාර්තු මස එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය යෝජනාවක් සම්මත කළේය. අවස්ථා දෙකම මැයි 17 දින සැමරීමට 2006 නොවැම්බර් මස තුර්කියේ ඇන්ටාලියා හිදී පැවැත්වූ ITU හි පූර්ණ බලධාරී සමුළුවේදී තීරණය විය. යෝග්‍ය වැඩසටහන් සංවිධානය කිරීම මගින් වාර්ෂිකව මෙදින සමරන ලෙස සාමාජික රටවල් හා ආංශික සාමාජිකයන් වෙත මෙම නව තීරණයෙන් ඉල්ලීමක් කෙරිණ.

2010 වසරේ විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ තේමාව වූයේ "වඩා හොඳ නගර, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් වඩා හොඳ ජීවිතයක්" යන

තේමාවයි. ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව විසින් 2010 ලෝක විදුලි සංදේශ දිනය සැමරීම සඳහා සංවිධානය කරන ලද වැඩසටහනේ පරමාර්ථය වූයේ සමාජයට හා ආර්ථිකයට මෙන්ම සංඛ්‍යාංක බෙදීම (digital divide) අඩුකිරීමට අන්තර්ජාලය සහ අනෙකුත් තොරතුරු තාක්ෂණයන්ට කළහැකි දෑ පිළිබඳව දැනුවත්භාවය ඉහල නැංවීම වේ.

### 3.2.8 ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාවගේ (APT) වාර්ෂික පුස්තකය

ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාවගේ වාර්ෂික පුස්තකයේ ආසියා ශාන්තිකර කලාපයේ විදුලි සංදේශ වර්ධනය පිළිබඳව කරුණු ඇතුලත් වේ. රටවල හා දේශයන්හි විදුලි සංදේශ ප්‍රජාවගේ විදුලි සංදේශණයේ හා තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ වත්මන් තත්වය එහි ඇතුලත් වේ. ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය 2009 වසර සඳහා ශ්‍රී ලංකාව පිළිබඳ පරිච්ඡේදය සම්පාදනය කලේය.

### 3.2.9 විදුලි සංදේශ නියාමන සමීක්ෂණය

කර්මාන්තයෙන් අවශ්‍ය තොරතුරු ලබාගෙන ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) විදුලි සංදේශ නියාමන සමීක්ෂණය නිම කරන ලදී.

### 3.2.10 විදේශ නියෝජිතයන් පැමිණීම සම්බන්ධීකරණය

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රමිතිකරණ කාර්යාංශයේ අධ්‍යක්ෂ මැල්කම් ජොන්ස්ටන් මහතා, පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංවිධානයේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂ එක්වෝව් ස්පියෝ ගාබ්‍රා මහතා, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ජ්‍යෙෂ්ඨ උපදේශක සමීර් ෂර්මා මහතා සහ එම සංගමයේ උපදේශක ඔස්කාර් ජී සෝතෝ මහත සහ අනෙකුත් අය විදුලි සංදේශ කොමිෂම වෙත පැමිණි අතර ඔවුන්ගේ පැමිණීම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනෙකුත් අංශ වල සහාය ඇතිව ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සබඳතා අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

4 පරිච්ඡේදය

# ආර්ථික කටයුතු අංශය

ආර්ථික කටයුතු අංශය තරඟකාරීත්වය පිළිබඳ උප අංශය හා අනුගත වීම් පිළිබඳ උප අංශය යන උප අංශ දෙකෙන් සමන්විත වන අතර මෙම උප අංශ දෙකෙහි කාර්යයන් හා ඒවා මගින් 2010 වසරේ ඉටු කරනු ලැබූ ක්‍රියාකාරකම් පහත දැක්වේ.

## 4.1 තරඟකාරිත්වය පිළිබඳ උප අංශයේ කාර්යයන්

- පිරිවැය පදනම් වූ අයකුම නියාමනය සඳහා පිරිවැය අධ්‍යයන ඇතුළත් අයකුම විශ්ලේෂණය කිරීම සහ අනුමැතිය සඳහා වූ නව අයකුම යෝජනා පරීක්ෂා කිරීම.
- බලපත්‍ර ලාභී ක්‍රියාකරුවන්ගේ මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය විශ්ලේෂණය කිරීම මගින් ප්‍රවණතා අධීක්ෂණය කිරීම.
- අංශය පිළිබඳ ආර්ථික විශ්ලේෂණය.
- අන්තර් සබඳතා වල හා ක්‍රියාකරුවන් අතර අන්තර් සබඳතා වැඩපිළිවෙලවල් වල වෙළඳ කොන්දේසි විශ්ලේෂණය.
- බලපත්‍ර හා සෙස් බදු නියම වේලාවට ලැබෙන බවට වගබලා ගැනීම.
- ගම්බද ප්‍රදේශවල තොරතුරු සන්නිවේදන තාක්ෂණය ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපත්ති සහ වැඩසටහන් කොමිසම වෙත නිර්දේශ කිරීම.

- ග්‍රාමීය වැඩසටහන් කඩිනම් කිරීම පිණිස ආර්ථික දිරිගැන්වීම් සඳහා යෝජනා සකස් කිරීම.
- සංඛ්‍යා විද්‍යාත්මක තොරතුරු එක් රැස් කිරීම හා විශ්ලේෂණය.
- ආංශික විශ්ලේෂණය මගින් ආංශික කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.
- කර්මාන්තයෙන් රජයට ලැබිය යුතු බදු එකතු කිරීම අධීක්ෂණය.

## 4.2 කාර්ය සාධනය

### 4.2.1 අයක්‍රම විශ්ලේෂණය

අයක්‍රම විශ්ලේෂණය කිරීමේදී තරඟකාරී අයක්‍රම පැකේජ ක්‍රියාකරුවන්ගේ ලාබ කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරමින් වෙළෙඳපොල නොසන්සුන් වී ඇති බව සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය කෙරෙහි තර්ජනයක් එල්ල වී ඇති බව පෙනී ගියේය.

2005 - 2010 කාලය තුල ජාලයෙන් බාහිර ජංගම දුරකථන ගාස්තුවල සාමාන්‍යයෙහි සහ ජාලය තුළ ජංගම දුරකථන ගාස්තුවල සාමාන්‍යයෙහි ප්‍රවනතා 4 හා 5 රූපවල දැක්වේ.

4 රූපය
ජාලයෙන් බාහිර ජංගම දුරකථන ගාස්තුවල සාමාන්‍යයේ ප්‍රවනතාව




5 රූපය
ජාලය තුළ ජංගම දුරකථන ගාස්තුවල සාමාන්‍යයේ ප්‍රවනතාව




තරඟකාරීත්වය අපත්තිදායක තත්ත්වයට පත්වන්නා වූ මිලෙහි වැඩිදුර පහළ යෑම් මගින් කර්මාන්තයේ පිරිහී යාම වැලැක්වීමේ අදහසින් ශ්‍රී.ලං.වි.සං.කො. සභාව විසින් 2009 මැද භාගයේදී ජංගම දුරකථන සඳහා පාදස්ථ මිල ගණන් හා අන්තර් සබඳතා මිල ගණන් හඳුන්වා දෙන ලදී. අන්තර් සබඳතා මිල ගණන් හඳුන්වා දීම නිසා විදුලි සංදේශ සමාගම් වලට වෙනත් ක්‍රියාකරුවන් විසින් තම ජාල/යටිතල ව්‍යුහ භාවිතය නිසා දැරීමට සිදුවන පිරිවැය පියවා ගැනීමට හැකිවිය.

ශබ්ද ඇමතුම් හා පාඨගත ඇමතුම් සඳහා ද ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව පාදස්ථ මිල ගණන් පැනවූවේය. මෙම පාදස්ථ මිල නියම කරනු ලැබුවේ විදුලි සංදේශ ක්‍රියාකරුවන් අතර විනාශකාරී අයක්‍රම සටන් වැළැක්වීම පිණිස සහ ආයෝජනය කර ඇති ප්‍රාග්ධනය සඳහා ඔවුනට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් උපයා ගැනීමට සහ එමගින් නව තාක්ෂණය සඳහා ආයෝජන කිරීමට නිදහස් මුදල් ප්‍රවාහයක් සැලසීම සඳහා වේ.

2009 දී මුලින්ම පාදස්ථ මිල ගණන් හඳුන්වා දෙනු ලැබුවේ ජංගම කර්මාන්තය සඳහා විය. 2010 මාර්තු මාසයේදී එය ස්ථාවර රැහැන්,

ස්ථාවර රැහැන් රහිත / CDMA සේවාවන්ට ව්‍යාප්ත කරන ලදී. 2010 මැද භාගයේදී පාදස්ථ මිල ගණන් සංශෝධනය කරන ලදී. තවද මෙම සංශෝධනය සමග කෙටි පණිවුඩ සේවාව සඳහා පාදස්ථ මිල ගණන් හඳුන්වාදීම සිදුවිය.

පාදස්ථ මිල ගණන් වලට අඩු කිසිම අයකුම යෝජනාවක් ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව අනුමත කළේ නැත. පිරිවැය අධ්‍යයනයකින් පසු 2009 වසරේ දී කොමිෂන් සභාව අන්තර් සබඳතා සේවා සඳහා රු. 0.15 ක් ද නියම කරන ලදී. මෙම මිල ගණන් 2010 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක විය.

2010 වසරේදී ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව අයකුම සැලසුම් 108 ක් අනුමත කළේය. 2009 වසරේදී ජාලයෙන් පිටිසෙන ජංගම ඇමතුමකට සාමාන්‍ය අයකිරීම මිනිත්තුවකට රු. 2.40 ක් අතර 2010 දී එය මිනිත්තුවකට රු. 1.50 දක්වා පහත වැටිණ. 2009 දී බාහිර ජාලයකින් පිටිසෙන ඇමතුමක් සඳහා අයකිරීම මිනිත්තුවකට රු. 4.30 ක් වූ අතර 2010 දී එම අයකිරීම රු. 2.52 දක්වා අඩුකරනු ලැබිණ.

පාදස්ථ මිල ගණන් හා අන්තර්ජාතික සබඳතා මිල ගණන් හඳුන්වා දීම සමග ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවට තරඟකරුවන් අතර මිල යුද්ධය සැහෙන දුරට අවම කිරීමට සහ කර්මාන්තය ස්ථාවර කිරීමට හැකිවිය.

**4.2.2 බලපත්‍ර ලාභී ක්‍රියාකරුවන්ගේ මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය විශ්ලේෂණය කිරීම මගින් ප්‍රවනතා අධීක්ෂණය කිරීම.**

**4.2.2.1 මෙහෙයුම් කාර්ය සාධනය**

2010 වසරේදී මුළු ග්‍රාහකයින් සංඛ්‍යාව (ස්ථාවර හා ජංගම යන දෙපාර්ශවයම) මිලියන 20.8 ක් වූ අතර එය 2009 වසරට සාපේක්ෂව 17.5% ක වැඩිවීමකි. 2009 හා 2010 දී ස්ථාවර දුරකථන ග්‍රාහකයින් සංඛ්‍යාව පිළිවෙලින් 3,435,958 හා 3,578,463 ක් විය. එමගින් 4.1% ක සුළු වැඩිවීමක් පෙන්නුම් කෙරේ. එයට සාපේක්ෂව 2009 දී 14,264,442 හා 2010 දී 17,267,407 වශයෙන් ජංගම ග්‍රාහකයන් සංඛ්‍යාව එම කාල පරිච්ඡේදය තුල 21.1% ක වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

**4.2.2.2 මූල්‍ය කාර්ය සාධනය**

**ආයෝජනය**

ක්‍රියාකරුවන් විසින් සපයන ලද තොරතුරු අනුව 2010 වසර තුල ආයෝජනයේ අඩු වීමක් සිදුවී තිබේ. 2009 දී මුළු ආයෝජනය රුපියල් බිලියන 44.9 වූ අතර 2010 දී එය රුපියල් බිලියන 24.3 දක්වා අඩු විය. 1 වගුවෙන් පිළිවෙලින් 2009 හා 2010 වසර වල ස්ථාවර හා ජංගම ක්‍රියාකරුවන් විසින් කරන ලද ආයෝජන දැක්වේ. 2009 දී මුළු ආයෝජනයෙන් හතරෙන් තුනක් ජංගම ක්ෂේත්‍රය සඳහා වූ අතර 2010 දී එය 60% දක්වා අඩු වී තිබේ.

වගුව 1

දුරකථන ක්‍රියාකරුවන් විසින් කර ඇති ආයෝජනය 2009-2010

| වර්ෂය | ආයෝජනය (රු. මිලියන) | | මුළු ගණන (රු. මිලියන) |
|---|---|---|---|
| | ස්ථාවර ක්‍රියාකරුවන් | ජංගම ක්‍රියාකරුවන් | |
| 2009 | 11,207 | 33,678 | 44,885 |
| 2010 | 9,807 | 14,469 | 24,276 |

**ආදායම**

2009 හා 2010 වසරවල ස්ථාවර ක්‍රියාකරුවන්ගේ ආදායම 2 වගුවේ දැක්වේ.

වගුව 2

ස්ථාවර හා ජංගම ක්‍රියාකරුවන්ගේ ආදායම 2009-2010

| වර්ෂය | ආදායම (රු. මිලියන) | | මුළු ගණන (රු. මිලියන) |
|---|---|---|---|
| | ස්ථාවර ක්‍රියාකරුවන් | ජංගම ක්‍රියාකරුවන් | |
| 2009 | 47,898 | 58,043 | 105,941 |
| 2010 | 45,299 | 72,158 | 117,457 |

ස්ථාවර දුරකථන කර්මාන්තයේ ආදායම 2009 සිට 2010 දක්වා 5.4% කින් අඩු වී තිබෙන අතර ජංගම දුරකථන ක්ෂේත්‍රයේ එම කාල පරිච්ඡේදය තුල එය 24.3% කින් වැඩිවී තිබේ. මෙම කාල පරිච්ඡේදය තුළ අංශ දෙකෙහි සමස්ථ ආදායම 10.9% කින් වැඩි වී තිබේ. 2009 දී ස්ථාවර දුරකථන කර්මාන්තයෙ හා ජංගම දුරකථන කර්මාන්තයෙහි මුළු ආදායමට දායකවීම පිළිවෙළින් 45% හා 55% ක් විය. 2010 වසර සඳහා අනුරූප අගයයන් පිළිවෙලින් 39% හා 61% විය. (6 රූපය)

6 රූපය
මුළු ආදායමට ප්‍රතිශත දායකත්වය
2009 - 2010




### කර්මාන්තයේ ශුද්ධ ලාභය/පාඩුව

2009 දී ස්ථාවර දුරකථන ක්‍රියකරුවන්ගේ ශුද්ධ පාඩුව රුපියල් මිලියන 1,847 ක් වූ අතර 2010 එය රුපියල් මිලියන 181 ක ශුද්ධ ලාභයක් දක්වා වැඩිදියුණු විය. ජංගම දුරකථන අංශය සැලකිමේදී 2009 වසරේදී මෙන්ම 2010 වසරේදී ද ස්ථාවර ක්‍රියාකරුවන්ට පාඩු සිදුවී තිබේ. අනුරූප අගයන් පිළිවෙලින් රුපියල් මිලියන 17,369 හා 3,652 වන අතර 2009 සිට 2010 දක්වා කාලය තුල කර්මාන්තයේ පාඩුව 79% කින් අඩුවී තිබේ. අංශ දෙකෙහිම මුළු පාඩුව 2009 දී රුපියල් බිලියන 14.2 ක් වූ අතර 2010 දී රුපියල් බිලියන 3.5 තෙක් පහත වැටී තිබේ.

වගුව 3
ස්ථාවර හා ජංගම කර්මාන්තයේ ශුද්ධ ලාභය / පාඩුව 2009-2010

| වර්ෂය | ශුද්ධ ලාභය/පාඩුව (රු. මිලියන) | | මුළු ගණන (රු. මිලියන) |
|---|---|---|---|
| | ස්ථාවර ක්‍රියාකරුවන් | ජංගම ක්‍රියාකරුවන් | |
| 2009 | 1,847 | -17,369 | -19,216 |
| 2010 | 181 | -3,652 | -3,471 |

### 4.3 අනුගතවීම් පිළිබඳ උප අංශයේ කාර්යයන්

- ක්‍රියාකරුවන් අන පනත් වලට සහ බලපත්‍ර වලට අනුකූලව කටයුතු කරන්නේ දැයි අධීක්ෂණය.
- අවශ්‍ය වූ අවස්ථාවන්හි මහජන අදහස් විමසමින් වි.සං.නි.කො. සභාවේ නියෝග බලාත්මක කිරීම හා අධීක්ෂණය, මුදල් ගෙවීමට නියෝග, පනතේ වගන්ති අනුව කර ඇති නියෝග සහ අන්තර් සබඳතා නියමයන් බලාත්මක කිරීම සහ අධීක්ෂණය
- සේවාවේ ගුණාත්මක බව අධීක්ෂණය සහ ආර්ථික දිරිගැන්වීම් යෝජනා කිරීම.
- පාරිභෝගික සබඳතා හා පාරිභෝගික සුරක්ෂිතතාව අධීක්ෂණය
- ගුණාත්ම සේවාවක් සඳහා වූ බැදීම් (තාක්ෂණික නොවන) සම්බන්ධව සුපරික්ෂාවෙන් සිටිම.

#### 4.3.1 කාර්ය සාධනය

#### 4.3.1.1 අනුගත වීම් ගැටළු පිළිබඳ ක්‍රියාකිරිම

ක්‍රියාකරුවන් විසින් නීතිරීති හා බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කිරීම / අපගමනයවීම අවම කිරිමට ක්‍රියාකරුවන්ගේ වැඩකටයුතු සම්බන්ධයෙන් අනුගතවීම් පිළිබඳ අංශය විමසිලිමත්භාවය උදවු වී තිබේ. 2010 වසරේදී අනුගතවීම් පිළිබඳ අංශය අයක්‍රම, ග්‍රාහක බදු, සෙස් බදු සහ වෙළඳ බලපත්‍ර වලට සම්බන්ධ ගැටළු පිළිබඳ ක්‍රියාකර තිබේ. මෙම ගැටළු වලට අදාල තොරතුරු 4 වගුවේ දැක්වේ.

වගුව 4

2010 වසරේදී ක්‍රියාමාර්ග ගනු ලැබූ අනුගත වීම් පිළිබඳ ගැටළු

| ගැටළුව | උල්ලංගනය/අපගමනය | ගනු ලැබූ ක්‍රියාමාර්ගය |
|---|---|---|
| අයක්‍රම වලට අනුකූලව කටයුතු කිරීම පිළිබඳ ගැටළු. | විදුලි සංදේශ පනතේ 5ඔ වගන්තිය, පාදස්ථ මිල ගණන් පිළිබඳ නියමය සහ අදාල ක්‍රියාකරුවන්ගේ බලපත්‍ර කොන්දේසි | ගැටළු 37 කින් 27 ක් සම්බන්ධව ක්‍රියා කරන ලදී. |
| ජංගම ග්‍රාහක බදු සහ ස්ථාවර දුරකථන ග්‍රාහක බදු. | සියළුම ක්‍රියාකරුවන්ගෙන් ලැබීමට නියමිත මුදල් ප්‍රමාණයෙහි (විදුලි සංදේශ බදු) හිගයක් පවතින බව නිරීක්ෂණය විය. | තවදුරටත් ක්‍රියාකිරීම සඳහා වි.සං.නි.කො. සභාවේ අදාල අංශය වෙත දැනුම් දෙන ලදී. |
| ක්‍රියාකරුවකු විසින් සෙස් බදු ගෙවීම. | විදුලි සංදේශ පනතේ 22උ වගන්තිය. | සෙස් බදු අයකර ගැනීමට ක්‍රියාකරන ලදී. |
| අනවසර විදුලි සංදේශ උපකරණ වෙළඳ පොලෙහි තිබීම, වෙළඳ බලපත්‍රයක් නොමැතිව විදුලි සංදේශ උපකරණ විකිණීම. | විදුලි සංදේශ පනතේ 21 වගන්තිය | අනවසර විදුලි සංදේශ උපකරණ විකිණීම වැලැක්වීමට පියවර ගන්නා ලදී. |

**4.3.1.2 පුළුල් පරාස අන්තර්ජාල සේවා වල ගුණාත්මක බව අධීක්ෂනය හා මාර්ගෝපදේශ නිකුත් කිරිම.**

2009 දී ජංගම පුළුල් පරාස ග්‍රාහකයන් 61,227 ක් සිටි අතර 378% ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 2010 දී එම සංඛ්‍යාව 292,470 දක්වා ඉහළ ගොස් ඇත. ස්ථාවර පුළුල පරාස ග්‍රාහක සංඛ්‍යාවේ වෙනස්වීම් 19% ක් පමණි. ක්‍රියාකරුවන් විසින් මහජනයාට සපයනු ලබන පුළුල් පරාස අන්තර්ජාල සේවා වල ගුණාත්මක බව අධීක්ෂණය පිණිස (ADSL, WIMAX, HSPA) ප්‍රමිති ඇගයීමේ ක්‍රමවේදයක් විදුලි සංදේශ නියාමන කොමිසම හඳුන්වා දෙන ලදි. මෙම කාර්යය සඳහා වෙනම ඒකකයක් ස්ථාපනය කරන ලදි. ADSL, WIMAX හා HSPA ක්‍රියාකරුවන්ගේ විවිධාකාර පුළුල් පරාස සේවා ගණනාවක් නිරීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය උපකරණ මෙම ඒකකයට සපයන ලදී.

7 රූපය



රටේ ග්‍රාහකයින් විසින් මුහුණපාන පුළුල් පරාස සේවා වල ගුණාත්මකභාවය පිළිබඳ සෝදිසියෙන් සිටීම මෙම ඒකකයේ ප්‍රධාන පරමාර්ථය විය. පුළුල් පරාස සේවාවේ සමස්ථ ගුණාත්මක බව පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබාගැනීම පිණිස පුළුල් පරාසය තිබෙන දිවයිනේ විවිධ ප්‍රදේශ තුළ සුදුසු පරීක්ෂණ පවත්වන ලදී. පවතින්නාවූ වේගයන් මැනීම සඳහා ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර ඛණ්ඩ වෙන් වෙන්ව අධීක්ෂණය කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඉල්ලීමට අනුව යමින් පුළුල් පරාස සේවා සපයන්නෝද තම ජාල තුල මෙම පරීක්ෂණ නිවැරදිව සිදු කිරීම සඳහා යාන්ත්‍රණ ස්ථාපිත කළෝය. මෙම ක්‍රියාමාර්ගය මගින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට යම් ක්‍රියාකරුවවෙකුගේ ප්‍රවේශ ජාලය තම නිරීක්ෂණය යටතේ තබා ගැනීමට සහ සේවාවේ ගුණාත්මකභාවය අධීක්ෂනය සඳහා ප්‍රයෝජනවත් වන ඇතැම් දත්ත ලබාගැනීමට ඉඩ සැලසින.

පුළුල් පරාස ග්‍රාහකයන්ගේ දැනුවත් බව ඉහල නැංවීමේ අරමුණ කොට ගෙන 2010 අගෝස්තු මස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මාර්ගෝපදේශ සමූහයක් පුළුල් පරාස සේවා සපයන්නන් වෙත නිකුත් කළේය. මෙයට අදාලව තම ප්‍රධාන වෙබ් අඩවිය තුළ වෙනම වෙබ් පෝටලයක් (වෙබ් කවුළුවක්) පවත්වා ගෙන යන ලෙසට සියළුම ක්‍රියාකරුවන්ට විදුලි සංදේශ කොමිෂන් සභාව නියෝග කළේය.

### 4.3.1.3 පාරිභෝගික පැමිණිලි පිළිබඳ ක්‍රියාකිරීම

ග්‍රාහකයෙකු හෝ මහජනයා අතුරෙන් කෙනෙකු හෝ විසින් කරනු ලබන ලිඛිත පැමිණිලි විභාග කිරීමට ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් සභාවට බලය තිබේ. ඒ අනුව විදුලි සංදේශ කටයුතු වලට අදාල කාරණා සම්බන්ධයෙන් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමට හා ඔවුන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීමට ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් සභාව එහි සමස්ථ ක්‍රමෝපායේ කොටසක් ලෙස වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේ. මෙම කාර්යය සඳහා ආර්ථික කටයුතු අංශය යටතේ පාරිභෝගික සබඳතා ඒකකය නමින් ඒකකයක් පිහිටුවා තිබේ. බිල්පත් වලට අදාල වූ ආරවුල්, නව සබඳතා වල දෝෂ, කරදරකාරී ඇමතුම්, ජංගම දුරකථන නැතිවීම, අන්තර්ජාල සබඳතාවලට සහ ගෙවීම් කරන රූපවාහිනී සේවා වලට අදාල ගැටළු යනාදී විවිධාකාර වූ පැමිණිලි ඒකකය වෙත ලැබේ. පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේදී, පාරිභෝගික සබඳතා ඒකකය ක්‍රියකාරුවන් සමග හා පැමිණිල්ලේ ස්වභාවය අනුව පොලිසිය සමග ද සන්නිවේදනය කරයි. පැමිණිලිරුවන්ගේ දැනගැනීම පිණිස ශ්‍රී.ලං.වි.සං.නි.කොමිෂන් සභාව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගය පිළිබඳව ඔවුන් වෙත දැනුම් දෙනු ලැබේ. 2010 වසරේදී 10,000 කට වැඩි පැමිණිලි ප්‍රමාණයක් ඒකකය වෙත ලැබුණු අතර එයින් වැඩිම ප්‍රමාණයක් (ආසන්න වශයෙන් 5600 ක්) ජංගම දුරකථන නැතිවීම පිළිබඳ පැමිණිලි විය. ජංගම දුරකථන නැතිවීම පිළිබඳ පැමිණිලි ගත් කළ, දුරකථන 1200 ක් තිබෙන්නාවූ ස්ථානය හඳුනාගැනීමට ඒකකය සමත්විය.

5 පරිච්ඡේදය

# වර්ණාවලි කළමනාකරණ අංශය

විදුලි සංදේශ පනතේ 10 වැනි වගන්තිය ප්‍රකාරව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතය හා චන්ද්‍රිකා කක්ෂයට අදාල කරුණු කළමනාකරණය කිරීමේ හා පාලනය කිරීමේ එකම බලධරයා ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් සභාව වේ. ගුවන් විදුලි වර්ණාවලිය නිශ්චිත ස්වභාවික සම්පතකි. සීමිත සම්පතක පවතින ගුණාංග හේතුවෙන් වර්ණාවලියට වැදගත් ආර්ථික වටිනාකමක් හිමිවන අතර එහි සමස්ත ප්‍රතිලාභය උපරිම කරගැනීම පිණිස එය කළමනාකරණය කළ යුතුවේ.

කර්මාන්තයට සහ පාරිභෝගිකයන් සෘජුවම සන්නිවේදන සැපයීමට වැඩි වැඩියෙන් වර්ණාවලිය භාවිතා කෙරෙන බැවින්, ආර්ථිකයේ යෙදවුම් සම්පතක් වශයෙන් වර්ණාවලියේ වැදගත්කම සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. වර්ණාවලියේ වත්මන් භාවිතා කිරීම් අඛණ්ඩව වර්ධනය වන අතර, ඒ සමගම අළුත් සේවාවන් නොකඩවා වර්ධනය වෙමින් පවතී. තාක්ෂණය වෙනස් වීමේ වේගය වැඩියෙන්ම පවතින පරිසරයක් තුළ වර්ණාවලිය භාවිතා කිරීමේ වෙනස්වීම්වලට පහසුකම් සැලසීම වර්ණාවලි කළමනාකරණ අංශය හමුවේ ඇති අභියෝගය වේ. මෙම

අඛණ්ඩව වැඩිවන ඉල්ලුමට අවශ්‍ය දෑ සැපයීමට සිදුවී ඇත්තේ දැනටමත් වර්ණාවලිය භාවිතා කරමින් සිටින විශාල පිරිසකට මේ වනවිට වෙන්කර දී ඇති වර්ණාවලිය කළමනාකරණය කරමිනි. මෙම අභියෝගයට මුහුණදීම සඳහා සුපරික්ෂාකාරී සැලසුම්කරණය සහ ඇතැම් අවස්ථාවලදී වර්ණාවලිය භාවිතය පිළිබඳ දුෂ්කර තීරණ ගැනීම අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ කොන්දේසි වලට අත්සන් තැබූ රටක් බැවින් ගුවන් විදුලි නියාමනයන්ට අනුගතව ක්‍රියාකිරීමට බැඳී තිබේ. විදුලි සංදේශ පනතේ 5 වැනි වගන්තිය අනුව ගුවන් විදුලි සංඛ්‍යාත භාවිතා කිරීමට අවශ්‍යතාව තිබෙන පාර්ශව විසින් ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සංරක්ෂණය කිරීම හා මනා ලෙස භාවිතා කිරීම සිදුකරන බවට වග බලා ගැනීම පිණිස සංඛ්‍යාත වෙන්කර දීම, අනවශ්‍ය සංඛ්‍යාත විමෝචන අත්හිටුවීම හා දී ඇති අවසරය ආපසු ගැනීම සඳහා බලය ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් සභාවට තිබේ.

## 5.1 කාර්යයන්

- ගුවන් විදුලි නියාමන හා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ නිර්දේශවලට අනුකූලව ගුවන් විදුලි වර්ණාවලිය සැළසුම් කිරීම.
- නව තාක්ෂණ හඳුන්වාදීම පිණිස වර්ණාවලිය ලබාදීම.
- යෝග්‍ය පරාස වලින් ගුවන් විදුලි සංඛ්‍යාත හඳුනාගැනීම සහ වෙන්කර දීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ, නියමයන් හා ගාස්තු ව්‍යූහයන් සකස් කිරීම.
- සංඛ්‍යාත භාවිතය හා ඒ හා සම්බන්ධ උපකරණ සඳහා ඉන්වොයිසි සැකසීම හා බලපත්‍ර සකස් කිරීම.
- සියළුම සංඛ්‍යාත භාවිතා කරන්නන් ගේ සංඛ්‍යාත වෙන්කිරීම්, ට්‍රාන්ස්මීටර ස්ථානගත කර ඇති ස්ථාන, ට්‍රාන්ස්මීටර් වල තාක්ෂණික දත්ත, ඉන්වොයිස් හා බලපත්‍ර දත්ත අඩංගු දත්ත, බැංකුවක් කළමණාකරණය කිරීම.
- ඇතැම් ගුවන් විදුලි උපකරණ සඳහා මාදිලි අනුමති ලේඛන නිකුත් කිරීම
- ආයෝජන මණ්ඩලය, ආනයන පාලන දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන වලට උපකරණ නිශ්කාශන නිර්දේශ සහ අනුමැතීන් ලබාදීම.
- ගුවන් විදුලි වර්ණාවලිය කළමනාකරණය.
- ගුවන් විදුලි සංඛ්‍යාත අවහිරකිරීම හා ගුවන් විදුලි සංඛ්‍යාත අවහිරකිරීම් සැහැල්ලු කිරීම් හා සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම.
- ශාස්ත්‍රීය ආයතන වල ශිෂ්‍යයන්ගේ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු හා නිර්දේශ ලබාදීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත හා උපකරණ භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ජාත්‍යණ්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාව (APT), ජාත්‍යන්තර සමුද්‍ර සංවිධානය (IMO), කොස්පස් (COSPAS) වැනි ජාත්‍යන්තර සංවිධාන සහ වෙනත් රටවල නියාමන සංවිධාන සමග ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලියට අදාල කරුණු පිළිබඳ සම්බන්ධීකරණය.

## 5.2 කාර්ය සාධනය

විදුලි සංදේශ පනතේ 22 වැනි වගන්තිය ප්‍රකාරව (2.6.1.2 බලන්න) ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් භාවිතා කරන කිසියම් තැනැත්තෙකුට ඒ සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් තිබිය යුතුවේ. අන්‍යාකාරයකින් නිශ්චිත සඳහනක් තිබෙන අවස්ථාවක හැර බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් වූ නියමයන්ට අනුව ගාස්තුවක් ගෙවීමෙන් පසු බලපත්‍රය නිකුත්

කරනු ලැබේ. බලපත්‍රය සමග බලපත්‍ර කොන්දේසි නිකුත් කරනු ලැබේ. කොන්දේසි සේවාවෙන් සේවාවට වෙනස් විය හැකිය. කිසියම් කොන්දේසියක් කඩකරනු ලැබූ අවස්ථාවක උපකරණ මුද්‍රා තැබීමට සහ බලපත්‍රය අවලංගු කිරීමට ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් සභාවට බලය තිබේ.

සේවා වර්ගය අනුව විවිධ පරාස සඳහා ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය බෙදා වෙන් කරගනු ලැබේ. ගුවන් විදුලි තරංගවල ගති ලක්ෂණ, උපකරණ හා යෙදුම් ක්‍රමලේඛවල තාක්ෂණික පරාමිතීන් අනුව සේවාවන් එකිනෙකට වෙනස් වේ. එබැවින් වර්ණාවලි කළමනාකරණ අංශයේ වැඩ සේවා කාණ්ඩ කිහිපයකට බෙදා වෙන්කොට ඇත.

ඕනෑම ගුවන් විදුලි සංඛ්‍යාත උපකරණයක් ආනයනය කිරීම සඳහා ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් සභාවේ අවසරය (නිෂ්කාශනය) ලබා ගත යුතු වේ. නිෂ්කාශන ලිපිය නිකුත් කිරීමට පෙර උපකරණය නියමිත ප්‍රමිතීන්ට අනුකූල වන බවට හා උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී.ලං.වි.සං.නි.කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සංඛ්‍යාතයක් තිබෙන බවට වර්ණාවලි කළමනාකරණ අංශය වග බලා ගනී. මෙමගින් නීති විරෝධී සංඛ්‍යාත භාවිතය හා වර්ණාවලිය භාවිතා කරන බලපත්‍ර ලාභීන්ට සිදුවන ගුවන් විදුලි අවහිරතා අවම කෙරේ.

කෙසේ වෙතත්, තම සම්ප්‍රේෂණ වලට අවහිරතා ඇතිවන අවස්ථාවලදී භාවිතාකරන්නන්ගෙන් වර්ණාවලි කළමනාකරණ අංශය වෙත පැමිණිලි ලැබේ. අවහිරතා වල මූලය හඳුනාගැනීමට සහ අදාල වන විසඳුම් ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රම සකස් කර තිබේ.

2010 වසර තුළ නිකුත් කරන ලද සංඛ්‍යාත හා බලපත්‍ර සංඛ්‍යාව මෙන්ම අවහිරතා පැමිණිලි සහ වර්ණාවලි කළමනාකරණ අංශය විසින් හඳුනාගනු ලැබූ අනවසර භාවිතා කරන්නන් පිළිබඳව සංඛ්‍යා ලේඛණ පහත දැක්වේ.

### 5.2.1 සංඛ්‍යාත වෙන්කිරීම

වගුව 5

නිකුත් කරනු ලැබූ මුළු සංඛ්‍යාත සංඛ්‍යාව - 2010

| සේවා වර්ගය | සංඛ්‍යාත සංඛ්‍යාව |
|---|---|
| ස්ථාවර සේවාව | 4724 |
| විකාශන සේවාව | 66 |
| සෙලියුලර් දුරකථන සේවාව | 02 |
| දත්ත සහ ගුවන් විදුලි දුරවේදනය | 28 |
| ගුවන් ගමන් හා සමුද්‍රාසන්න සේවාව | |
| (i) සමුද්‍රාසන්න ජංගම සේවාව | 8 |
| (ii) ගුවන් ගමන් ජංගම සේවාව | 4 |
| පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවා | 13 |

### 5.2.2 සංඛ්‍යාත බලපත්‍ර නිකුත් කිරීම

වගුව 6 - සංඛ්‍යාත බලපත්‍ර නිකුත් කිරීම - 2010

| සේවා වර්ගය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|
| ස්ථාවර සේවාව | 38 |
| විකාශන සේවාව | 25 |
| සෙලියුලර් ජංගම සේවාව | 5 |
| ට්‍රන්කින්/පේජින්/සිටිසන් බෑන්ඩ් | 8 |
| දත්ත සහ ගුවන් විදුලි දුරවේදන සේවාව | 24 |
| ගුවන් ගමන් හා සමුද්‍රාසන්න සේවාව | |
| ගුවන් යානා මධ්‍යස්ථාන | 34 |
| නැව් මධ්‍යස්ථාන | 65 |
| සමුද්‍රාසන්න ජංගම | 78 |
| ගුවන් ගමන් ජංගම | 5 |
| පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවාව | 185 |

### 5.2.3 වර්ණාවලිය භාවිතා කරන්නන්ගෙන් පැමිණිලි ලැබීම හා අවහිරතා සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම.

වගුව 7 - ලැබුණු පැමිණිලි හා පැවැත්වූ විමර්ශන 2010

| සේවාව | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | පැවැත්වූ විමර්ශන සංඛ්‍යාව |
|---|---|---|
| රූපවාහිනි සහ ගුවන් විදුලි විකාශනය | 13 | 08 |
| වෙනත් සේවාවන් | 53 | 53 |

### 5.2.4 සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධි ලෙස භාවිතා කරන්නන් හඳුනාගැනීම

වගුව 8

හඳුනාගත් නීති විරෝධි භාවිතා කරන්නන් සංඛ්‍යාව සහ ගනු ලැබූ නිවාරන ක්‍රියාමාර්ගය

| වර්ගය | හඳුනාගත් නීති විරෝධී භාවිතා කරන්නන් සංඛ්‍යා | ගනු ලැබූ ක්‍රියාමාර්ගය |
|---|---|---|
| විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන් විදුලිය) | 05 | සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කිරීම වැලැක්වීමට පියවර ගන්නා ලදී. |
| වෙනත් සේවාවන් | 03 | |

සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධි ලෙස භාවිතා කරන අය හඳුනාගැනීම සඳහා විශේෂ උපකරණ භාවිතා කරනු ලැබේ. මෙම කාර්යය සඳහා නිර්මාණය කරන ලද විශේෂ රථයක මෙම උපකරණ සවිකර තිබේ.




සංඛ්‍යාත ආවේක්ෂණ උපකරණ




සංඛ්‍යාත ආවේක්ෂණ ජංගම රථය

### 5.2.5 රැහැන් රහිත විදුලි සංදේශ උපකරණ ආනයනය සඳහා නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම.

වගුව 9
නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව - 2010

| සේවා වර්ගය | නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව |
|---|---|
| ස්ථාවර සේවාව | 720 |
| විකාශන සේවාව (රූපවාහිනී හා ගුවන් විදුලි) | 105 |
| සෙලියුලර් ජංගම සේවාව | |
| 1. වෙළඳ බලපත්‍ර | 4058 |
| 2. ජංගම ක්‍රියාකරුවන් | 927 |
| 3. ට්‍රන්කින් / පේජින් / සිටිසන් බෑන්ඩ් | 7 |
| ගුවන් ගමන් හා සමුද්‍රාසන්න සේවාව | |
| 1. ගුවන් යානා මධ්‍යස්ථාන | 6 |
| 2. නැව් මධ්‍යස්ථාන | 3 |
| 3. සමුද්‍රාසන්න ජංගම | 85 |
| 4. ගුවන් ගමන් ජංගම | 2 |
| 5. ගුවන් ගමන් හැසිරවීම | 1 |
| 6. විවිධ | 29 |
| පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවාව | |
| 1. පී එම් ආර් | 159 |
| 2. සී ඩී එම් ඒ | 245 |
| දත්ත සේවාව | 482 |
| චන්ද්‍රිකා සේවාව | 1020 |

2010 වසරේදී වර්ණාවලි කළමනාකරණ අංශය විසින් ඉටුකරන ලද වැදගත් ක්‍රියාකාරකම් පහත දැක්වේ.

**5.2.6 ජංගම උපකරණ අනන්‍යතාව හඳුනාගැනීමේ අංකය තහවුරු කර ගැනීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම.**

මීට ඉහත සඳහන් කර ඇති පරිදි, කිසිම තැනැත්තෙකු විසින් ශ්‍රී.ලං.වි.සං.නි.කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ හැර යම් විදුලි සංදේශ උපකරණයක් වෙළඳාමක් වශයෙන් නිෂ්පාදනය කිරීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පැවරීම, කුලියට දීම, බදු දීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අලුත්වැඩියාව කිරීම සිදු නොකළ යුතුය. එබැවින් ජංගම දුරකථන ආනයනකරුවන් ජංගම දුරකථන ආනයනය කිරීමට සහ විකිණීමට ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවෙන් බලපත්‍රයක් ලබා ගත යුතු අතර, ආනයනය කිරීමට පෙර ඒ සඳහා ශ්‍රී.ලං.වි.සං.නි.කොමිෂන සභාවේ අනුමතිය ලබාගත යුතුවේ.

මීට ඉහත සඳහන් කළ පරිදි, මෑත අතීතයේ ජංගම දුරකථන ක්ෂේත්‍රයේ සාතිය වර්ධනයක් සිදුවී තිබේ. මෙම වර්ධනයත් සමග මිල අඩු වූ විවිධාකාර ගුණාංග වලින් සමන්විත ජංගම අත්යන්ත්‍ර වෙළෙඳපොලට ගලා ඒමට පටන් ගෙන තිබේ. අඩු මිලට, විවිධ ආකර්ෂණීය අංග වලින් සමන්විත වෙළෙඳ ලකුණු රහිත අත්යන්ත්‍ර වෙළෙඳපොල වේගයෙන් අල්ලා ගෙන තිබේ. වෙළඳ ලකුණු රහිත දුරකථන බොහෝමයක් ශ්‍රී.ලං.වි.සං.නි.කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව ආනයනය කර තිබූ අතර ඒවා වෙළඳපොලෙහි බාධාවකින් තොරව මිල දී ගැනීමට තිබිණි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන අත් යන්ත්‍ර සඳහා අනුමැතිය දීමේ වැඩපිළිවෙල පිළිබඳව දැනුවත් නොමැති කම නිසා භාවිතයෙන් ඇතිවන ඵල විපාක පිළිබඳ අවබෝධයකින් තොරව පාරිභෝගිකයින් විසින් මෙම අත් යන්ත්‍ර මිලට ගෙන ඇත.

ශ්‍රී.ලං.වි.සං.නි.කොමිෂන් සභාවේ වර්ණාවලි කළමනාකරණ අංශය 2010 මාර්තු 01 වන දින සිට සියළුම ජංගම දුරකථන ආනයනයන්හි ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා දත්ත එක් රැස් කිරීම ආරම්භ කළ අතර එම දත්ත කළමනාකරණ පද්ධතියට ඇතුළත් කරන ලදී. (7 රූපය)

ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවේ සභාපති ජංගම උපකරණ අනන්‍යතාව තහවුරු කර ගැනීමේ පද්ධතිය (TRIVES) කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගනක පාසල මගින් සවි කිරීමත් නඩත්තුවත් සිදුකළ අතර එය දැන්/ක්‍රියාත්මක වෙමින් පවතී. ජාත්‍යන්තර සංඛ්‍යාංක 12 කින් සමන්විත ජංගම උපකරණ අනන්‍යතා අංකය සෑම ජංගම අත්යන්ත්‍රයක් සඳහාම දෙනු ලබන විශේෂිත අංකයක් වන අතර බැටරිය ඉවත් කළ පසු උපකරණය ඇතුළත එය දැකිය හැකි වේ. අත් යන්ත්‍රයේ යතුරු පුවරුවේ *#06# ඇතුළත් කිරීමෙන් පසු මෙම අංකය තිරය මත දිස්වේ. මාදිලි වෙන් කිරීමේ සංකේතය (TAC) වනුයේ ජංගම උපකරණ අනන්‍යතාව හඳුනාගැනීමේ අංකයේ IMEI අංකයේ පළමු සංඛ්‍යාංක 8 වන අතර එමගින් නිෂ්පාදිත රට, මාදිලිය සහ නිෂ්පාදකයා නිරූපණය වේ.

ශ්‍රී ලංකා රේගුවෙන් ජංගම දුරකථන නිෂ්කාශනය කර ගැනීම පිණිස අනුමත කිරීමේ ලිපි ලබා ගැනීමේදී, ආනයනය කරුවන් ආනයනය කරනු ලැබූ ජංගම දුරකථන වල අනන්‍යතා අංක ඉදිරිපත් කළ යුතුවේ.

මිලදී ගැනීමට බලාපොරොත්තු වන ජංගම දුරකථනය ශ්‍රී.ලං.වි.සං.නි.කොමිෂන් සභාවෙන් අනුමත වූ දුරකථනයක්ද යන්න අය කිරීමකින් තොරව දැනගැනීමට හැකි යන්ත්‍රයක් ශ්‍රී.ලං.වි.සං.නි.කොමිෂන් සභාව විසින් ස්ථාපනය කරන ලදී. 2010 පෙබරවාරි සිට මෙම යන්ත්‍රණය පිළිබඳ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින් මහජනයා දැනුවත් කිරීමට ශ්‍රී.ලං.වි.සං.නි.කොමිෂන් සභාව පියවර ගත්තේය.

7 රූපය

ජංගම උපකරණ අනන්‍යතාව හඳුනාගැනීමේ අංකය තහවුරු කර ගැනීමේ පද්ධතිය




මෙම ක්‍රමයේ වැදගත්කම නිසා ජංගම ක්‍රියාකරුවන් විසින් ඔවුන්ගේ සේවා සහ තම ජාල හරහා කෙටි පණිවුඩ සේවා අය කිරීමකින් තොරව සපයන ලදී.

දුරකථනයේ තත්‍යභාවය තහවුරු කිරීමේ පටිපාටිය

යම් තැනැත්තෙකු ජංගම දුරකථනයක් මිල දී ගැනීමට ප්‍රථම සංඛ්‍යාංක 15 කින් සමන්විත ජංගම උපකරණ අනන්‍යතා අංකය සමග ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ යොමු අංකය සහිත ස්ටිකරය දුරකථනය අඩංගු පෙට්ටියෙහි තිබේ දැයි පරීක්ෂා කළ යුතු වේ.




ජංගම උපකරණ අංකය සහ ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවේ යොමු අංකය දක්වා ඇති ස්ටිකරය සඳහා උදාහරණයක්.

ජංගම දුරකථනය ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව විසින් අනුමත කර තිබේදැයි තහවුරු කර ගැනීම පිණිස පාරිභෝගිකයා විසින් IMEI < > IMEI No යන අකුරු දුරකථනයට ඇතුළත් කොට අංක 1909 ට කෙටි පණිවුඩයක් එවිය යුතුවේ.

එවිට ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ ස්ථාපිත කර ඇති ස්වයංක්‍රීය පද්ධතියෙන් පාරිභෝගිකයා වෙත පහත සඳහන් පණිවිඩය ලැබෙනු ඇත.

ලියාපදිංචි ජංගම උපකරණ අනන්‍යතාව ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභා යොමු අංකය DL හෝ ML හෝ TRC/XXX/XXX නොදන්නා IMEI: කරුණාකර ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ දුරකථන අංක 011-2676993/4 අමතන්න.

ඉන්පසු පාරිභෝගිකයා විසින් තමා වෙත පළමු පණිවිඩය මගින් ලැබුන අංකය පෙට්ටිය තුළ තිබෙන ස්ටිකරය මත ඇති ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ යොමු අංකය සමග සසඳා බැලිය යුතුවේ. මෙම අංක දෙක සර්වසම විය යුතුය.

මෙම අංක දෙක සර්වසම නොවේ නම් හෝ පරිභෝගිකයා වෙත ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව වෙතින් ඉහත සඳහන් දෙවන පණිවිඩය ලැබුනේ නම් එමගින් සනාථ වනුයේ ප්‍රශ්නගත ජංගම දුරකථනය ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවෙන් අනුමත කරනු ලැබූ තථ්‍ය දුරකථනයක් නොවන බවයි. අදාල දුරකථනය මිලදී ගැනීමෙන් වැලකීම සඳහා පාරිභෝගිකයාට එය පූර්ව දැනුම් දීමක් වේ.

අනාගත වර්ධනයන්:

විශේෂිත අවශෝෂණ අනුපාතික අගය, ජංගම දුරකථන ආනයනය කරන නිත්‍යානුකූල විකුණුම්කරුවන් සහ උපකරණ වල තාක්ෂණික විස්තර වැනි තොරතුරු ලබා ගැනිමෙන් පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම පිණිස දත්ත කළමනාකරණ පද්ධතිය ව්‍යාප්ත කරනු ලැබේ.

විකුණුම්කරුවන්ට උපකරණ ආනයනය කිරීමට බලය දෙනු ලබන අවස්ථාවේදී දුරකථන පෙට්ටියෙහි ඇලවීම සඳහා වන ස්ටිකරය ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව විසින් මුද්‍රණය කර නිකුත් කරනු ඇත.

මාදිලි අනුමැතිය ලබාදීමට ප්‍රථම ජංගම දුරකථන පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණාගාරයක් ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වේ.

**5.2.7 මෙගාහට්ටස් 406 හදිසි ආපදා සංඥා උපකරණ ලියාපදිංචි කිරීම**

2008 අගෝස්තු මාසයේ දී, හදිසි ආපදාවන්ට ලක්වූ නැව් චන්ද්‍රිකා මගින් නිරීක්ෂණය කර සිදුකරන ගවේෂණ මගින් ගලවා ගැනීම පිළිබඳ (COSPAS-SARSAT) ලේකම් කාර්යාලය විසින් ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව මෙගාහට්ස් 406 හදිසි ආපදා සංඥා උපකරණ ලියාපදිංචි කිරීමේ ජාතික සබඳතා මධ්‍යස්ථානය වශයෙන් පිළිගන්නා ලදී. COSPAS-SARSAT පිළිබඳ කෙටි විස්තරයක් පහත දක්වා ඇත.

ජාතික සබඳතා මධ්‍යස්ථානයක් පිහිටුවීමේ අවශ්‍යතාව පැන නැගුනේ මෙගාහට්ස් 121.5 හදිසි ආපදා සංඥා උපකරණ වල පැවති සීමාවන් හඳුනාගෙන එම උපකරණ වල සංඥා චන්ද්‍රිකා තාක්ෂණයෙන් සැකසීම 2009 පෙබරවාරි 01 දින සිට ඉවත් කොට මෙගාහට්ස් 406 සංඥා උපකරණ පමණක් හඳුනා ගැනිමට (COSPAS-SARSAT) කවුන්සලය විසින් තීරණය කිරීමෙන් පසුව වේ. මෙම තිරණයත් සමග පිළිගත් ජාතික නාභිය මධ්‍යස්ථානය හරහා පමණක් මෙගාහර්ට්ස් 406 සංඥා උපකරණ ජාත්‍යන්තර හදිසි සංඥා උපකරණ ලියා පදිංචි කිරීමේ දත්ත මූලයෙහි (IBRD) ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාව පැන නැගුණි.

ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව නව ආපදා සංඥා උපකරණ ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳව මහජනයා දැනුවත් කිරීම පිණිස දැන්වීම් ප්‍රසිද්ධ කිරීමෙන් IBRD හි ලියාපදිංචි

කිරීම පිණිස ජාතික හදිසි සංඥා උපකරණ ලැයිස්තුව සකස් කිරීම සඳහා තොරතුරු ලබාගත්තේය. ඒ අනුව 2010 පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකා සංකේතය සහිත හදිසි ආපදා සංඥා උපකරණ 132 ක් එම උපකරණ ලියාපදිංචි කිරීමේ දත්ත මූලයෙහි (IBRD හි) ලියාපදිංචි කරන ලදී. ලියාපදිංචි කරනු ලැබූ විවිධ වර්ගයේ හදිසි ආපදා සංඥා උපකරණ 10 වන වගුවේ දැක්වේ. ජාතික නාභීය මධ්‍යස්ථානය හරහා පමණක් ශ්‍රී ලංකාවේ සියළුම හදිසි ආපදා සංඥා උපකරණ ලියාපදිංචි කිරීමටත්, තනි තනිව ලියාපදිංචි වීම සඳහා දරණු ලබන ප්‍රයත්නයන් ප්‍රතික්ෂේප කිරීමටත් හැකිවන පරිදි (COSPAS-SARSAT) ආයතනය විසින් 2010 පෙබරවාරි සිට ක්‍රියාත්මක වන පරිදි ජාත්‍යන්තර හදිසි ආපදා සංඥා උපකරණ ලියාපදිංචි කිරීමේ දත්ත මූලයෙහි රාමුව වෙනස්කර තිබේ.

වගුව 10

ජාත්‍යන්තර හදිසි ආපදා සංඥා උපකරණ ලියාපදිංචි කිරීමේ දත්ත මූලයේ (IBRD) ලියාපදිංචි කර ඇති උපකරණ

| හදිසි ආපදා උපකරණ වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| අවදානම් තත්ත්වය පෙන්නුම් කරන ගුවන් විදුලි සංඥා උපකරණ | 80 |
| අවදානම් සිදුවී ඇති ස්ථානය හැඳින ගැනීමේ ට්‍රාන්ස්මීටර් | 40 |
| පුද්ගලික ස්ථාන හඳුනාගැනීමේ හදිසි ආපදා සංඥා උපකරණ | 12 |

සටහන:

COSPAS යන කෙටි යෙදුම් කොස්මිචෙස්කයා සිස්ටම් පොයිස්කා ඇවරියන්ත් සුඩෝව් යන රුසියානු වචන සඳහා යොදන කෙටි යෙදුම වේ. ආපදාවන්ට ලක්වී සිටින නෞකා සොයා ගැනීම සඳහා අභ්‍යවකාශ පද්ධතිය යන අර්ථය ගැබ්ව තිබේ. SARSAT යනු චන්ද්‍රිකා නිරීක්ෂණ ආධාරයෙන් සොයා ගෙන මුදවා ගැනීම යන අරුත දැක්වීම සඳහා යොදන ඉංග්‍රීසි කෙටි යෙදුම වේ. COSPAS-SARSAT යනු කැනඩාව, ප්‍රංශය, අමෙරිකා එක්සත් ජනපදය සහ පෙර පැවති සෝවියට් සංගමය විසින් 1979 දී පිහිටුවන ලද ජාත්‍යන්තර චන්ද්‍රිකා මූලික සෝදිසි කිරීමේ හා මුදවා ගැනීමේ ආපදා ඇඟවීම් සොයාගැනීමේ හා තොරතුරු බෙදාහැරීමේ පද්ධතියකි. පද්ධතිය භූ ඛණ්ඩයකින් හා අභ්‍යවකාශ ඛණ්ඩයකින් සමන්විත වේ. COSPAS-SARSAT පිහිටා ඇත්තේ කැනඩාවේ ක්විබෙක්, මොන්ට්‍රියල් හි වේ.

6 පරිච්ඡේදය

# ජාල අංශය

## 6.1 කාර්යයන්

- ජාතික අංකන සැලැස්ම කළමනාකරණය
- විදුලි සංදේශ යටිතල ව්‍යූහ පුද්ගලයන්/සංවිධාන විසින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා අධ්‍යයනය සහ ඒවා පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම හා වාර්තා ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ අංශය සඳහා තාක්ෂණික ප්‍රමිතීන් ක්‍රියාවට නැංවීම හා ජාත්‍යන්තර විදුලි සංදේශ ප්‍රමිති අංශයට ජාත්‍යන්තර විදුලි සංගමයේ ප්‍රමිතිකරන අංශය (ITU-T) සහ ලෝක විදුලි සංදේශ ප්‍රමිතිකරන අංශය (WTSA) අදාල සියළු වැඩ කටයුතු ඉටු කිරීම.
- තාක්ෂණික ඇගයීම් කමිටුවලට (TEC) සහභාගීවීම සහ විදුලි සංදේශනයට අදාල තාක්ෂණික යෙදවුම් සැපයීම
- ජාලයට සම්බන්ධ කිරීම සඳහා අග්‍රස්ථ හා ජාල උපකරණ මාදිලි අනුමත කිරීම සහ රේගු නිෂ්කාශණය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ක්‍රියාකරුවන් සඳහා සංඥා ලක්ෂ සංඛ්‍යාත සැලසුම්කරණය හා ක්‍රියාවට නැංවීම.
- විකුණුම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා අයදුම්පත් පරික්ෂාවට භාජනය කිරීම. (2.6.1.4 බලන්න)
- බලපත්‍රලාභී ක්‍රියා කරුවන්ගේ යටිතල ව්‍යූහයන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති වලට පහසුකම් සැලසීම.

6.2 කාර්ය සාධනය

2010 වසර තුළදී ජාල අංශය නියාමන කාර්යයන් (විකුණුම් බලපත්‍ර නිකුත් කිරීම, උපකරණ ආනයනය සඳහා නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම, පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම, විදුලි සංදේශ යටිතල ව්‍යුහයන් සංවර්ධනය කිරීමට අදාල ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සකස් කිරීම වැනි) සහ කුළුණු ඉදිකිරීම, ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා ප්‍රදර්ශන ආදී සංවර්ධන කාර්යයන් ඉටු කිරීමට දායක විය. 2010 වසර තුළ ජාල අංශය විසින් ඉටුකරන ලද කාර්යයන්ට අදාල සංඛ්‍යාලේඛන 11 වගුවේ දැක්වේ.

වගුව 11

ජාල අංශය විසින් ඉටුකරනු ලැබූ කාර්යයන්ට අදාල සංඛ්‍යාලේඛන - 2010

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| විකුණුම් බලපත්‍ර නිකුත් කිරීම | 487 |
| විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම | 548 |
| කුළුණු ඉදිකිරීමට අනුමතිය දීම | 825 |
| කුළුණු ඉදිකිරීම් සම්බන්ධව ආරක්ෂක අමාත්‍යාංශය සමග පැවති රැස්වීම් (අධ්‍යයන සැසි සහ පරිශ්‍ර හවුලේ පරිහරණය කිරීමේ හැකියාව පිරික්සීම) | 13 |
| 2011 වසරේ කුළුණු ඉදිකිරීම සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම | 78 |
| කුළුණු ඉදිකිරීම් සම්බන්ධ අධිකරණ නඩු | 17 |
| ශ්‍රී.ලං.වි.සං.කො.සභාවට වාසිවන පරිදි විසඳුනු කුළුණු ඉදිකිරීම් සම්බන්ධ අධිකරණ නඩු | 10 |
| මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 10 |
| ප්‍රදානය කරනු ලැබූ අළුත් මාදිලි අනුමතීන් | 28 |
| වාණිජ කටයුතු සඳහා නිෂ්කාශන වාර්තා ඉදිරිපත් කිරීම | 3217 |
| තනි පුද්ගල නිෂ්කාශන වාර්තා | 88 |
| ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරු විභාගය සඳහා පෙනීසිටි අයදුම්කරුවන් | 51 |
| ප්‍රදර්ශන | 04 |
| නිකුත් කරනු ලැබූ කෙටි සංකේත | 07 |

ජාල අංශ විසින් ඉටුකරනු ලැබූ ප්‍රධාන කාර්යයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

### 6.3 කොකාවිල් බහුකාර්ය කුළුණ හා සම්ප්‍රේෂණාගාරය ඉදිකිරීම.



කොකාවිල් කුළුණ

කොකාවිල් සම්ප්‍රේෂණ කුළුණ පිළිබඳ විශේෂ සඳහනක් කළ යුතුවේ. අතීතයේදී කොකාවිල් සම්ප්‍රේෂණ කුළුණ උතුරු පලාතේ ජනතාවගේ ගුවන් විදුලි විකාශන අවශ්‍යතා සඳහාසේවා සැපයීමට භාවිතා විය. ශ්‍රී ලංකා හමුදාවෙන්ගේ මානුෂික මෙහෙයුමේදී රජයේ හමුදා කුළුණ නැවත අත්පත් කරගත් අතර උතුරු වසන්තය වැඩසටහන යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ කොමිෂන් සභාවේ අරමුදල් සහ අධීක්ෂනය ද, ජනමාධ්‍ය සහ තොරතුරු අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයද යටතේ කුළුණ නැවත ගොඩනැගීම 2009 වසරේ දී ආරම්භ විය. නිර්මාණය කර ගොඩනැගීමේ පදනම මත මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය ඉදිකිරීමේ කටයුතු බාරගත්තේය. කුළුණ ඉදිකිරීමේ වැඩකටයුතු වලින් වැඩි කොටසක් 2010 දී සිදුවූ අතර, එම කාර්යය සඳහා එම වසරේදී රුපියල් මිලියන 222 ක් සඳහා එම වසරේදී රුපියල් මිලියන 222 ක් වැයකරන ලදී. ශ්‍රී ලංකාවේ විශාලතම සහ උසම සම්ප්‍රේෂණ කුළුණ කොකාවිල් වන අතර එහි උස මීටර් 174 ක් වේ. මෙම බහු කාර්ය කුළුණේ වැඩ නිමවීමෙන් පසු විදුලි සංදේශ, රූපවාහිනී, ගුවන්විදුලි සහ රජයේ අනිකුත් ආයතනික පහසුකම් සවිකිරීම සඳහා එය යොදාගනු ඇත.

විදුලි සංදේශ, රූපවාහිනී, ගුවන් විදුලි, තොරතුරු හා සන්නිවේදන පහසුකම් උතුරු පළාතේ ප්‍රජාවන්ට ලබාදීම සඳහා එය ප්‍රයෝජනවත් වනු ඇත.

### 6.4 ඇන්ටෙනා ව්‍යූහ (Antenna Structure) පිළිබඳ ප්‍රතිපත්තිය සහ ඉදිකිරීම හා නඩත්තුව පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම.



ඇන්ටෙනා ව්‍යූහ

විදුලි සංදේශ සේවාවන්ගේ ප්‍රවර්ධනයට අහිතකර සීමාවන් නොපැනවෙන අතර පරිසරය සුරැකීම හා මහජන යහපත සැලසීමේ පරමාර්ථයෙන් 2008 වසරේදී මෙම ක්‍රියාකාරකම ආරම්භ විය. මෙම පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා ඇන්ටෙනා ව්‍යුහයන්ට සම්බන්ධ ගැටළු පිළිබඳ සොයාබලා කටයුතු කිරීමට ශ්‍රී.ලං.වි.සං. කොමිෂන් සභාව තාක්ෂණික උපදේශක කමිටුවක් පත් කළේය. 2010 දී කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ අනුමත කළ අතර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ඉල්ලා සිටින ලදී.



දැනුවත් කිරීමේ වැඩසටහන්

### 6.5 විදුලි සංදේශ යටිතල ව්‍යුහ සංවර්ධන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතින් පිළිබඳව අවබෝධයක් නොමැතිකම හේතුකොට ගෙන බොහෝ අවස්ථාවලදී නොයෙකුත් සංවිධාන, සංවිධානාත්මක කණ්ඩායම් හා පුද්ගලයන් විදුලි සංදේශ යටිතල ව්‍යුහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිවලට එරෙහිව තම තැවුල් ඉදිරිපත් කරති.



2010 වසර තුළදී ජාල අංශය විසින් විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන්වල පරමාර්ථය වූයේ මහජනතාවගේ හා අනෙකුත් උනන්දුවක් ඇති පාර්ශවයන්ගේ අදහස් වලට සවන් දී, විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම හා සම්බන්ධ ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳව අධ්‍යාපනය ලබාදී ව්‍යාපෘති සඳහා ඔවුන්ගේ සහයෝගය ලබාගැනීම වේ. අවශ්‍ය අවස්ථාවන්හිදී අදාල ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රවීණයන් මෙම වැඩසටහන් සඳහා කැඳවාගෙන යනු ලැබිණ.

### 6.6 ජංගම දුරකථන ඇතුළු විදුලි සංදේශ උපකරණ නීත්‍යානුකූලව විකුණන ස්ථාන දිරිගැන්වීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන.

මීට ඉහත සටහන් කර ඇති පරිදි (2.6.1.4 බලන්න) විදුලි සංදේශ උපකරණ විකිණීමෙහි නිරතවිය හැකිවන්නේ බලපත්‍රලාභීන්ට පමණි. විදුලි සංදේශ උපකරණ නීත්‍යානුකූලව විකුණන ස්ථාන බලගැන්වීම/දිරිගැන්වීම ජාල අංශ ය මගින් අඛණ්ඩව කරගෙන යනු ලබන වැඩටසහනක් වන අතර 2010 වසරේදී මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා එය ඉදිරියට ගෙන යන ලදී.

### 6.7 නීත්‍යානුකූල නොවන කේබල් රූපවාහිනී සේවා පාලනය කිරීම

පනතේ 22 (ආ) (1) වගන්තිය ප්‍රකාරව, තත් කාර්යය සඳහා කොමිෂන් සභාවේ බලපත්‍රයක අධිකාරය යටතේ හැර කිසිම තැනැත්තෙකු යම් පරිශ්‍රයක කේබල් ඇදීමේ වැඩ නොකළ

යුතු වේ. 2010 වසරේදී ජාල අංශය පොලිසියේ සහාය ඇතිව දිවයින පුරා නීත්‍යානුකූල නොවන කේබල් රූපවාහිනී සේවා පාලනය කිරීමෙහි නිරත වූයේය.

### 6.8 කෙටි සංකේත වෙන්කර දීම

රාජ්‍ය සහ පුද්ගලික ආයතන කෙටි සංකේත වෙන්කර දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කරති. දුර්ලභ සම්පතක් වෙන්කර දීමේදි ඉතා සුපරීක්ෂාකාරී වියයුතු බැවින් එවැනි ඉල්ලීම් ලැබුණු විට ජාල අංශය අදාල ආයතන වලින් ව්‍යාපෘති යෝජනා ලබාගෙන එම යෝජනා ගැඹුරු ලෙස අධ්‍යයනය කරයි. අධ්‍යයනය නිම කිරීමෙන් පසු ජාල අංශය අදාල ඉල්ලීම පිළිබඳ කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කරයි. 2010 වසර තුළ නිකුත් කරනු ලැබූ කෙටි සංකේත 12 වගුවේ දැක්වේ.

වගුව 12
නිකුත් කල කෙටි සංකේත - 2010

| අංකය<br>මුල් අංක (19xx) | ආයතනය |
|---|---|
| 1901 | විදුලි හා බලශක්ති අමාත්‍යාංශය (පැමිණිලි සඳහා) |
| 1905 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
| 1908 | ජනාධිපති ලේකම් කාර්යාලය |
| 1910 | විදුලි හා බලශක්ති අමාත්‍යාංශය<br>(ලංකා විදුලි සමාගම LECO)<br>(විදුලි බලය බිඳවැටීම සඳහා) |
| 1933 | පොලිස් දෙපාර්තමේන්තුව<br>(රහස් පොලිසියේ මෙහෙයුම් ඒකකය) |
| 1970 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව |
| 1984 | ජාතික අන්තරාදායක ඖෂධ පාලක මණ්ඩලය |

7 පරිච්ඡේදය

# බලපත්‍ර පාලන අංශය

## 7.1 කාර්යයන්

- විදුලි සංදේශ පද්ධති බලපත්‍ර වලට අදාල කටයුතු කළමනාකරණය සහ බලපත්‍ර කොන්දේසි බලාත්මක කිරීම.
- අයදුම්පත් හා ආයෝජකයන්ගේ ව්‍යාපාර සැලසුම් තාක්ෂණික දෘෂ්ඨි කෝණයකින් ඇගයීම සහ අදාළ ආර්ථික, නෛතික හා පාරිභෝගික අංශ සම්බන්ධීකරණය
- බලපත්‍රලාභීන් විසින් බලපත්‍ර වල සඳහන් කොන්දේසි වලට තාක්ෂණික අනුකූලතාවය දක්වන බවට වගබලා ගැනීම.
- විදුලි සංදේශ සේවා සැපයීම සඳහා වූ නව අයදුම්පත් සම්බන්ධයෙන් රාමුව හා ක්‍රියාපටිපාටි පවත්වාගෙන යාම හා ක්‍රියාත්මක කිරීම.
- විදුලි සංදේශ කටයුතු, ප්‍රතිපත්ති හා නියාමන සම්බන්ධයෙන් ශ්‍රී.ලං.වි.සං. නි.කො. සභාවේ අනෙකුත් අංශ සමග සම්බන්ධීකරණය පැවැත්වීම.
- වෙළඳපොල ප්‍රවර්ධනය, ආර්ථික නියාමනය සහ අන්තර් සබඳතාව හා ප්‍රවේශය, ජාල සහ විශ්ව සේවා බැඳීම් ඇතුලත් (නමුත් මේ සඳහා සීමා නොවූ) ආරවුල් විසඳීම.
- නියාමන ක්ෂේත්‍රය විශ්ලේෂණය පිළිබඳ ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ අනෙකුත් අංශවලට උපදෙස් ලබාදීම, ඉතාමත් යෝග්‍ය නියාමන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට දායකත්වය ලබාදීම සහ නියාමන වාර්තා සමාලෝචනය කිරීම.

- තාක්ෂණික, නියාමන හා ප්‍රතිපත්ති විෂය ක්ෂේත්‍ර සම්බන්ධව අදහස් හා අත්දැකීම් හුවමාරු කරගැනීම පහසුකරලීම පිණිස අනෙකුත් අංශ සමග මනා සබඳතා ස්ථාපිත කර පවත්වාගෙන යාම.
- වෙනත් විදුලි සංදේශ නියාමන අධිකාරීවල විදුලි සංදේශ/තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රවනතා විශ්ලේෂණය කිරීම සහ කොමිෂන් සභාවේ අවධානය යොමුවිය යුතු නියාමන හා ප්‍රතිපත්ති ගැටළු හඳුනාගැනීම සහ සුදුසු නිර්දේශ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

## 7.2 කාර්ය සාධනය

### 7.2.1 විදුලි සංදේශ පද්ධති බලපත්‍ර නිකුත් කිරීම.

බලපත්‍ර පාලන අංශයෙහි එක් ප්‍රධාන කාර්යයක් වනුයේ අවශ්‍යතා සම්පූර්ණ කරන අය වෙත පද්ධති බලපත්‍ර නිකුත් කිරීම වේ. පනතේ 17 වැනි වගන්තිය යටතේ නිකුත් කර ඇති සමුච්චිත පද්ධති බලපත්‍ර සංඛ්‍යාව 13 වගුවේ දැක්වේ.

වගුව 13

2010 අවසාන වනවිට නිකුත් කර ඇති සමුච්චිත බලපත්‍ර සංඛ්‍යාව

| පනතේ 17 වැනි වගන්තිය යටතේ බලපත්‍ර ලත් සේවා වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාවර ප්‍රවේශ දූරකථන සේවාව | 4 |
| සෙලියුලර් ජංගම දූරකථන | 5 |
| දත්ත සන්නිවේදනය (පහසුකම් පාදක) | 6 |
| දත්ත සන්නිවේදනය (පහසුකම් පාදක නොවූ) සහ අන්තර්ජාල සේවා සැපයීම | 8 |
| ට්‍රන්ක් ජංගම ගුවන් විදුලි | 2 |
| පරිපථ කුලියට ගත් සැපයුම්කරුවන් | 1 |
| බලපත්‍ර ලත් පෙරගෙවුම් දූරකථන සේවා සැපයුම්කරුවන් | 1 |
| බාහිර දොරටු ක්‍රියාකරුවන් | 33 |
| නිවසට සෘජු චන්ද්‍රිකා විකාශන සේවාව | 2 |
| කේබල් රූපවාහිනී බෙදාහැරීම් ජාලය | 2 |
| මුළු ගණන | 64 |

**7.2.2. පෙරගෙවුම් දුරකථන බලපත්‍ර සැකසීම හා කෙටුම්පත් කිරීම.**

ශ්‍රී ලංකාව තුළ පොදු පෙරගෙවුම් දුරකථන සේවා සහ පෙරගෙවුම් ඇමතුම් පත්‍ර සේවා සැපයීම සඳහා විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට පනතේ 17 (2) වගන්තිය යටතේ 2005 දී තමා වෙත ප්‍රදානය කරන ලද ක්‍රියාකරු බලපත්‍රය අළුත් කර දෙන ලෙස ක්‍රියාකරුවකු (ට්‍රයිටෙල් සර්විසස් පුද්ගලික සමාගම) ඉල්ලා සිටියේය. බලපත්‍ර අංශය මෙම අයදුම්පත්‍රය පරික්ෂා කල අතර, 2006.03.10 දින අංක 1435/20 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද පනත යටතේ බලපත්‍ර අළුත් කිරීම හා විකරණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ සහ ක්‍රියාපටිපාටි ක්‍රියාකරු විසින් සපුරා ඇති බව නිරීක්ෂණය කළේය. ඒ අනුව 2010.09.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි තවත් අවුරුදු පහක කාලයක් සඳහා ක්‍රියාකරුට විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාකරවීමට බලපත්‍රයක් ලබාදීමට කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ කිරීමට අදහස් කරන බව මහජනතාවට දැනගැනීමට සැලැස්වීම පිණිස දැන්වීමක් ප්‍රසිද්ධ කරන ලද අතර, ක්‍රියාකරුට තවත් වසර පහක කාලයක් විදුලි සංදේශ පද්ධතිය ක්‍රියාකරවීම පිණිස ප්‍රදානය කිරීමට යෝජිත බලපත්‍රය සම්බන්ධයෙන් යම් කරුණු කියාපෑමක් හෝ විරෝධතා ඇතොත් ඒවා ඉදිරිපත් කරන ලෙසට ඉල්ලීමක් කරන ලදී. යෝජිත බලපත්‍රයේ කෙටුම්පතක් ද කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වන www.trc.gov.lk මගින් මහජනතාව වෙත ලබාදෙන ලදී.

**7.2.3 ජාතික කශේරු ජාල (NBN) ව්‍යාපෘතිය නිර්මාණය කිරීම, ප්‍රසම්පාදන ලේඛන පිළියෙල කිරීම සහ ජා.ක.ජා. බලපත්‍රය කෙටුම්පත් කිරීම.**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) ඊ ශ්‍රී ලංකා වැඩසටහන (e-sri lanka, එසේත් නොමැතිනම් ශ්‍රී ලංකාව තුල මතු පරම්පරා ජාල (NGN) භාවිතය වැනි වැඩසටහන් යටතේ ඇති ව්‍යාපෘති වල පුළුල් පරාස අවශ්‍යතා සපුරාලීම පිණිස ශ්‍රී.ලං.වි.සං.කො. සභාව දීප ව්‍යාප්ත තන්තු කශේරු ජාල ව්‍යාපෘතිය ආරම්භ කළේය. ජනගහනයේ සෑම කොටසකම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවේ සීඝ්‍ර වර්ධනයත් සමග නාගරික ප්‍රදේශ තුල පමණක් නොව ග්‍රාමීය සේවා ඌන ප්‍රදේශ තුළද විශ්වාසදායි අධිවේගී අන්තර්ජාලයට ඇති ප්‍රවේශයේ වැදගත්කම වැඩිවෙමින් පවතී. අවශ්‍ය ආයෝජන මට්ටම සැලකිය යුතු තරම් වැඩි කරවන ලක්ෂ්‍යයෙන් ලක්ෂ්‍යයට (point to point) ක්ෂුද්‍ර තරංග සබඳතා මත රඳා පැවතීමට සිදුවී ඇති ජංගම ක්‍රියාකරුවන්ට ජාතික කශේරු ජාලයක් නොමැතිවීම දැඩිලෙස බලපා තිබේ. සන්නිවේදන සේවාවන් දීප ව්‍යාප්තව පවතින බවට හා සාධාරණ ලෙස ව්‍යාප්ත වන බවට වගබලාගැනීමේ හා එම තත්වයන් වර්ධනය කිරීමේ වගකීම, ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමක වශයෙන් ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවට පැවරී තිබේ. අධ්‍යාපනයට, සෞඛ්‍යයට හා දුගීබව දුරලීයට ආධාර කිරීම පිණිස ග්‍රාමීය, සේවා ඌන ප්‍රදේශවලට තොරතුරු තාක්ෂණ සේවා ලබාදීම එහි විශේෂ අවධානයට යොමුවී ඇති එක් කරුණක් වේ. ජාතික කශේරු ජාල ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ සියළුම දිස්ත්‍රික්ක වල සෑම ඡන්ද කොට්ඨාශයකටම පුළුල් පරාස සම්බන්ධතාව ලබාදීම වේ. මෙම ව්‍යාපෘතිය නිර්මාණය කිරීම, ප්‍රසම්පාදන ලේඛන පිළියෙල කිරීම හා NBN බලපත්‍රය කෙටුම්පත් කිරීම යන කාර්යයන් සලකා බලනු ලබන කාල පරිච්ඡේදය තුලදී බලපත්‍ර පාලන අංශය විසින් ඉටුකර තිබේ.

**7.2.4. මතු පරම්පරා ජාල (NGN) යෝජනා ඇගයීම සහ (NGN) ප්‍රතිපත්තිය හා නියාමන රාමුව සම්පාදනය සඳහා නායකත්වය දීම.**

සියළුම සේවා මතු පරම්පරා ජාල තාක්ෂණය සඳහා උපකාර කිරීමට හැකියාව ඇති තනි පරිමාණානුකූල මතු පරම්පරා මධ්‍ය ජාලයක් මගින් සියළුම පැරණි මධ්‍ය ජාල ප්‍රතිස්ථාපනය කළ හැකිවේ. මතු පරම්පරා

ජාලයක් ක්‍රියාත්මක වීමත් සමග තනි මෙහෙයුම් කණ්ඩායමකට මුළු ජාලයම ක්‍රියාකරවීමට හා නඩත්තු කිරීමට හැකිවන බැවින් කාර්යාත්මක වියදම (Operational Expenditure) සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුකර ගැනීමට ක්‍රියාකරුවකුට හැකියාව ලැබේ. තව ද මතු පරම්පරා ජාලයෙහි භාවිතා කරනු ලබන්නේ අන්තර්ජාල මූල ලේඛය (Internet Protocol) ආකෘතිකව පාදක කරගත් තනි තාක්ෂණයක් වීම සහ ජාලයේ සියළුම උපකරණ එකම මාදිලියේ ඒවා වීම යන හේතූන් නිසා අනුපාතිකව ඉතුරුම් වැඩිවීමට සහ එමගින් ක්‍රියාකරුගේ ප්‍රාග්ධන වියදම අඩුවීමට මං සැලසේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ නියාමන ප්‍රතිසංස්කරණයේ දෙවන පියවර නිර්මාණය කර ක්‍රියාවට නැංවීමට හැකිවන පරිදි දැනුම (knowledge base) ක්‍රියාවට යෙදවීමේ හැකියාව (Implementation capacity) වර්ධනය කිරීම පිණිස ආයතනික සංවර්ධන පදනමෙන් ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවට ප්‍රදානයක් ලැබුණි. ඒ අනුව ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව මතු පරම්පරා ජාල සඳහා ප්‍රතිපත්තියක් සහ නියාමන රාමුවක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කළේය. මෙම කාර්යය සඳහා ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කොට උපදේශකයකුගේ සේවාව ගනු ලැබිණ.

මතු පරම්පරා ජාල සහ වෙනත් අළුත් සැසඳිය හැකි තාක්ෂණ වලට කාර්යක්ෂම ලෙස ආයෝජනය කිරීම පහසුකරලීම සහ පාරිභෝගික යහපත ආරක්ෂා කරමින් යටිතල ව්‍යූහ හා සේවා සැපයුම්කරුවන් අතර ඵලදායි තරගකාරීත්වයක් පවත්වාගැනීම සඳහා ප්‍රතිපත්ති හා නියාමන රාමුවක් ස්ථාපනය කිරීම උපදේශක සේවාව ලැබගැනීමේ සමස්ථ පරමාර්ථය විය. විශේෂිත වශයෙන් උපදේශකගෙන් පහත දැක්වෙන දෑ ඉටුකර ගැනීමට අදහස් කරන ලදී.

1. ජාත්‍යන්තර ක්‍රියා පිළිවෙලවල් හා අත්දැකීම් පදනම් කර ගනිමින්, එහෙත් ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ සිට ශ්‍රී ලංකාව සඳහා මතු පරම්පරා ජාල ප්‍රතිපත්තියක් හා නියාමන රාමුවක් සකස් කිරීම.
2. තොරතුරු විමසීමේ ලේඛනයක්, නිර්දේශ කෙටුම්පත් හා අවසාන නිර්දේශ සහ අවසන් වාර්තාව ආදී ලේඛන පිළියෙල කිරීම.
3. මෙම ලේඛන සකස් කිරීම පිළිබඳව උනන්දුවක් දක්වන සියළුම තැනැත්තන්ට දැනුම්දීම පිණිස විස්තීරණ තොරතුරු විමසීමේ ක්‍රියාවලියක් භාවිතා කිරීම.
4. මතු පරම්පරා ජාල ප්‍රතිපත්තිය හා නියාමන රාමුව නිර්මාණය කිරීමේ අරමුණ ඉටුකරගැනීමට ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවට සහාය වීම පිණිස කරුණු ඉදිරිපත් කිරීම (Presentation) හා වෙනත් සම්බන්ධිත උපකාරී ලේඛන ඉදිරිපත් කිරීම.

අන්තර්ජාල මූල ලේඛ පාදක කරගත් මධ්‍ය ජාල වලට සම්බන්ධ ගැටළු සහ අවසානයේදී ප්‍රයෝජන ලබන්නන් මතු පරම්පරා ජාල වලට සම්බන්ධ කරනු ලබන අන්තර්ජාල මූල ලේඛ පාදක කරගත් මතු පරම්පරා ප්‍රවේශ ජාල ආශ්‍රිත ගැටළු පිළිබඳව සලකා බැලීමද උපදේශක විසින් කල යුතු විය.

තොරතුරු විමසුම් ලේඛනය සකස් කර අවසන් කරනු ලැබූ අතර ශ්‍රී ලංකාවේ සියළුම ප්‍රධාන විදුලි සංදේශ පාර්ශවයන් වෙත 2010 සැප්තැම්බර් මාසයේදී "මතු පරම්පරා ජාල සඳහා ප්‍රතිපත්ති හා නියාමන රාමුව" පිළිබඳ උපදේශන පත්‍රිකාව නිකුත් කරන ලදී. උපදේශනයේ අභිමතාර්ථ හතරක් විය.

- මතු පරම්පරා ජාල පිළිබඳව සහ මෙම භාවිතයෙන් ලබාදිය හැකි සේවාවන් පිළිබඳ සාමාන්‍ය හැඳින්වීමක් කිරීම.
- ශ්‍රී ලංකාව තුල මතු පරම්පරා ජාල සහ අනුරූප සේවාවන් හඳුන්වාදීමෙන් අත්වන වාසි පිළිබඳ පැහැදිලි කිරීම.
- ශ්‍රී ලංකා පාරිභෝගිකයින්ගේ සුභසිද්ධිය ආරක්ෂා කරමින් මතු පරම්පරා ජාල වලට සංක්‍රමණය වීම සහ ඒවා උපයෝගී කර

ගැනීමේදී විසඳාගැනීමට සිදුවිය හැකි ප්‍රධාන තාක්ෂණික, ආර්ථික හා නියාමන ගැටළු පිළිබඳව තරමක ගැඹුරු අවබෝධයක් ලබාදීම.

- මතු පරම්පරා ජාල ප්‍රතිපත්ති සහ නියාමන රාමුව සම්පාදනය පිණිස මෙම කාරණය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශව වල අදහස් උදහස් ලබාගැනීම.

පහත සඳහන් කර ඇති පාර්ශව වලින් ශ්‍රී.ලං.වි.සං.කො.සභාව වෙත ප්‍රතිචාර ලැබුණි.

- ඩයලොග්
- එමිරේට් විදුලි සංදේශ සංස්ථාව (එටිසලාට්)
- හුආවි ටෙක්නොලොජීස්
- හච් 3ජී
- මොබිටෙල්
- ශ්‍රී ලංකා ටෙලිකොම්
- ට්‍රයිටෙල්

උපදේශනයෙන් පසු බලපත්‍ර පාලන අංශය නියාමන රාමුව කෙටුම්පත් කිරීම ආරම්භ කළේය.

**7.2.5 ජංගම දුරකථන අංක හුවමාරු කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන ලේඛනයට පිරිවිතර සකස් කිරීම**

ජංගම දුරකථන අංක හුවමාරුව නිර්මාණය කර ක්‍රියාවට නැංවීමට හැකිවන පරිදි ඥාන සම්භාරය හා ක්‍රියාත්මක කිරීමේ හැකියාව වර්ධනය කරනු පිණිස ලෝක බැංකුවේ ආයතනික සංවර්ධන අරමුදලෙන් ශ්‍රී ලංකා විදුල සංදේශ කොමිෂන් සභාව මූල්‍යාධාර ලබාගත්තේය. ජංගම අංක හුවමාරුව මගින් ග්‍රාහකයන් එක් සේවා සැපයුම්කරුවෙකුගෙන් තවත් සැපයුම්කරුවෙකු මාරුවන විට ඔවුන්ට දැනට තිබෙන ජංගම අංක රඳවාගෙන සිටීමට අවස්ථාව ලැබේ. පාරිභෝගිකයන්ට සපයනු ලබන සේවාවේ ගුණාත්මක බව වැඩිදියුණු කරන අතර පිරිවැය ඵලදායි කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණ පෙරදැරි කරගෙන ජංගම සේවා සැපයුම්කරුවන්ගේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම මගින් ඔවුන් අතර තරගකාරීත්වය වැඩි කිරීමට මෙම පහසුකම ඉවහල් වන බව සැලකේ.

ශ්‍රී ලංකාව තුල ජංගම අංක හුවමාරුව භාවිතා කිරීම සම්බන්ධව අදාල සියළු පාර්ශවයන්ගේ අදහස් ලබාගැනීමට උපදේශන පත්‍රයක් (පත්‍ර) කෙටුම්පත් කිරීම සහ හුවමාරු සේවා සැපයුම්කරුවකුගේ සේවය ලබාගැනීමේ ක්‍රමවේදය පිළිබඳ සවිස්තර වාර්තාවක් සකස් කිරීම, ජංගම අංක හුවමාරුව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ සහ නියාමන රාමුව සකස් කිරීම හා මෙම ක්‍රමය ඉතාමත් පිරිවැය ඵලදායි ක්‍රමයකින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පද්ධතිය ප්‍රසම්පාදනය කිරීම පිණිස නිර්දේශ සහ අදාල ලේඛන සැපයීම සඳහා උපදේශක සමාගමක සේවය ලබාගැනීමට ශ්‍රී.ලං.වි.සං.කො.සභාව පියවර ගත්තේය. තෝරාගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් පසු ශ්‍රී.ලං.වි.සං.කො. සභාව තෝරාගත් ලංසුකරුට අභිප්‍රාය ලිපිය (Letter of intent) නිකුත් කළේය.

**7.2.6 ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ජා.වි.සං.සං) කවුන්සිලයෙහි අසුනක් සඳහා ශ්‍රී ලංකා අපේක්ෂකත්වයට අනුබල දීම සහ ඒ සම්බන්ධයෙන් එම සංගමයේ සාමාජික රටවල් 180 සමග සම්බන්ධීකරණය පැවැත්වීම.**

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ කවුන්සිලය සාමාජිකයන් 48 දෙනෙකුගෙන් සමන්විත වන අතර එහි අසුනක් ලබාගැනීම ජාතික මට්ටමින් බැලීමේදී වාසිදායක වේ. එබැවින් 2010 වසරේදී කවුන්සලයේ අසුනක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් සාමාජික රටවල් 180 ක් සමග ශ්‍රී.ලං.වි.සං.කො.සභාව සම්බන්ධීකරණය පැවැත්වූයේය.

**7.2.7 ක්‍රියාකරු බලපත්‍ර (පද්ධති බලපත්‍ර) තුලින් එදිනෙදා උද්ගතවන ගැටළු පිළිබඳව ක්‍රියාකිරීම සහ අනෙකුත් අංශවලට තාක්ෂණික සහ නියාමන යෙදවුම් ලබාදීමට බලපත්‍ර පාලන අංශයෙන් සිදුවිය.**

8 පරිච්ඡේදය

# පාලන සහ මානව සම්පත් අංශය

## 8.1 කාර්යයන්

- ස්ථිර කිරීම්, උසස් කිරීම්, නිවාඩු වාර්තා, පැමිණීම සහ විනය පරීක්ෂණ ආදිය ඇතුලත්ව කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගේ පුද්ගලික ලිපි ගොණු පවත්වා ගෙන යාම.
- නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.
- අදාල ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විමසමින්, සෑම තනතුරක් සඳහාම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා සේවා සැලැස්ම සකස් කිරීම.
- ජ්‍යෙෂ්ඨ කාර්යභාර ප්‍රධානීන් සමග එක්ව මානව සම්පත් සංවර්ධන අයවැය සකස් කිරීම.
- වාර්ෂික කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන සකස් කිරීම.
- දේශීය සහ විදේශීය පුද්ගලයන් සඳහා වූ පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය සහ පුහුණු ලාභීන් සඳහා ගමන් බිමන්, ලියාපදිංචි කිරීම් සහ අනෙකුත් කටයුතු ඉටුකිරීම.
- කාර්ය මණ්ඩලයට සුභසාධන සේවා සැපයීම සඳහා සුභ සාධන කටයුතු සම්බන්ධීකරණය, දුක් ගැනවිලි පිළිබඳ ක්‍රියා කිරීම් සහ මූල්‍ය සහ මූල්‍ය නොවන දිරිගැන්වීමේ පැකේජ ලබාදීමට උපදෙස් දීම.
- සේවකයන් සඳහා වන සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය පරිපාලනය.
- රැකියා බද්ධ සෞඛ්‍ය සහ ආරක්ෂක අවශ්‍යතා සැපයෙන් බවට වගබලා ගැනීම.

- රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ වැටුප් හා සේවක සංඛ්‍යාව කමිටුව සමග සන්නිවේදන කටයුතු.
- ආරක්ෂක සේවාව, පවිත්‍රතා සේවාව, ගොඩනැගිලි නඩත්තුව සහ අළුත්වැඩියා කිරිම සහ යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීමට සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය.
- විදුලිය, ජලය සහ දුරකථන සේවා කාර්යක්ෂමව සැපයෙන බවට වගබලා ගැනීම.
- වාහන පද්ධතිය නඩත්තු කිරීම.
- වාර්ෂික දැයට කිරුළ ප්‍රදර්ශනයට සහභාගීවීමේදී අදාල සියළු කටයුතු සම්බන්ධීකරණය.
- ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ අනෙකුත් අංශවල වැඩ කටයුතු කරගෙන යාමට අවශ්‍යවන දෑ ලබාදීම.
- ගෙවීම් අනුමත කිරීම්, අඩුපාඩු හඳුනා ගැනීම සහ සුදුසු ක්‍රියාපටිපාටි හඳුන්වාදිම.

## 8.2 කාර්ය සාධනය

### 8.2.1 ආයතනික වැඩ කටයුතු

2010 වසර තුලදී ශ්‍රී.ලං.වි.කො.සභාවේ සේවක සංඛ්‍යාව සේවා කාණ්ඩ හතළිස් නවයකින් (49) සමන්විත වූ අතර ස්ථිර සේවකයින් එකසිය අසූ හත් (187) දෙනෙකු හා කොන්ත්‍රාත් සේවකයින් පස් (5) දෙනෙකු සිටි අතර පුරප්පාඩු හැත්තෑ දෙකක් (72) පැවතුණි. පාලන අංශය මගින් පුද්ගලික ලිපි ගොනු පවත්වා ගෙන යෑම, බඳවා ගැනීම්, ස්ථිර කිරීම්, උසස් කිරීම්, නිවාඩු ලේඛන, පැමිණීම, විනය පරික්ෂණ වැනි සේවකයන්ගේ ආයතනික කටයුතු ඉටු කෙරිණ. වාහන මිලදී ගැනීමට අවසර ලබාගැනීම, සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීම, බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපටිපාටි පිළියලෙ කිරිම වැනි කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය / ව්‍යවසාය දෙපාර්තමේන්තුව, කළමනාකරන දෙපාර්තමේන්තුව සහ වැටුප් හා සේවක සංඛ්‍යාව කමිටුව වැනි ආයතන සමග ගණුදෙනු කරනු ලැබීය.

### 8.2.2 පුහුණු කිරීම්

කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය කිරීම, නිපුනතා වර්ධනය කිරීම හා ආකල්ප වෙනස් කිරිම සඳහා විදුලි සංදේශ කොමිෂන් සභාව දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථා සේවකයන්ට ලබාදීමට කටයුතු කළේය. 2010 වසර තුල පුහුණු වැඩසටහන්/ ශිෂ්‍යත්ව/ සම්මන්ත්‍රණ වලට අදාල තොරතුරු 14 වන වගුවේ දැක්වේ.

වගුව 14

ශ්‍රී.ලං.වි.කො.සභාවේ කාර්ය මණ්ඩය පුහුණු වැඩසටහන්/ශිෂ්‍යත්ව/සම්මන්ත්‍රණ වලට සහභාගිවීම් 2010

විදේශීය පුහුණු වැඩසටහන්

| විෂය/පුහුණුවේ/ශිෂ්‍යත්වයේ/සම්මන්ත්‍රණයේ විෂය පථය | රට | කාලසීමාව සිට | කාලසීමාව දක්වා |
|---|---|---|---|
| 2010 ලෝක විදුලි සංදේශ සංවර්ධන සම්මන්ත්‍රණය සඳහා ප්‍රාරම්භක රැස්වීම | තායිලන්තය | 3/16/2010 | 3/19/2010 |
| ජා.වි.සං.සං(ITU) 17 වැනි අධ්‍යයන කණ්ඩායම | ස්විට්සර්ලන්තය | 4/7/2010 | 4/16/2010 |
| "සම්බන්ධතා හැකියාව හා අභිසරණය පිළිබඳ විධායක පාඨමාලාවඃ විකල්ප නියාමන ක්‍රමෝපායන් | දකුණු අප්‍රිකාව | 4/12/2010 | 4/16/2010 |

| | | | |
|---|---|---|---|
| කවුන්සලයේ 2010 සැසිය | ස්විට්සර්ලන්තය | 4/13/2010 | 4/22/2010 |
| SAFIR 16 වන මෙහෙයුම් කමිටුව | ඉන්දියාව | 4/26/2010 | 4/30/2010 |
| ජා.වි.සං.සං. (ITU) - සුවිශේෂ අධ්‍යයන කණ්ඩායම 5C | ස්විට්සර්ලන්තය | 5/10/2010 | 5/20/2010 |
| ලෝක විදුලි සංදේශ සංවර්ධන සමුළුව | ඉන්දියාව | 5/24/2010 | 6/4/2010 |
| වර්ණාවලි/කක්ෂ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම පිළිබඳ වැඩමුළුව | සිංගප්පූරුව | 6/16/2010 | 6/17/2010 |
| සුවිශේෂ අධ්‍යයන කණ්ඩායම 1E සහ 4C | ස්විට්සර්ලන්තය | 6/21/2010 | 7/6/2010 |
| සුවිශේෂ අධ්‍යයන කණ්ඩායම 1B | ස්විට්සර්ලන්තය | 6/21/2010 | 6/28/2010 |
| ජ.වි.සං. සංගමයේ නිල යෝජිත සමුළුව 2010 සඳහා තෙවන ආසියා ප්‍රජාවගේ ප්‍රාරම්භක රැස්වීම | ඔස්ට්‍රේලියාව | 6/22/2010 | 6/25/2010 |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාවේ ප්‍රමිතිකරණ වැඩසටහන් සංසදය | තායිලන්තය | 7/5/2010 | 7/9/2010 |
| වර්ණාවලිය පිළිබඳ දකුණු ආසියාතික විදුලි සංදේශ නියාමකයන්ගේ කවුන්සලයේ වැඩ කණ්ඩායමේ පළමු රැස්වීම | ඉරානය | 7/7/2010 | 7/8/2010 |
| විදුලි සංදේශ වෙළඳ නීති පිළිබඳ (APT) වැඩමුළුව (APT) ප්‍රතිපත්ති සහ නියාමන සංසදය සහ ව්‍යාපාර සංවාදය | ඉන්දුනීසියාව | 7/12/2010 | 7/16/2010 |
| වාර්ෂික වර්ණාවලි කළමණාකරණ සමුළුව | අමෙරිකා එක්සත් ජනපදය | 7/19/2010 | 7/23/2010 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණයට ප්‍රවේශ වීමේ හැකියාව පිළිබඳ වැඩමුළුව, ලෝක අන්තර්ජාතික ප්‍රදර්ශනය 2010 | චීනය | 7/21/2010 | 7/24/2010 |
| හදිසි ආපදා කළමනාකරණය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාවගේ වැඩමුළුව හදිසි අවස්ථා සන්නිවේදනය සහ අනතුරු ඇඟවීමේ පද්ධතිය | ඔස්ට්‍රේලියාව | 7/21/2010 | 7/23/2010 |
| පොදු රාජ්‍ය මණ්ඩල විදුලි සංදේශ සංවිධානයේ විධායක කමිටු රැස්වීම | එක්සත් රාජධානිය | 7/22/2010 | 7/23/2010 |
| IP3 නියාමන බලපෑම් විශ්ලේෂණය පිළිබඳ වැඩමුළුව | අමෙරිකා එක්සත් ජනපදය | 8/9/2010 | 8/20/2010 |
| ප්‍රතිපත්ති සහ නියාමන පිළිබඳ දකුණු ආසියාතික නියාමකයන්ගේ කවුන්සිලයේ වැඩමුළුව | ඉන්දියාව | 8/9/2010 | 8/10/2010 |
| කොළඹ ඉදිකිරීමට යෝජිත රූපවාහිනී කුළුණ සම්බන්ධයෙන් නිල පිරික්සුමක් සඳහා චීනයට යාම | චීනය | 8/11/2010 | 8/17/2010 |

| | | | |
|---|---|---|---|
| විදුලි සංදේශ සංවිධාන සඳහා මානව සම්පත් කළමනාකරණ කුසලතා සංවර්ධනය කිරීමේ වැඩමුළුව | තායිලන්තය | 8/17/2010 | 8/19/2010 |
| වර්ණාවලි කළමනාකරණය පිළිබඳ දකුණු ආසියාතික විදුලි සංදේශ නියාමකයන්ගේ කවුන්සිලයේ වැඩමුළුව | නේපාලය | 8/19/2010 | 8/20/2010 |
| 2010 ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ නිල නියෝජිත සමුළුව සඳහා ආසියා හා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාවගේ 4 වන ප්‍රාරම්භක රැස්වීම | තායිලන්තය | 8/23/2010 | 8/24/2010 |
| පුළුල් පරාස ප්‍රවේශ ජාලය/ප්‍රකාශ ප්‍රවේශ සහ WIMAX | ජපානය | 9/7/2010 | 9/17/2010 |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාවගේ ගුවන් විදුලි සංසදයේ නව වන රැස්වීම | කොරියාව | 9/13/2010 | 9/16/2010 |
| 1C වැඩ කණ්ඩායම් රැස්වීම - වර්ණාවලි අධීක්ෂණය | නෙදර්ලන්තය | 9/13/2010 | 9/16/2010 |
| "රාජ්‍ය සහ ව්‍යාපාර වගකීම්" පිළිබඳ ජාත්‍යන්තර නිල නියෝජිත නායකත්ව වැඩසටහන | අමෙරිකා එක්සත් ජනපදය | 9/20/2010 | 10/9/2010 |
| පරිගණක ජාල සහ කළමනාකරණ පිළිබඳ පුහුණුව | චීනය | 9/20/2010 | 9/28/2010 |
| රජය විසින් අන්තර්ජලය භාවිතය (e-Government) අන්තර්ජාල යෙදුම් පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාවගේ රැස්වීම | තායිලන්තය | 9/28/2010 | 9/30/2010 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ නිල නියෝජිත සමුළුව | මෙක්සිකෝව | 10/4/2010 | 10/22/2010 |
| "ජාත්‍යන්තර රෝමින් සහ ජාත්‍යන්තර ට්‍රැෆික් ටර්මිනේෂන්" පිළිබඳ පුහුණුව | තායිලන්තය | 10/5/2010 | 10/8/2010 |
| මතු පරම්පරා ජාලය හා එහි ප්‍රමිතිකරණය | ජපානය | 10/6/2010 | 10/13/2010 |
| "මතු පරම්පරා ජාල වල සංක්‍රමණ ක්‍රමෝපායන්" පිළිබඳ පුහුණුව | ඉරානය | 10/11/2010 | 10/14/2010 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ නිල නියෝජිත සමුළුව 2010 | මෙක්සිකෝව | 10/13/2010 | 10/22/2010 |
| ප්‍රජානන් ගුවන් විදුලි තාක්ෂණය පිළිබඳ පුහුණුව | තායිලන්තය | 10/18/2010 | 10/22/2010 |
| රාජ්‍ය සේවා පිළිබඳ සිද්ධි අධ්‍යයනය සහ ග්‍රාමීය ප්‍රදේශවල සමාජ ගැටළු විසඳීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පුහුණුව | ජපානය | 10/19/2010 | 10/29/2010 |
| චන්ද්‍රිකා සන්නිවේදනය පිළිබඳ පුහුණුව | ඉන්දියාව | 10/25/2010 | 10/29/2010 |
| 5B වැඩ කණ්ඩායම සහ අධ්‍යයන කණ්ඩායම 5 | ස්විට්සර්ලන්තය | 11/8/2010 | 11/23/2010 |
| 5C වැඩ කණ්ඩායම සහ 5 අධ්‍යයන කණ්ඩායමේ රැස්වීම | ස්විට්සර්ලන්තය | 11/9/2010 | 11/23/2010 |

| | | | |
|---|---|---|---|
| ගුවන් විදුලි මධ්‍යස්ථාන කළමනාකරණය සහ ගුවන් විදුලි උපකරණ සහතික කිරීම | ජපානය | 11/9/2010 | 11/17/2010 |
| 2 අධ්‍යයන කණ්ඩායමේ රැස්වීම | ස්විට්සර්ලන්තය | 11/9/2010 | 11/18/2010 |
| ආසියා ශාන්තිකර කලාප සඳහා 3G ජාල පිරිවැය ආකෘතිය සැකසීම | තායිලන්තය | 11/15/2010 | 11/19/2010 |
| වර්ණාවලි කළමනාකරණ සහ ප්‍රතිපත්තිය | කොරියාව | 11/23/2010 | 11/29/2010 |
| 5 අධ්‍යයන කණ්ඩායමේ රැස්වීම | ස්විට්සර්ලන්තය | 11/23/2010 | 12/1/2010 |
| මතු පරම්පරා ජංගම සන්නිවේදන පද්ධතිය සඳහා ක්‍රියාමාර්ග | ජපානය | 11/30/2010 | 12/8/2010 |
| මානව හැකියාවන් වර්ධනය, පුළුල් පරාස ආර්ථිකයක් සඳහා හැකියා වර්ධනය පිළිබඳ සංසදය | කොරියාව | 11/30/2010 | 12/2/2010 |
| ACMA/ITU ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් | ඕස්ට්‍රේලියාව | 12/6/2010 | 12/10/2010 |
| WRC 2010 සඳහා 4 වන ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාවේ ප්‍රාරම්භක කණ්ඩායමේ රැස්වීම | හොංකොං | 12/13/2010 | 12/18/2010 |
| ග්‍රාමීය සන්නිවේදනය පිළිබඳ පුහුණුව | ඉන්දියාව | 12/13/2010 | 12/17/2010 |

## දේශීය පුහුණු වැඩසටහන්

| වැඩසටහන | කාල පරිච්ඡේදය සහ ස්ථානය | ගාස්තුව |
|---|---|---|
| ප්‍රවාහන කළමනාකරණ පිළිබඳ වැඩමුළුව | 26/02/2010 ICTAD | Rs. 2,500.00 |
| ජාත්‍යන්තර සංස්ථාපිත නීති සම්මන්ත්‍රණය | මාර්තු 18-19, 2010 කොළඹ හිල්ටන් හෝටලය | Rs. 11,950.00 |
| අතිකාල සහ ගමන් වියදම් පිළිබඳ පුහුණුව | 18 අගෝස්තු 2010 GAF | Rs. 2,500.00 |
| 2 CMA ගෝලීය කළමනාකරණය තිරසාර ව්‍යාපාර සඳහා සහතික ලත් කළමනාකරණ ගණකාධිකරණය (CMA) පිළිබඳ ගිණුම්කරණ සමුළුව | 2010 ජූනි 29,30 සහ ජූලි 01 සිනමන් ලේක්සයිඩ් හෝටලය | Rs. 12,000.00 |
| ශ්‍රී ලංකා පුහුණු හා සංවර්ධන ආයතනයේ (SLIDA) 6 වන ජාතික සම්මේලනය | 2010 මැයි 21 සිනමන් ලේක්සයිඩ් හෝටලය | Rs. 4,500.00 |
| ප්‍රතිඵල පාදක ව්‍යාපෘති කළමනාකරණය | 2010 අගෝස්තු 05,06 ශ්‍රම අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය | Rs. 3,720.00 |

| | | |
|---|---|---|
| PRINCE 2 - ව්‍යාපෘති කළමණාකරන ක්‍රමවේදය | 2010 ජූලි 30,31 සහ අගෝස්තු 01, වෘත්තිය සහ නිපුණතා සංවර්ධන ආයතනය | Rs. 34,500.00 + Exam Fee |
| දැනුම බෙදා හදා ගැනීමේ සම්මන්ත්‍රණ සහ වැඩමුළුව | 2010 ජූලි 21 කර්මාන්ත තාක්ෂණ ආයතනය | Rs. 4,500.00 |
| පුස්තකාල සහ තොරතුරු විද්‍යා ඩිප්ලෝමාව | 2010/2011 පුස්තකාල සංගමය | Rs. 12,000.00 |
| කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 2010/2011 ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | Rs. 187,500.00 |
| තොරතුරු තාක්ෂණ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 2010/2011 ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය | Rs. 116,437.50 |
| 28 වන ජාතික තොරතුරු තාක්ෂණ සමුළුව | 2011 අගෝස්තු 11 ගලධාරි හෝටලය | Rs. 8,500.00+ VAT |
| "විද්‍යුත් පණිවිඩ හුවමාරු 2010 - නව ප්‍රතිශෝධන රීති | 2010 නොවැම්බර් 24 ගෝල් ෆේස් හෝටලය | Rs. 8,075.20 |
| 31 වන ජාතික සමුළුව | 2010 ඔක්තෝබර් 28-30 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය | Rs. 14,000.00 |
| කළමනාකරණ ශාස්ත්‍රවේදී උපාධිය | 2010/2011 විවෘත විශ්ව විද්‍යාලය | Rs. 75,000.00 |
| ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති උපාධිය | 2010/2011 කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය | Rs. 262,500.00 |
| අන්තර්ජාල සුරක්ෂිතතාව පිළිබඳ සම්මන්ත්‍රණය | 2010 නොවැම්බර් 23 සහ 27 සිනමන් ලේක්සයිඩ් හෝටලය | Rs. 27,000.00 |
| අයවැය පිළිබඳ සම්මන්ත්‍රණය | 2010 නොවැම්බර් 24 වෝටර්ස් ඒජ් හෝටලය | Rs. 2,000.00 |

### 8.2.3 සේවා සැපයිමට සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය

ආරක්ෂක සේවය, පවිත්‍රතා සේවය, උපදේශක සේවය වැනි සේවාවන් සැපයිමට අදාල සියළු ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය පාලන අංශය මගින් ඉටු කරන ලදි. මෙම ක්‍රියාකාරකම් වලට ලංසු ලේඛන පිළියෙල කිරීම, දැන්වීම් පල කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටු (තා.ඇ.ක.) පත්කිරීම, වාර්තා සකස් කිරීම, අවශ්‍ය අනුමැතීන් ලබාගැනිම සඳහා වාර්තා ඉදිරිපත් කිරීම, තෝරාගත් පාර්ශවයන්ට තීරණ දැනුම්දීම, අවශ්‍ය අවස්ථාවලදී නීති අංශයේ සහයෝගය ඇතිව සේවා ගිවිසුම් සකස් කිරීම සහ සේවා සැපයුම්කරුවන්ගේ වැඩ අධීක්ෂණය සහ සේවා ගිවිසුම් වලින් අපගනය වූ අවස්ථා දක්නට ලැබුන විට ඒවා නිවැරදි කිරීමට පියවර ගැනීම ඇතුළත් විය. ගොඩනැගිලි නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම, යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම සහ ඒවා නඩත්තු කිරීම වැනි කටයුතු වලදීද ඉහත සඳහන් ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කරනලදී.

කාර්යාල වේලාවන් තුලදී මෙන්ම කාර්යාල වේලාවෙන් බැහැර අවස්ථා වලදීද විදුලි

සැපයුම සහ දුරකථන සේවා බිඳ වැටුන අවස්ථාවලදී වහාම අදාල ආයතන වලට දැනුම් දී එම සේවා යථා තත්වයට පමුණුවාලීමට වග බලා ගන්නා ලදී.

ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවේ සියළු අංශ/ඒකක වලට තම වැඩ කටයුතු කිසිදු අවහිරතාවයකින් තොරව කරගෙන යාම සඳහා ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ, යන්ත්‍ර වැනි දෑ කලට වේලාවට සැපයීමට පාලන අංශය වගබලා ගත්තේය.

ඉහත ක්‍රියාකාරකම් වල ප්‍රධාන පරමාර්ථය වූයේ ආයතනයේ වැඩ කටයුතු මැනවින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සේවා සහ ද්‍රව්‍ය නිසි කලට පාරදෘශ්‍ය, පිරිවැය ඵලදායි හා සාධාරණ ලෙස සැපයීම විය.

### 8.2.4 වාහන පද්ධතිය නඩත්තු කිරීම

ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ වාහන පද්ධතිය කාර් දහනවකින්, ඩබල් කැබ් රථ තුනකින්, ජීප් තුනකින් වෑන් පහකින්, එක් බසයකින්, ලොරි හතරකින් හා එක් ත්‍රීවිල් රථයකින් සමන්විත විය. බස්රථය චාරිකා, ප්‍රදර්ශන වැඩ කටයුතු සඳහා නිලධාරී ප්‍රවාහනය කාර්ය මණ්ඩලයේ සුභ සාධන කටයුතු වැනි කාර්යයන්ට යොදවන ලදී. වාහන කිහිපයක්, වාහනයට හිමිකම් තිබෙන නිලධාරීන්ට වෙන් කරනු ලැබූ අතර, ඉතිරි වාහන පරීක්ෂණ චාරිකා, රැස්වීම්/වැඩමුළු/සම්මන්ත්‍රණ ආදියට සහභාගීවීම, ප්‍රදර්ශන සංවිධානය, තැපෑල රැගෙන ඒම, කාර්යාල ලිපි අතින් බෙදීම වැනි කටයුතු සඳහා භාවිතා කරන ලදි. වාහන පද්ධතිය අළුත්වැඩියා කිරීම්, ටයර සහ බැටරි ප්‍රතිස්ථාපනය කිරීම සඳහා 2010 වසර තුළදී රුපියල් මිලියන 9.4 ක මුදලක් වැයකරන ලදී.

### 8.2.5 දැයට කිරුළ ප්‍රදර්ශනයේ වැඩ කටයුතු සම්බන්ධීකරණය

දැයට කිරුළ ප්‍රදර්ශනය රජයේ වාර්ෂික වැඩසටහනක් වන අතර රාජ්‍ය අංශයේ මෙන්ම පුද්ගලික අංශයේ ආයතනද එයට සහභාගී වේ. 2010 වසරේ ප්‍රදර්ශනය මහනුවර දිස්ත්‍රික්කයේ පල්ලේකැලේ පැවැත්වුන අතර ශ්‍රී.ලං.වි.සං.නි.සභාවේ කුටිය සංවිධානය කිරීමේදී පාලන අංශය නායකත්වය දැරිය. කුටිය සංවිධානය කිරීමේදී ශ්‍රී.ලං.වි.සං. කො.සභාවේ අනෙකුත් අංශ පාලන අංශයට සහය විය. පාලන අංශය ප්‍රදර්ශන සංවිධාන කමිටුව සමග සම්බන්ධීකරණය වී ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවේ කුටිය සඳහා සුදුසු ප්‍රදේශයක් ප්‍රදර්ශන භූමියෙන් ලබා ගත්තේය. කුටිය වෙත ප්‍රදර්ශන භාණ්ඩ ප්‍රවාහනය සඳහා වැඩපිළිවෙල යොදනු ලැබීය. ප්‍රදර්ශන කුටියේ වැඩ කටයුතු සඳහා නතරවීමට සිදුවූ නිළධාරීන්ට නවාතැන් පහසුකම් සැලසීමටද කටයුතු කරන ලදී. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ අළුත්ම සංවර්ධන අවස්ථාවන් කුටියෙහි ප්‍රදර්ශනය කළ අතර, ප්‍රදර්ශන කාලය තුළ පාසල් සිසුන් ඇතුළුව දහස් ගණන්ක කුටිය නැරඹීමට පැමිණියහ.

### 8.2.6 සුභ සාධන කටයුතු

සලකා බලනු ලබන කාල පරිච්ඡේදය තුල පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඉටුකරන ලදී.

i. ජෙට් ලයිනර් නෞකාවේ කාර්ය මණ්ඩල පවුල් දිනය පවත්වන ලදී.

ii. ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ ක්‍රීඩා සමාජයේ සහාය ඇතිව ක්‍රීඩා තරගයක් පවත්වන ලදී.

iii. කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ඥාතීන් අභාවයට පත්වූ අවස්ථා වල මුදල් ආධාර ලබා දෙන ලදී.

iv. සුභ සාධන කමිටුව විසින් සුභ සාධන වෙළෙඳ සැලක් පවත්වාගෙන යන ලදී.

## කාර්ය මණ්ඩල පවුල් දිනය

මෙය 2010 දෙසැම්බර් 20 දින පැවැත් වූ එක් දින වැඩසටහනකි. කාර්ය මණ්ඩලයේ පවුලේ සාමාජිකයින් ජෙට් ලයිනර් නෞකාවට එක් රැස් වූ අතර කෙටි මුහුදු ගමනක නිරත විය. වැඩසටහනේ අරමුණ වූයේ විනෝද වීම හා කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර පමණක් නොව ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් සමග ද සුහදතාවය ඇති කිරිමයි.



ජෙට් ලයිනර් නෞකාවේ එක් රැස් වූ පවුල් සාමාජිකයන්

## ක්‍රීඩා තරගය

ක්‍රීඩා තරගය 2010 අගෝස්තු 8 වන දින පවත්වන ලදී. කාර්ය මණ්ඩලයේ ඉහල සිට පහල දක්වා වූ සියළු දෙනාම නිවාස තුනකට එනම් පරාක්‍රම, විජය, ගැමුණු යන නිවාස තුනට බෙදන ලද අතර, ඔව්හු ගෘහස්ථ ක්‍රීඩා, එළිමහන් ක්‍රීඩා, ධාවන හා පිටි ඉසව් ගණනාවකටම උද්‍යෝගශීලිව සහභාගී වූහ. ක්‍රීඩා තරගය නිසා කාර්ය මණ්ඩලයට කාර්යාල වැඩ කටයුතු වලින් ඉවත් වී සිටීමට අවස්ථාවක් ලැබුණි.



කාර්ය මණ්ඩල ක්‍රීඩා තරගයේ ඉසව්වකට සහභාගීවීම

## අවමඟුල් ආධාර

තම ඥාතියෙකු අභාවයට පත් වූ අවස්ථාවක කාර්ය මණ්ඩල සාමාජිකයකුට කිසියම් හෝ සහනයක් සැලසීම පිණිස සුභ සාධන සංගමයේ අරමුදලෙන් මුදල් ආධාර ලබාදීමේ පිළිවෙත ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ සුභ සාධන සංගමය ඉදිරියට ගෙන ගියේය.

## සුභ සාධන වෙළෙඳසල

සුභ සාධන සංගමයේ වෙළෙඳ සැලෙන් කාර්ය මණ්ඩලයට සාධාරණ මිලකට භාණ්ඩ මිලදි ගැනීමට හැකි වූ අතර ගෙවීම් ක්‍රමයට බඩු මිලදී ගැනීමට කැමැත්තක් දැක් වූ අයට ඒ සඳහා අවස්ථාව ලැබින. සුභ සාධක සංගමය කාර්ය මණ්ඩලයට තම කැමැත්ත අනුව භාණ්ඩ මිලට ගැනීම පිණිස වෙළඳ ආයතන ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභා පරිශ්‍රයට ගෙන්වීමට කටයුතු කළේය.

## 8.2.7 ප්‍රවර්ධන (**logistic**) සහයා දැක්වීම

රැස්වීම්. වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම, පරීක්ෂණ චාරිකා, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වැනි ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ අනෙකුත් අංශ වල කාර්යයන් සඳහා අවශ්‍ය දෑ සැපයීමට පාලන අංශය කටයුතු කළේය.

### 8.2.8 ගෙවීම් නිර්දේශ කිරීම/අනුමත කිරීම

වැටුප් වර්ධක, අතිකාල, හිඟ වැටුප්, ගමන් වියදම් හා සංයුක්ත දීමනා, විනය පරීක්ෂණ සඳහා ගෙවීම්, වාහන අළුත්වැඩියා කිරීම, නශ්‍ය අයිතම, උපකරණ හා යන්ත්‍ර, පොත්, සඟරා, මිලදී ගැනීම සහ සේවා (ආරක්ෂක, පවිත්‍රතා, ජලය, දුරකථන, විදුලිය) සැපයිම ආදියට සම්බන්ධ විවිධ ගෙවීම් සඳහා අනුමතිය ලබා දිම පාලන අංශයේ ප්‍රධාන කාර්යයක් විය. පාලන අංශය අදාල වවුචර පරික්ෂාවට භාජනය කළ අතර ගෙවීමේ ස්වභාවය සහ මූල්‍ය අධිකාර සීමාව අනුව ගෙවීම් නිර්දේශ කිරීම/අනුමැතිය දීම සිදුකළේය. ප්‍රමාදයකින් තොරව ගෙවිම් කිරිමට කටයුතු කරන ලදී.

### 8.2.9 අඩුපාඩු හඳුනා ගෙන සුදුසු ක්‍රියාපටිපාටියක් හඳුන්වාදීම

ඇතැම් ක්ෂේත්‍ර වල වැඩ කරගෙන යාමේදී අඩුපාඩු හඳුනාගත් අවස්ථාවන්හි පද්ධතිය තුළට සුදුසු ක්‍රියාපටිපාටි හඳුන්වා දීමට පාලන අංශය පියවර ගත්තේය. උදාහරණ වශයෙන් තම විෂයට අනුකුල ලැයිස්තු/රෙජිස්ටර පවත්වා ගෙන යන ලෙසට යටත් නිලධාරීන්ට උපදෙස් දෙනු ලැබීය. එමගින් බලාපොරොත්තු වූයේ අවශ්‍ය අවස්ථා වලදී තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සහ නවකයින්ට/අනුප්‍රාප්තිකයින්ට පහසුවෙන් විෂය අවබෝධ කරගැනීමට හැකි පසුබිමක් ඇතිකිරීම වේ. මෙමගින් කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව සහ ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවේ සමස්ථ ඵලදායකත්වය වැඩිවිය.

9 පරිච්ඡේදය

# නීති අංශය

## 9.1. කාර්යයන්

- නීති උපදෙස් අවශය කාරණා/ලේඛන සම්බන්ධයෙන් නීතිමය මත/උපදෙස් ලබාදීම.
- කොමිෂන් සභාව සඳහා නීති, රෙගුලාසි, නියෝග, මාර්ගෝපදේශ සහ බලපත්‍ර කෙටුම්පත් කිරීම.
- නඩු සඳහා ගරු නීතිපති හෝ පුද්ගලික නීතිඥයින් වෙත කරුණු යොමු කිරීම.
- අධිකරණය ඉදිරියේ පවතින නඩු හෝ ඒවාට අදාලව කෙටුම්පත් සැකසීම, ලිපි ගොණු ඉදිරිපත් කිරීම ආදිය ඇතුලත් සියළු කාරණා වලදී කොමිෂන් සභාව නියෝජනය කිරීම.
- කොමිෂන් සභාව සඳහා රාජකාරී ලිපි, වෙනත් ලිපි ලේඛන, කොමිෂන් සභා පත්‍රිකා, කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් කෙටුම්පත් කිරීම.
- පනතේ 18 A වගන්තිය ක්‍රියාත්මක කිරීම.
- අනෙක් අංශවලට නීති සහාය ලබාදීම සහ විදුලි සංදේශ පනත, 2004 අංක 11 දරණ මුදල් පනත, නීති රීති, බලපත්‍ර, නියෝග, තීන්දු ආදිය යටතේ ගත යුතු පියවරයන් බලාත්මක කිරීම.
- වෙනත් ආයතන වලට නීති සහය ලබාදීම.

## 9.2 කාර්ය සාධනය

නීති අංශය සංඛ්‍යාත බලපත්‍ර දීම, විකුණුම් බලපත්‍ර දීම, අයකුම, අනුගත වීමේ ගැටළු හා පාරිභෝගිකයන් සම්බන්ධ නියාමන කරුණු සහ පරිපාලන සහ මානව සම්පත් වලට සම්බන්ධ ගෘහස්ථ නීතිමය කරුණු යනාදිය පිළිබඳව කොමිෂන් සභාවට සහ ශ්‍රී.ලං.වි.සං.කො.සභාවේ අනෙකුත් අංශ/ඒකක වලට නීතිමය සහාය ලබාදී තිබේ. මෙම අංශය නඩු වලදී ශ්‍රී.ලං.වි.සං.කො. සභාවේ අනෙකුත් අංශ ඒකක වලට නීතිමය සහය ලබාදී තිබේ. මෙම අංශය නඩු වලදී ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටියේය. ඇතැම් අධිකරණ නඩු සඳහා ශ්‍රී. ලං. වි. සං. නි. කො. සභාව නීතිපති දෙපාර්තමේන්තුවේ සහ වෙනත් නීතිඥයන්ගේ සහය ලබාගත්තේය. නීති අංශය 2010 වසර තුල ඉටු කළ කාර්යයන් පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

### 9.2.1 නඩු මගට බැසීම

2010 වසරේදී පහත සඳහන් පාර්ශව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි නඩු පවරා පාදස්ථ මිලක් පැනවීමට කොමිෂන් සභාව ගත් තීරණය අභියෝගයට ලක් කළහ.

- සීමාසහිත භාති එයාර්ටෙල් ලංකා (පුද්ගලික) සමාගම සහ තවත් දෙදෙනෙකු ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවට එරෙහිව.
- හසිත කලන්සූරිය සහ තවත් දෙදෙනෙකු ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවට එරෙහිව
- ප්‍රභාත් සුදර්ශන වික්‍රමසිංහ ගුණවර්ධන සහ තවත් අය ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවට එරෙහිව

සීමාසහිත භාති එයාර්ටෙල් ලංකා (පුද්ගලික) සමාගම (SCFR 404/2010), හසිත කලන්සූරිය (SC/FR 406/2010) සහ ප්‍රභාත් සුදර්ශන වික්‍රමසිංහ ගුණවර්ධන (SC FR 415/2010) ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරනයෙහි මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කරමින් , 2010 ජුලි 15 දින සිට ජංගම හා ස්ථාවර ක්‍රියාකරුවන් යන දෙකොට්ඨාශයටම පාදස්ථ මිලක් පැනවීමට 1991 අංක 25 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 5(ඔ) වගන්තිය යටතේ ගනු ලැබූ තීරණය අභියෝගයට ලක් කළහ.

සීමාසහිත භාරතී එයාර්ටෙල් ලංකා (පුද්ගලික) සමාගමේ චෝදනාව වූයේ පාදස්ථ මිලක් පැනවීමට ගනු ලැබූ තීරණය/තීන්දුව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12,12(1) සහ 14(1)(උ) වගන්ති උල්ලංඝනය කරන බවයි. පාදස්ථ මිල ස්ථාවර හා ජංගම ක්‍රියාකරුවන් දෙකොට්ඨාශයටම අදාල විය. ශබ්ද ඇමතුම් හා කෙටි පණිවිඩ ඇමතුම් සේවාවන්ට පාදස්ථ මිල පැනවීම සම්බන්ධයෙන් භාති එයාර්ටෙල් සමාගම අයැද සිටියේ කොමිෂන් සභාවේ තීන්දුව ඉවතලන ලෙස හෝ පාදස්ථ මිල පැනවීම ක්‍රියාත්මක දිනයට පෙර හෝ පසුව පැනවූ සියළුම අයකුම සඳහා එය අදාල කරවන ලෙසය.

හසිත කලන්සූරිය පෙත්සම්කරු ඉහත සඳහන් කළ පාදස්ථ මිල අභියෝගයට ලක්කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි නඩුවක් ගොනු කළේය. ජංගම සේවා ග්‍රාහකයෙකු වශයෙන් ඔහුගේ විරෝධතාව වූයේ පාදස්ථ මිල ග්‍රාහකයන්ට (භාවිතා කරන්නන්ට) බලපෑමක් කරන බවයි. එබැවින් ඔහු අයැද සිටියේ 2010 ජුලි 15 දින සිට නව ග්‍රාහකයින් සඳහා පාදස්ථ මිලක් ක්‍රියාවට නැංවීමට කොමිෂන් සභාව විසින් ගනු ලැබූ තීන්දුව ඉවත් කරන ලෙසය.

ප්‍රභාත් සුදර්ශන වික්‍රමසිංහ පෙත්සම්කරු ජංගම හා ස්ථාවර සේවා ග්‍රාහකයෙකු වශයෙන් නඩුව ගොනුකලේ 2010.07.15 දින සිට නව ජංගම හා ස්ථාවර ග්‍රාහකයන් සඳහා අවම පාදස්ථ මිලක් හඳුන්වා දීමත් සමග 12(1) වගන්තිය යටතේ තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ ඉතා ආසන්න මොහොතක උල්ලංඝනය විය හැකි බවට චෝදනා කරමින්.

තම අයිතිවාසිකම් වලට බලපෑමක් විය හැකි බැවින් ඉහත නඩු වල තෙවන පාර්ශව පෙත්සම්කරුවන් වීමට සීමාසහිත මොබිටෙල්

ලංකා (පුද්ගලික) සමාගම, ඩයලොග් ආසියාටා (පී එල් සී), ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (පුද්ගලික) සමාගම, එටිසලාට් ලංකා (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා ටෙලිකොම් (පී එල් සී) අධිකරණයට අයදුම්පත් ඉදිරිපත් කළ බැවින් මෙය වැදගත් නඩුවක් විය. සියළුම පාර්ශව වල තර්ක වලට සවන් දීමෙන් පසු ශ්‍රේෂ්ඨාධිකරණය පෙත්සම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කලේය. ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවේ තීරණය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනුමත කිරීම නියාමකයාගේ ජයග්‍රහණයක් විය.

ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාව වෙනුවෙන් පෙනී සිටි නීතිඥයාට මෙම නඩුව සඳහා අවශ්‍ය වූ සියළු තොරතුරු හා ලේඛන නීති අංශය සැපයුවේය.

**9.2.2. අධිකරණ/ විනිශ්චය මණ්ඩල ඉදිරියේ වෙනත් නඩුවලට පෙනී සිටීම.**

2010 වසරේදී අන්තර්ජාලය හා සම්බන්ධ පැමිණිල වල සැලකිය යුතු වැඩිවීමක් සිදුවිය. අසභ්‍ය දෑ අන්තර්ගත වීම නිසා ඇතැම් වෙබ් අඩවි ප්‍රධාන වශයෙන්ම විදේශීය වෙබ් අඩවි අවුරන ලෙස ඉල්ලමින් ශ්‍රී ලංකාවේ මහේස්ත්‍රාත් අධිකරණ වල සහ බාලාපරාධ උසාවි වල බොහෝ නඩු පවරා තිබිණ. අධිකරන නියෝග මත ඇතැම් වෙබ් අඩවි /ලිපින අවුරන ලදී.

උසාවි, මානව හිමිකම් කොමිසම, කම්කරු දෙපාර්තමේන්තුව සහ කර්මාන්ත අධිකරණය වැනි අනෙකුත් විනිශ්චය මණ්ඩල ඉදිරියේ මානව සම්පත් කාරණ වල සිට නියාමන තීරණ දක්වා වූ පරාසයක් තුළ විහිදුනු කරුණු සම්බන්ධයෙන් 2010 දී පවරනු ලැබූ නඩු සහ ඉකුත් වර්ෂ වලින් ඉදිරියට ගෙන ආ නඩු බොහෝමයක් තිබුණි.

**9.2.3. අනෙකුත් රාජ්‍ය ආයතනවලට සහායවීම**

2004 අංක 11 දරණ මුදල් පණතේ III කොටස යටතේ පනවන ලද ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ධ සම්බන්ධයෙන් අලුත් රෙගුලාසි සහ සංශෝධන සකස් කිරීමට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයට සහාය වීමේදී නීති අංශය විසින් 2010 වසර තුළ ඉතා වැදගත් වැඩ කොටසක් ඉටුකරනු ලැබින.

**9.2.4 සෙස් නියෝගය සකස් කිරීම**

2010 දෙසැම්බර් මාසයේදී සෙස් බද්ධ ක්‍රියාකරුවන්ගේ වාර්ෂික දළ ආදායමෙන් 0.3% සිට 2% දක්වා වැඩි කිරීමට 1991 අංක 25 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 උ වගන්තිය ප්‍රකාර අතිගරු ජනාධිපතිතුමා විසින් සෙස් නියෝගයක් නිකුත් කරන ලදී. සෙස් නියෝගය සකස් කිරීමේදී නිති අංශය සහභාගී විය.

**9.2.5 "එනේබල්" ව්‍යාපෘතිය**

විශේෂ අවශ්‍යතා සහිත පාසල් සහ රණවිරු ගම්මන වැනි බල රහිත කණ්ඩායම් වලට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ලබාදීම සඳහා වූ "එනේබල්" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සබඳතා අංශයට නීති අංශය සහයෝගය දැක්වූවේය. (3.2.4 බලන්න) පරිගනක, මොනිටර, මුද්‍රක බ්‍රේල් එම්බොෂි කඩදාසි, UPS ආකේඩ් පිටපත් කරන යන්ත්‍ර වැනි උපකරණ මිලට ගැනීම සඳහා මෙම ව්‍යාපෘතියට කොමිෂන් සභාවෙන් දරණ ලද වියදම රුපියල් මිලියන 4.5 ක් විය.

**9.2.6 පාරිභෝගික පැමිණිලි**

විවිධාකාර ගැටළු සම්බන්ධයෙන් නීතිමය උපදෙස් පතා පාරිභෝගික සබඳතා ඒකකය විසින් යොමු කරන ලද පාරිභෝගික පැමිණිලි සියයකට අධික ප්‍රමාණයක් සම්බන්ධව නීති අංශය කටයුතු කළේය.

10 පරිච්ඡේදය

# තොරතුරු හා ලේඛන ඒකකය

තොරතුරු හා ලේඛණ ඒකකය, තොරතුරු හා තාක්‍ෂණ ඒකකය සහ පුස්තකාල සේවා ඒකකය යන කොටස් දෙකකින් සමන්විත වේ.

## 10.1. කාර්යයන්

### 10.1.1 තොරතුරු හා තාක්ෂණ ඒකකය

- පවතින යෙදුම් පද්ධති නඩත්තුව සහ ලේඛන ගත කිරීම.
- ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව සඳහා නව තොරතුරු තාක්ෂණ යෙදුම් සකස් කිරීම.
- තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ කාර්ය මණ්ඩලයට තාක්ෂණික සහාය ලබාදීම.
- ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ කාර්ය මණ්ඩලයට තොරතුරු තාක්ෂණ භාවිත මූලය (user base) පිළිබඳ පුහුණුව ලබාදීම.
- ලැයිස්තු හා දැන්වීම් පුවරු සේවා ඇතුළත් ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ සියළු අන්තර්ජාල කටයුතු පිළිබඳ ක්‍රියා කිරිම.
- වෙබ් අඩවි කමිටුවේ මාර්ගෝප දේශකත්වය යටතේ ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවේ වෙබ් අඩවිය පවත්වාගෙන යාම.
- අභ්‍යන්තර තොරතුරු ජාල නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරිම.
- ප්‍රදර්ශන මාර්ගයෙන් තොරතුරු ලබාගැනීම හා බෙදාහැරීම.
- විද්‍යුත් තැපැල් සේවා සැපයුම් පරිගනකය (Server) පාලනය හා නඩත්තු කිරීම

### 10.1.2 කාර්ය සාධනය

තොරතුරු තාක්ෂණ ඒකකය විසින් ඉටුකරන ලද කාර්යයන් පිළිබඳ විස්තර 15 වගුවේ දැක්වේ.

වගුව 15
තොරතුරු තාක්ෂණ ඒකකය විසින් ඉටුකරනු ලැබූ කාර්යයන් 2010

| ව්‍යාපෘතිය | විස්තරය |
|---|---|
| ESET Nod 32 ප්‍රති වෛරස මෘදුකාංගය ESET ස්මාට් සෙකියුරිටි ලෙස වැඩිදියුණු කිරීම සහ බලපත්‍ර අළුත් කිරීම. | මෙම කාර්යය 2010 දී නිම කළ අතර, එමගින් ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ පරිගනක වෛරසය ආක්‍රමණ වලින් ආරක්ෂා කිරීමට හැකිවිය. මේ සඳහා රුපියල් 221,500.00 වැය කෙරිණ. |
| "ලෝටස් නෝට්ස්" සහ "ලෝටස් ඩොමිනෝ" මෘදුකාංග වැඩිදියුණු කිරීම | මීට අදාල ප්‍රතිසම්පාදන ලේඛන සැකසීමේ කටයුතු 2010 වසරේදී නිම කරන ලදී. |
| විද්‍යුත් තැපැල් සේවා පරිගනකය, එම පරිගනක රාක්ක, මෘදුකාංග පිහිටැවීම සිදු කිරීම | අළුත් අධිවේගී පරිගනයක් මිලට ගන්නා ලදී. මෘදුකාංග පිහිටැවුම කරන ලදී. රුපියල් 998685.43 මෙම කාර්යය සදහා වැයකරන ලදී. |
| දෙවන මහලේ තිබෙන තන්තු අලුත්වැඩියාව සහ ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ LAN පද්ධතිය අංකනය කිරීම. | ප්‍රසම්පාදනයට අදාල ලිපි ලේඛන කටයුතු නිම කරන ලදී. |
| ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභවේ විද්‍යුත් තැපැල් සේවා පරිගනයකට (server) සම්බන්ධ කුලියට ගත් අන්තර්ජාල රැහැන (Suntel Deidcated Internet Leased Line) තත්පරයට කිලෝ බයිට් 128 (128 kbps) සිට තත්පරයට කිලෝ බයිට් 512 දක්වා ඉහල නැංවීම | ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ විද්‍යුත් තැපැල් පරිගනකයෙහි (server) ප්‍රවේශ වේගය වැඩි කිරීමට මෙය ඉතා ප්‍රයෝජනවත් විය. කුලියෙහි කිසිදු වැඩිවීමකින් තොරව මෙය ඉටුකරනු ලැබිණ. |
| දෘඩාංග ආරක්ෂක (Hardware Firewall) පද්ධතියක් මිලදී ගැනීම | කෙරීගෙන යමින් පවතී |

## 10.2 පුස්තකාල සේවා ඒකකයේ කාර්යයන්

- අභ්‍යන්තර කාර්ය මණ්ඩලය, විශ්ව විද්‍යාල සිසුන්, පාසල් සිසුන්, පර්යේෂකයන් සහ පුස්තකාලාධිපතිවරුන් වැනි අය සඳහා පුස්තකාලයක් පවත්වාගෙන යාම.
- මහජන පුස්තකාලය, බ්‍රිතාන්‍ය කවුන්සලය වැනි වෙනත් පුස්තකාල වල සේවා ලබාදීම.
- ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ කාර්ය මණ්ඩලයට අන්තර් පුස්තකාල ණය පහසුකම සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතන, කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික විද්‍යා පදනම වැනි ආයතන සමග සම්බන්ධිකරණය.
- ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ කාර්ය මණ්ඩලය සඳහා සම්මන්ත්‍රණ සංවිධාන කිරීම.
- පුවත්පත් සුචිය සකස් කිරීම.

### 10.2.1 කාර්ය සාධනය

පුස්තකාල සේවා ඒකකය විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාල ලේඛන පොත්පත් සහ සඟරා ගණනාවක් අඩංගු 'පුස්තකාලයක පවත්වාගෙන යාමේ කටයුත්ත ඉදිරියට ගෙන ගියේය. අන්තර්ජාලය සහ වෙනත් පුස්තකාල දත්ත සමුදායන් (Date bases) සඳහා භාවිතා කොට සේවා ලාභීන් සඳහා තොරතුරු සැපයීම සිදුකරන ලදී. විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාල පොත් සහ සඟරා වලට අතිරේකව කළමනාකරණය, නීතිය, ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය වැනි අනෙකුත් විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ වැදගත් පොත්පත් පුස්තකාලය සතුව තිබේ.

පූර්නා (PURNA) දත්ත සමුදාය භාවිතා කොට පුස්තකාලය ස්වයංක්‍රීයකරණය කිරීම 2010 වසර තුල ඉටු කරනු ලැබූ වැදගත් කාර්යයක් වේ. මෙම කාලය තුලදී ලේඛන

(records)6000 ක් පමණ නිම කිරීමට හැකිවිය. පුස්තකාල ඒකකය පොත් සහ සඟරා ගණනාවක් මිලදී ගත් අතර පොත් මිලදී ගැනීම සහ දායකවීම (subscription) අලුත් කිරීම පිණිස 2010 වසරේදී රුපියල් 478,021 ක් වැය කරන ලදී.

විදුලි සංදේශනය, පරිසරය, ඓතිහාසික වශයෙන් වැදගත් සිද්ධීන් ආදිය සම්බන්ධයෙන් පළවූ පුවත්පත් ලිපි සුචිගත කිරීම අඛණ්ඩව කර ගෙන යන ලදී. පුස්තකාලය භාවිතා කරන පිරිස් ඉල්ලීම් කල විට මෙම ලිපි වල පිටපත් අය කිරීමකින් තොරව ඔවුනට ලබා දෙන ලදී.

පහත සඳහන් සංවිධාන වල ආයතනික සාමාජිකත්වය ලබාගැනීමේදී පුස්තකාල සේවා ඒකකය විසින් වැදගත් වැඩකොටසක් ඉටුකරනු ලැබීය.

1. මහජන පුස්තකාලය
2. ජාතික පුස්තකාලය
3. බ්‍රිතාන්‍ය කවුන්සලය

ආයතනික සාමාජිකත්වය තිබීම නිසා ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ කාර්ය මණ්ඩලයට කිසිදු මුදල් ගෙවීමකින් තොරව ඉහත සඳහන් කර ඇති පුස්තකාල වල සේවාවන් ලබාගැනීමට හැකිවිය. කෙසේ වෙතත්, මහජන පුස්තකාලයේ පුද්ගලික සාමාජිකත්වය ලබාගැනීමට කාර්ය මණ්ඩල සාමාජිකයන් පුද්ගලිකව මුදල් ගෙවිය යුතු විය. ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාව බ්‍රිතාන්‍ය කවුන්සලයේ සහ ජාතික පුස්තකාලයේ සාමජිකත්වය ලබාගැනීම සඳහා මුදල් ලබාදුන්නේය. ආයතනික සාමාජිකත්වය තිබීම නිසා ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ කාර්ය මණ්ඩලයට මහජන පුස්තකාලයේ ජංගම පුස්තකාල සේවාවෙන් පොත්/සඟරා ලබාගැනීමට හැකිවිය. 2010 වර්ෂය තුල ජංගම පුස්තකාල සේවාව ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභා පරිශ්‍රයට 24 වාරයක් පැමිණියේය.

11 පරිච්ඡේදය

# අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා (ප්‍රධාන අභ්‍යන්තර විගණක) කොමිෂන් සභාවට සෘජුව වාර්තා කරන අතර වාර්තා ඉදිරිපත් කරනු ලබන්නේ විගණන කමිටුවට වේ. පරිපාලනමය වශයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක අධ්‍යක්ෂ ජනරාල් වරායට වාර්තා කරයි.

## 11.1 කාර්යයන්

- ශ්‍රී.ලං.වි.ස.නි.කො. සභාවේ පවත්නා ගිණුම්කරණ හා වාර්තා කිරීමේ පද්ධති වැඩිදියුණු කිරීම සඳහා ඒවා සමාලෝචනය කිරීම හා ඇගයීම.
- ශ්‍රී.ලං.වි.ස.නි.කො. සභාවේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කිසියම් දූර්වලතා තිබේ නම් ඒවාට හේතු සහ බලපෑම් වමර්ෂනය කිරීම.
- ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවේ වත්කම් නැති වී යාම් වලින් හා වංචා වලින් කොතෙක් දුරට ආරක්ෂා වී තිබේ දැයි නිශ්චිතව දැනගැනීම.
- ගණුදෙනු වල අවශ්‍යතාව, ගණුදෙනුවල ප්‍රතිලාභ පිළිබඳ පරීක්ෂණ කිරීම සහ නාස්තිය හා පමණ ඉක්මවා වියදම් කිරීම ඉවත් කිරීම මගින් වියදම් අඩු කිරීමේ මාර්ග පිළිබඳව ගවේෂණය කිරීම.
- ඉහත දැක්වූ ක්‍රියාමාර්ග වලින් සොයා දැන ගන්නට ලැබෙන කරුණු පාදක කර ගනිමින් විගණන කමිටුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම සහ විගණන කමිටු රැස්වීම් කැඳවීමට පියවර ගැනීම.
- විගණන කමිටු තීරණ සකස් කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීම පිණිස ඒවා අංශ ප්‍රධානීන් වෙත බෙදා හැරීම.
- විගණකාධිපති දෙපාර්තමේන්තුවට අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම.

- අධ්‍යක්ෂ ජනරාල්/කොමිෂන් සභා සාමාජිකයින් ඉල්ලා සිටි විට විශේෂ විමර්ශන පැවැත්වීම.
- අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන විවිධ කමිටු වලට සහාය වීම සහ නිර්දේශ ලබාදීම.

### 11.2 කාර්ය සාධනය

ශ්‍රී.ලං.වි.සං.නි.කො. සභාවේ විගණන කමිටුව කොමිෂන් සභාවේ විධායක නොවන සාමාජිකයන් දෙනෙකුගෙන් සමන්විත වේ. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ විගණන කමිටු රැස්වීම් තුනක් පැවැත්වුන අතර එහිදී ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරන ලද වාර්තා 37 ක් සාකච්ඡාවට ගැනිණ. විගනණ කමිටුව විසින් ගන්නා ලද තීරණ නිවැරදි කිරීමේ/වැඩ පිළිවෙලවල් යෙදීම/සුදුසු ක්‍රියාමාර්ග සඳහා බෙදාහරින ලදී.

2010 වසර තුලදී අභ්‍යන්තර විගණන වාර්තා තිස් හතක් (37) විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අතර එම වාර්තාවල ලැයිස්තුව 16 වගුවේ දක්වා ඇත.

වගුව 16

අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කරනු ලැබූ වාර්තා වල ලැයිස්තුව - 2010

| වාර්තා අංකය | වාර්තාවේ දිනය | මාතෘකාව |
|---|---|---|
| CIA/10/01 | 04/01/2010 | 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගිණුම් ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති විසින් මුදල් පනතේ 14 (2)(C)වගන්තිය යටතේ නිකුත් කරන ලද වාර්තාව පිළිබඳ අදහස් දැක්වීම. |
| CIA./10/02 | 13/01/2010 | රාජකාරි කටයුතු සඳහා විදේශ ගමන් |
| CIA./10/03 | 09/02/2010 | ගෙවා නිම නොකල අත්තිකාරම් |
| CIA./10/04 | 22/02/2010 | වි.ස.සං.නි.කො.සභාවේ ආරක්ෂක සේවා සහ ආපන ශාලා සේවා |
| CIA./10/05 | 01/03/2010 | 2009 දෙසැම්බර් 31 දිනට අතැති මුදල් |
| CIA./10/06 | 05/03/2010 | ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම |
| CIA./10/07 | 09/03/2010 | කොකාවිල් හි ඉදිකිරීමට යෝජිත කුළුන සහ උපරබන ගොඩනැගිල්ල |
| CIA./10/08 | 10/03/2010 | අවුරුදු දෙකක් පඩි රහිත නිවාඩු ලබා සිටින නිලධාරීන් |
| CIA./10/09 | 11/05/2010 | ශ්‍රී.ලං.වි.සං.නි.කො.සභාවේ වාර්ෂික වාර්තා හා ගිණුම් |
| CIA./10/10 | 21/05/2010 | සංචිතයේ වාහනවල ධාවන සටහන් පවත්වාගෙන යාම |
| CIA./10/11 | 02/06/2010 | ගමන් වියදම් හා යැපීම් දීමනා ගෙවීම |
| CIA./10/12 | 04/06/2010 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාව විසින් ප්‍රදානය කරනු ලැබූ ශිෂ්‍යත්ව සඳහා ගුවන් ටිකට්පත් පිරිවැය. |
| CIA./10/13 | 15/06/2010 | විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබූ වාර්තා පිළිබඳ තත්ත්වය |

| | | |
|---|---|---|
| CIA./10/14 | 16/07/2010 | කාර්යාල ලදුපත් වල පොත් පිටපත භාවිතය |
| CIA./10/15 | 20/06/2010 | කාර් තුනක් ප්‍රසම්පාදනය කිරිම |
| CIA./10/16 | 23/06/2010 | ගෙවීම් වවුචර් පරික්ෂා කිරිම |
| CIA./10/17 | 28/06/2010 | සංඛ්‍යාත බලපත්‍ර ඉන්වොයිස් |
| CIA./10/18 | 30/06/2010 | 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ගිණුම් ප්‍රකාශ පිළිබඳ අදහස් |
| CIA./10/19 | 02/08/2010 | පාවිච්චි කරන ලද ලදුපත් හා චෙක්පත් වල පිලිපත් භාරකාරත්වය |
| CIA./10/20 | 05/08/2010 | ජංගම ග්‍රාහක බද්ධ එකතු කිරිම |
| CIA./10/21 | 09/08/2010 | පරිසර සංරක්ෂන බද්ද අය කර ගැනීම. |
| CIA./10/22 | 08/09/2010 | 2010 ජනවාරි සිට ජුනි මාසය දක්වා කාලය සඳහා වූ කළමනාකරණ තොරතුරු |
| CIA./10/23 | 06/10/2010 | වි.සං.නි.කො.සභාවේ වෙබ් අඩවියෙහි සංඛ්‍යාව ලේඛන පළ කිරීම. |
| CIA./10/24 | 18/10/2010 | වෛද්‍ය රක්ෂණය සහ ගෙවීමට ඇති වැටුප් පිළිබඳ ගිණුම |
| CIA./10/25 | 19/10/2010 | මු.රෙ. 104 යටතේ ප්‍රාථමික වාර්තාව හා අවසාන වාර්තාව |
| CIA./10/26 | 19/10/2010 | නැතවීම් ලේඛනය පවත්වාගෙන යාම |
| CIA./10/27 | 02/11/2010 | විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලැබූ වාර්තා පිළිබඳ තත්ත්වය |
| CIA./10/28 | 02/11/2010 | ධාවන සටහන් විශ්ලේෂණය |
| CIA./10/29 | 25/10/2010 | ගුවන් ටිකට්පත් වල වියදම ප්‍රතිපූර්ණය |
| CIA./10/30 | 04/11/2010 | මුදල/චෙක්පත් ලේඛනය පවත්වා ගෙනයාම |
| CIA./10/31 | 04/11/2010 | මුදල් පොත් පවත්වාගෙන යාම |
| CIA./10/32 | 11/11/2010 | පෙදු ලෙජරයෙහි ජර්නල් සටහන් |
| CIA./10/33 | 18/11/2010 | ගෙවීම් වවුචර් පරික්ෂා කිරීම |
| CIA./10/34 | 24/11/2010 | පොදු රාජ්‍ය මණ්ඩල විදුලි සංදේශ සංවිධානයේ රැස්වීම සඳහා අතිකාල ගෙවීම. |
| CIA./10/35 | 26/11/2010 | ධාවන සටහන් පවත්වාගෙන යාම |
| CIA./10/36 | 30/11/2010 | ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම |
| CIA./10/37 | 13/122010 | වැටුප් ගෙවීම |

## 12 පරිච්ඡේදය

# ගිණුම් අංශය

### 12.1 කාර්යයන්

- වාර්ෂික මෙහෙයුම්, ප්‍රාග්ධනය සහ ආදායම් අයවැය පිළියෙල කිරීම,
- බිල්පත් සැකසීම සහ විවිධ බලපත්‍ර ගාස්තු, සෙස් බදු සහ වර්ණාවලිය භාවිතා කිරිමේ ගාස්තු අය කිරිම.
- ආදායම් වාර්තා යාවත්කාලින කිරීම, ආදායම් එකතු කිරීම, මුදල් පාලනය, අධීක්ෂණය, කොමිෂන් සභාවේ ප්‍රධාන ආදායම් ගොණුව පවත්වාගෙන යාම.
- අරමුදල් ප්‍රයෝජනය ගැනීම අධීක්ෂණය, වැටුප්, වේතන, අතිකාල සහ අනෙකුත් ගෙවීම් සැකසීම සහ ගෙවීම් වාර්තා යාවත්කාලින කිරිම.
- අවසාන වත්කම් රෙජිස්ටරය පවත්වාගෙන යාම
- ගිණුම් වාර්තා සකස් කිරීම.
- තථ්‍ය අයවැය පාලනය කිරිම හා අධීක්ෂණය කිරිම
- අදාල වාර්තා සකස් කිරිම හා රජයේ විගණන නිලධාරීන්ට ඒවා ඉදිරිපත් කිරිම
- කොමිෂන් සභා සාමාජිකයන්ට, අමාත්‍යාංශ නිලධාරීන්ට හා වෙනත් අයට අවශ්‍ය තොරතුරු සකස් කිරිම සහ ඉදිරිපත් කිරීම.

### 12.2 කාර්ය සාධනය

#### 12.2.1 ආදායම සහ වියදම

1996 අංක 27 දරණ විදුලි සංදේශ පනතේ විධි විධාන ප්‍රකාරව ශ්‍රී.ලං.වි.සං.නි.කොමිෂන් සභාව පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු, සෙස් බදු, ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු සහ අනෙකුත් ගාස්තු අදාල පාර්ශව වලින් එකතු කරගත් අතර, ආදායම් පිළිබඳ සාරාංශයක් 17 වගුවේ දැක්වේ. සැසඳිම සඳහා වගුවේ 2009 වර්ෂයේ ආදායම සඳහන් කර තිබේ.

වගුව 17
ශ්‍රී.ලං.වි.සං.නි.කොමිෂන් සභාවේ ආදායම 2009-2010

| ආදායම්ප්‍රභවය | 2009 (රු. 000') | 2010 (රු. 000') |
|---|---|---|
| පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ක්‍රියාකරු | 899,275 | 434,633 |
| සෙස් ගාස්තු | 390,571 | 340,095 |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු | 4,936,33 | 5,116,864 |
| විකුණුම් බලපත්‍ර ගාස්තු | 4,926 | 6,077 |
| ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | 68 | 30 |
| නැව් තොටුපල බලපත්‍ර ගාස්තු | 608 | 296 |
| අහස්යානා තොටුපල බලපත්‍ර ගාස්තු | 500 | 230 |
| රැහැන් රහිත දුරකතන වෙළෙඳ ගාස්තු | 1,080 | 1,927 |
| විභාග ගාස්තු | 5 | 7 |
| අයදුම් සැකසීමේ (පරීක්ෂා කිරීමේ) ගාස්තු | 1,231 | 206 |
| කෙටි සංකේත ගාස්තු | 2,603 | 3,608 |
| විවිධ ආයාදම් (කාර්ය මණ්ඩල ණය සඳහා පොළියෙන් ලැබෙන ආදායම, තැන්පතු හා වෙනත් දෑ සඳහා ලැබෙන පොලී ආදායම) | 8,411 | 8,830 |
| **එකතුව** | **6,245** | **5,913** |

ඉහත සඳහන් කර ඇති ආදායමට අමතර වශයෙන්, මහා භාණ්ඩාගාරයට අදාල ගෙවීම් කිරිමෙන් පසු විදුලි සංදේශ සංවර්ධන කටයුතු සඳහා කරනු ලැබූ අය කිරීම් වලින් රුපියල් මිලියන 418 ක මුදලක් 2010 වසරේදී කොමිෂන් සභාවට ලැබින,

2010 වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමට පෙර කොමිෂන් සභාවේ වියදමට වැඩි ආදායම රුපියල් මිලියන 5.577 ක් වූ අතර 2009 වසරේදී එය රුපියල් මිලියන 5,634 ක් විය. කෙසේ වෙතත් 2010 වසර සඳහා ගෙවන ලද ආදායම් බද්ද (රුපියල් මිලියන 1,767) 2009 වසරේදී ගෙවන ලද ආදායම් බද්දට වඩා (රුපියල් මිලියන 677) බොහෝ සෙයින් වැඩිවිය. ඒ අනුව ආදායම් ගෙවිමෙන් පසු 2010 හා 2009 වසර වල වියදමට වැඩි ආදායම පිළිවෙලින් රුපියල් මිලියන 3,810 ක් හා රුපියල් මිලියන 4,957 ක් විය.

### 12.2.2 පොදු මංමාරු දුරකථන ජාල (PSTN) ක්‍රියාකරුවන්ගේ එකතු කර ගත් අයබදු

PSTN ක්‍රියාකරුවන්ගෙන් අය කරගත් බදු ඒකාබද්ධ අරමුදලට යවන ලද අතර 2009 හා 2010 වසර වල අය කිරීම් පිළිබඳ විස්තර 18 වගුවේ දැක්වේ. පරිසර සංරක්ෂණ බද්ධ සහ ජංගම දුරකථන ග්‍රාහක බද්ධ අය කරනු ලැබුවේ බලපත්‍රලාභී සෙලියුලර් දුරකථන ක්‍රියාකරුවන්ගෙන් වන අතර රැහැන් රහිත ස්ථාවර බිම් දුරකථන ග්‍රාහක බද්ධ අය කර ගනු ලැබුවේ බලපත්‍රලාභී CDMA ක්‍රියාකරුවන්ගෙනි.

18 වගුව

මහා භාණ්ඩාගාරයට යැවීම සඳහා පොදු මංමාරු දුරකථන ජාල (PSTN) ක්‍රියකරුවන්ගෙන් එකතු කරගත් අයබදු

| අයබදු වර්ගය | 2010 (රු. මි.) | 2009 (රු. මි.) |
|---|---|---|
| ජංගම දුරකථන ග්‍රාහක අය බද්ද | 6,014 | 5,399 |
| රැහැන් රහිත සහ ස්ථාවර බිම් දුරකථන ග්‍රාහක අය බද්ද | 2,311 | 2,895 |
| පරිසර සංරක්ෂණ අය බද්ද | 1,066 | 947 |
| ඒකාබද්ධ අරමුදලට බැරකළ මුළු බදු මුදල | 9,391 | 9,241 |

### 12.2.3 ඒකාබද්ධ අරමුදලට යවනු ලැබූ මුදල්

කොමිෂන් සභාවේ මෙහෙයුම් වියදම් මුදල් පසු ඉතිරි අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට යවනු ලැබින. එලෙස 2010 වසරේදී යවනු ලැබූ මුදල රුපියල් බිලියන 3.8 ක් වූ අතර එය 2009 වසරේදී යවන ලද ප්‍රමාණයට වඩා 182% ක වැඩිවීමකි. මෙයට අතිරේක වශයෙන් 2004 අංක 11 දරණ මුදල් පනතට අනුව ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු අයබදු වශයෙන් එකතු කරගත් මුදල් වලින් රුපියල් බිලියන 13.8 ක් ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලදී. එම පනතේ යටතේම PSTN ක්‍රියාකරුවන්ගෙන් අය කරගත් බදු (රුපියල් බිලියන 9.4) භාණ්ඩාගාරයට යවන ලදී. ඒ අනුව 2010 දී ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලද මුළු මුදල රුපියල් බිලියන 27 ක් විය.

### 12.2.4 ස්ථාවර වත්කම්

2010 ජනවාරි 01 දින ස්ථාවර වත්කම් වල වටිනාකම රුපියල් මිලියන 818 ක් වූ අතර වර්ෂය අවසාන වන විට එය රුපියල් මිලියන 789 ක් විය. ඒ අනුව වර්ෂය තුළ ස්ථාවර වත්කම් වල ශුද්ධ අඩුවීම රුපියල් මිලියන 29 ක් වේ. වර්ෂය තුළ ක්ෂය වීම් සඳහා වෙන් කළ මුළු මුදල රුපියල් මිලියන 523 ක් වන අතර ශේෂ පත්‍ර දිනට සමුච්චිත ක්ෂය වීම රුපියල් මිලියන 484 කි. ඒ අනුව ස්ථාවර වත්කම් වල ශුද්ධ පොත් අගය රුපියල් මිලියන 305 ක් විය.

### 12.2.5 ඇස්තමේන්තු ගත අයවැය සහ සත්‍ය අයවැය

2010 වසර සඳහා ආදායම් හා වියදම් පිළිබඳ ඇස්තමේන්තුගත හා සත්‍ය අයවැය 19 වගුවේ දැක්වේ.

19 වගුව

අයවැය ඇස්තමේන්තු හා සත්‍ය අයවැය - 2010

| ආදායම / වියදම | ඇස්තමේන්තු අයවැය (රු. මි.) | සත්‍ය අයවැය (රු. මි.) | විචලනය වැඩි/අඩු (රු. මි.) |
|---|---|---|---|
| ආදායම | 4,793 | 5,913 | 1,120 |
| ප්‍රාග්ධන වියදම | 284 | 228 | (56) |

| | | | |
|---|---|---|---|
| ආයභාර වියදම | | | |
| නියාමන විදම | 319 | 64 | (255) |
| පරිපාලන හා ආයතනික වියදම | 142 | 287 | 145 |
| අළුත්වැඩියා හා නඩත්තු වියදම | 46 | 34 | (12) |
| මූල්‍ය හා වෙනත් වියදම් | 5 | 8 | 3 |
| ණය ගැතියන් සඳහා වෙන් කිරීම | 0.1 | 158.5 | 158.4 |

ඉහත වගු වල දක්වා ඇත්තේ වටයන ලද සංඛ්‍යාව වල අතර ඇස්තමේන්තු ශේෂ පත්‍රය, ආදායම් හා වියදම් ගිණුම් සහ ශ්‍රී.ලං.වි.සං.නි.කොමිෂන් සභාවේ අනෙකුත් ගිණුම් පොත් වල නියම සංඛ්‍යා සඳහන් වේ.

# 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් වාර්තා

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
## 2010 දෙසැම්බර් 31 දින ශේෂ පත්‍රය
## (ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

| | සටහන් | | 2009.12.31 |
|---|---|---|---|
| **ප්‍රාග්ධන යෙදවීම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 2 | 304,822,366.86 | 295,248,869 |
| කෙරීගෙන යන වැඩ | 3 | 258,438,061.81 | 103,857,050 |
| | | 563,260,428.67 | 399,105,919 |
| **ආයෝජන** | 4 | 7,749,665,953.71 | 15,743,763,837 |
| **ජංගම වත්කම්** | | | |
| ලැබිය යුතු වත්කම | 5 | 2,897,743,424.94 | 4,966,120,371 |
| වෙනත් ලැබිය යුතු | | 609,999,50 | 610,000 |
| ආපදා ණය | | 23,165,326,03 | 24,025,061 |
| පෙර ගෙවීම් | | 322,500.00 | 815,000 |
| විශේෂ අත්තිකාරම් | | 13,575.00 | 2,075 |
| උත්සව අත්තිකාරම් | | 123,758.07 | 115,858 |
| මෝටර් රථ ණය | | 57,005,466.46 | 55,809,499 |
| නිවාස ණය | | 6,612,609.00 | 7,613,002 |
| යතුරු පැදි ණය | | 2,101,329.15 | 3,030,571 |
| විශේෂ ණය - සුනාමි | | 0.00 | 27,723 |
| මිලදී ගැනුම් අත්තිකාරම් | | 292,080.00 | 406,520 |
| ලැබිය යුතු ගුවන් ප්‍රවේශපත් | | 285,906.00 | 0 |
| අය විය යුතු වැටුප් අඩුකිරීම් | | 12,981.94 | 0 |
| ලැබිය යුතු ස්ථාවර පොලී | | 1,664,312.77 | 2,802,430 |
| දේශීය ආදායම් කොමසරිස් ජනරාල් (රඳවාගැනීමේ බදු) | | 713,079.92 | 63,774,376 |
| හිමිවිය යුතු ආර්ථික සේවා ගාස්තු | | 0.00 | 68,246,253 |
| අයවිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | | 0.00 | 261,804,594 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනාරාල් විසින් වැඩිපුර අය කර ගෙන ඇති ආදායම් බදු | | 0.00 | 7,362,538 |
| බැංකු මුදල් | 6 | 1,474,454,040.87 | 150,584,615 |
| අතැති මුදල් | 6B | 16,525.48 | 38,098 |
| | | 4,465,136,915.13 | 5,613,188,584 |
| **ජංගම වගකීම** | | | |
| ගෙවිය යුතු මුදල | 7 | 27,125,751.86 | 101,816,685 |
| අයවීමට ඇති කාර්ය මණ්ඩල ණය | | 1,175,07 | 58,605 |
| VAT පාලන ගිණුම | | 87,450,765.70 | 344,295,423 |
| ආදායම් බදු සඳහා වෙන් කිරීම් | | 236,409,096.00 | 1,457,069,402 |
| සී.ටී.ඕ. ටෙලි මධ්‍යස්ථාන ව්‍යාපෘතිය | | 924,491.92 | 924,492 |
| පලුදු වූ ඇන්ටෙනා සඳහා රක්ෂණ වන්දි ලැබීම් | | 0.00 | 4,899,602 |
| ණය හිමියෝ - ඉදිකිරීම් | | 751,650.00 | 4,217,199 |
| අත්තිකාරම් වශයෙන් ලැබුණු ආයාදම | | 2,715,896,910.62 | 2,052,842,913 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | | 1,153,612.00 | 1,151,112 |
| 1800 MHz සංඛ්‍යාත සඳහා ලද අත්තිකාරම් | | 307,635,000.00 | 307,635,000 |
| පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම් | | 21,533,040.00 | 19,296,380 |
| එලදායි ආපදා කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සමුළුව | | 34,209.75 | 34,210 |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු 50% TDC | | 118,458,551.73 | 0 |
| ලබානොගත් සේවක ප්‍රතිලාභ | | 7,737.98 | |
| | | 3,517,381,992.63 | 4,294,241,022 |
| **ශුද්ධ ජංගම වත්කම්** | | 947,754,922.50 | 1,318,947,562 |
| | | 9,260,681,304.88 | 17,461,817,317 |

| | | |
|---|---|---|
| **නියෝජනය වන්නේ** | | 2009.12.31 |
| **රජයේ දායක මුදල්** | | |
| ලෝක බැංකු ණය ගිවිසුම් | 298,572,433.87 | 298,572,434 |
| (එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන්) | 19,533,906.00 | 19,533,906 |
| (වෙනත් රජයේ දායකයන්) | 208,108,404.22 | 208,108,404 |
| | 526,214,744.09 | 526,214,744 |
| අන්තර්ජාතික විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ අයබදු අරමුදල | 21,254,347,225.16 | 15,704,170,073 |
| අඩුකළා: ඒකාබද්ධ අරමුදලට මාරුකිරීම් | (13,815,293,948,62) | 0 |
| | 7,439,053,276.54 | 16,230,384,817 |
| **එකතු කළා:** | | |
| සමුච්චිත අතිරික්තය ස්ථාවර | 1,241,833,284.25 | 1,231,432,500 |
| නැවත ඇගයූ අතිරික්තය වත්කම් ප්‍රත්‍යාගණන | 53,580,000.00 | 0 |
| අතිරික්තය | 9,260,681,304.88 | 17,461,817,317 |

ලලිත් වීරතුංග
සභාපති

අනූෂ පැල්පිට
අධ්‍යක්ෂ ජනරාල්

ඒ.එස්. හපුආරච්චි
සහකාර අධ්‍යක්ෂ (ආදායම්)
වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**2010 දෙසැම්බර් 31 දිනට ආදායම් ප්‍රකාශය**
**(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)**

| | සටහන් | | 2009.12.31 |
|---|---|---|---|
| ආදායම් | 8 | 5,912,802,429.51 | 6,245,609,858 |
| අඩුකළා: ජාතික ගොඩනැගිමේ බදු | | (200,055,587.00) | (154,297,892) |
| | | 5,712,746,842.51 | 6,091,311,967 |
| විදුලි සංදේශ සංවර්ධන අයකිරීම් | 8B | 418,436,403.23 | 0 |
| | | 6,131,183,245.74 | 6,091,311,967 |
| අඩුකළා : නියාමන වියදම් | 9 | (63,894,039.94) | (89,457,878) |
| | | 6,067,289,205.80 | 6,001,854,089 |
| **අඩුකළා : අනෙකුත් වියදම්** | | | |
| ආයතන සහ පරිපාලන වියදම් | 10 | 287,338,563,37 | 311,036,932 |
| අලුත්වැඩියා සහ නඩත්තු වියදම් | 11 | 34,027,414,40 | 28,167,195 |
| මුල්‍ය සහ අනෙකුත් වියදම් | 12 | 8,420,404.75 | 7,444,838 |
| බොල් ණය ගැතියන් සඳහා වෙන් කිරිම | | 158,553,234.27 | 21,455,742 |
| විදේශ මුදල් ගණුදෙනු වලින් ලාභය/අලාභය | | 1,643,315.65 | (228,325) |
| | | 489,982,932.44 | 367,876,382 |
| ආදායම් බදු ගෙවීමට පෙර වියදමට වැඩි ආදායම | | 5,577,306,273.36 | 5,633,977.707 |
| ආදායම් බදු | | 1,766,905,489.18 | 676,820,549 |
| ආදායමට බදු ගෙවීමෙන් පසු වියදමට වැඩි ආදායම | | 3,810,400,784.18 | 4,957,157,158 |
| අඩුකළා : ඒකාබද්ධ අරමුදලට දායක වීම | | (3,800,000,000.00) | (1,350,000,000) |
| වර්ෂය සඳහා වියදමට වැඩි මුළු ආදායම | | 10,400,784.18 | 3,607,157,158 |
| එකතු කළා: ඉදිරියට ගෙන ආ අතිරික්තය (හිඟය) | | (1,231,432,500) | (2,375,724,658) |
| සමුච්චිත අතිරික්තය/හිඟය | | 1,241,833,284.25 | 1,231,432,500 |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් උත්පාදනය වූ මුදල්** | | |
| | | |
| බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභ | | 5,577,306,273.36 |
| **ගැළපීම්** | | |
| දේපළ, පිරියත හා උපකරණ මත ක්ෂය වෙන්කිරීම් | 58,971,221.51 | |
| අඩුවෙන් සඳහන් කර ඇති පොලි ස්ථාවර තැන්පතු සඳහා | (1,203,093,36) | |
| බොල්ණය හා අඩමාන ණය සඳහා වෙන් කිරීම | 158,553,234,27 | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම | 2,368,570,00 | |
| විදේශ මුදල් ගණුදෙනු වලින් පාඩු | 1,643,315.65 | 220,333,248,07 |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය** | | 5,797,639,521.43 |
| | | |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීම** | | |
| ලැබිය යුතු ගිණුම්වල අඩුවීම | 1,909,823,711.94 | |
| ආපදා ණය අඩුවීම | 859,734.72 | |
| පෙරගෙවුම් අඩුවීම | 492,500.00 | |
| විශේෂ අත්තිකාරම් වැඩිවීම | (11,500.00) | |
| උත්සව අත්තිකාරම් වැඩිවීම | (7,900.00) | |
| මෝටර් රථ ණයවල වැඩිවීම | (1,195,967.42) | |
| නිවාස ණය වල අඩුවීම | 1,000,393.00 | |
| යතුරු පැදි ණය වල අඩුවීම | 929,241.44 | |
| විශේෂ ණයවල අඩුවීම - සුනාමි | 27,723.30 | |
| මිලදී ගැනුම් අත්තිකාරම් වල අඩුවීම | 114,440.00 | |
| ගුවන් ටිකට්පත් වලින් ලැබිය යුතු වැඩිවීම | (285,906.00) | |
| වැටුප් අඩුකිරීම් වලින් අය කරගත යුතු ප්‍රමාණයේ වැඩිවීම් | (12,981.94) | |
| ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොලිය අඩුවීම | 1,138,117.03 | |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (රඳවා ගැනීමේ බදු) අඩුවීම | 63,061,296.40 | |
| හිමිවිය යුතු ආර්ථික සේවා ගාස්තු වල අඩුවීම | 68,246,252.97 | |
| ලැබිය යුතු TDC (විදුලි සංදේශ සංවර්ධන ගාස්තු) වල අඩුවීම | 261,804,594,22 | |
| ගෙවිය යුතු ගිණුම් වල අඩුවීම | (74,690,933.04) | |
| ඉතිරිව ඇති කාර්ය මණ්ඩල ණය අය කිරීම් වල වැඩිවීම | (57,429.71) | |
| VAT පාලන ගිණුමේ අඩුවීම | (256,844,657.34) | |
| පලුදු වූ ඇන්ටෙනා සඳහා ලැබිය යුතු රක්ෂණ වන්දි අඩුවීම | (4,899,601.73) | |
| ගොඩනැගීම් ණයහිමි අඩුවීම | (3,465,548.79) | |
| අත්තිකාරම් වශයෙන් ලැබෙන ආදායමේ වැඩිවීම | 663,053,997.47 | |
| ආපසු ගෙවිය යුතු තැම්පතු වල වැඩිවීම | 2,500.00 | |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු 50% විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | 118,458,551.73 | |
| හිමිකම් නොපෑ සේවක ප්‍රතිලාභ | 7,737.98 | |
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංවිධාන බදු අරමුදලේ වැඩිවීම | (8,265,116,796.77) | (5,517,568,430.54) |
| | | |
| සේවය අවසන් කිරීමේ පාරිතෝෂික ගෙවීම | (131,910.00) | 280,071,090.89 |
| ආදායම් බදු ගෙවීම | (2,980,203,257.55) | (2,980,335,167.55) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් උත්පාදනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | | (2,700,264,076.66) |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය. ආයෝජන ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ** | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම | (14,964,719.16) | |
| ඉදිකිරීම් වැඩ | (154,581,011.67) | |
| ඒකාබද්ධ අරමුදල සඳහා දායකත්වය | (3,800,000.000.00) | |
| ස්ථාවර තැන්පතු | (2,844,765,00) | |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදල | 7,998,145,741.84 | |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල | | 4,025,755,246.01 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල්** | | |
| රාජ්‍ය දායකවීම | | 0.00 |
| ලෝක බැංකු ණය | | 0.00 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් | | 0.00 |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වල ශුද්ධ අඩුවීම | | 1,325,491,169.35 |

මුදල් හා මුදල් සමානුපාත වල විශ්ලේෂණය

| | 2010.12.31 | 2010.01.01 | කාල පරිච්ඡේදය තුල වෙනස්වීම |
|---|---|---|---|
| බැංකු මුදල් | | | |
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව ජංගම ගිණුම් අංකය :119-1-001-4-3693169 (එකතුවීම) | 694,399,600.17 | 31,784,243.00 | 662,615,357.17 |
| ලංකා බැංකුව - නාරාහේන්පිට ශාඛාව ජංගම ගිණුම් අංකය - 2323167 | 136,349,003.83 | 5,891,266.00 | 130,457,737.83 |
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව ජංගම ගිණුම් අංකය - 119-1-001-4-3693264 | 588,824,192.25 | 57,592,201.00 | 531,231,991,25 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංවිධාන බදු මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව ගිණුම් අංකය : 119/ආර්.එෆ්.සී/එස්.ජේ./යූ.එස්.ඩී/0032 | 54,881,244.62 | 55,316,905.00 | (435,660.38) |
| | 1,474,454,040.87 | 150,584,615.00 | 1,323,869,425.87 |
| අතැති මුදල් | 16,525.48 | 38,098.00 | (21,572.52) |
| කලින් වාර්තා කර ඇති මුදල් හා මුදල්වලට සමාන දෑ | 1,474,470,566.35 | 150,622,713.00 | 1,323,847,853.35 |
| විනිමය අනුපාතිකය වෙනස්වීමේ බලපෑම පරිදි | 0.00 | 0.00 | 1,643,316.00 |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 1,474,470,566.35 | 150,622,713.00 | 1,325,491,169.35 |

# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
# ගිණුම් සඳහා සටහන් 2010.12.31

1. ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1.1 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය මගින් හඳුන්වාදී ඇති ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඇත. මෙම ගිණුම් වලට උද්ධමනකාරී සාධකයක් සඳහා ගැලපීම් කර ඇත.

1.1.2 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම

ශේෂ පත්‍රයේ දිනට පසුව සිදුවූ සියලු ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගන්නා ලද අතර, අවශ්‍ය අවස්ථා වල ගිණුම් සඳහා ගැලපීම් සිදුකර ඇත.

1.1.3 විදේශ විනිමය පරිවර්තනය කිරීම

ගනුදෙනු සිදුවූ අවස්ථාවේ පැවති විදේශ විනිමය අනුපාතය සියළු විදේශ මුදලින් වූ ගණුදෙනු සඳහා යොදාගෙන ඇත. ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකය අනුව විදේශ මුදලින් ඇති වත්කම් සහ වගකීම් පරිවර්තනය කරයි. ප්‍රතිඵල ලෙස ඇතිවන ලාභය හෝ අලාභය ආදායම් වියදම් ගිණුමේ දක්වා ඇත.

1.1.4 පෙර වර්ෂ ගැලපීම

පෙර වර්ෂය සඳහා ගැලපීම් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 10 (කාලච්ඡේදය, සඳහා ශුද්ධ ලාභය හෝ අලාභය, මූලික වැරදි සහ ගිණුම්කරණ ප්‍රතිපත්තින්හි වෙනස්වීම්) අනුව වරණීය ක්‍රමය යටතේ ගිණුම්වල ඉදිරිපත් කරයි.

1.2 වත්කම් අගය කිරීම

1.2.1 ලැබිය යුතු වත්කම්

ලැබිය යුතු ගිණුම් වල වටිනාකම උපලබ්ධිවේ යැයි ඇස්තමේන්තු කර ඇති අගයන් අනුව ප්‍රකාශ කොට ඇත බොල්ණය සහ අඩමාන ණය සම්බන්ධව ගිණුම්වල වෙන් කිරීම් සිදුකර ඇත.

1.2.2 දේපළ, පිරියත සහ උපකරණ

1.2.2.1 දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයට, මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ ඒ සමග සිදුවන අනෙකුත් වියදම් අයත් වේ. පහත දක්වා ඇති සටහන් අංක 1,2,3 හි දක්වා ඇති ආකාරයට වෙන් කරන ලද සමුච්චිත ක්ෂය පිරිවැයෙන් (හෝ අගය කළ වටිනාකමෙන්) අඩුකළ අගය දේපල, පිරියත සහ උපකරණ ලෙස වාර්තා කොට ඇත.)

1.2.2.2 කොමිෂන් සභාවේ සම්පූර්ණයෙන්ම ක්ෂය කළ වාහන නැවත තක්සේරු කර 2010 ගිණුම් පොත් වලට ගෙන ඇත. වාහන 28 ක් රුපියල් 53,580,000 ලෙස නැවත තක්සේරු කර ඇති අතර 2010.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මෙසේ නැවත තක්සේරු කළ වාහන 12.5% ක අනුපාතයට ක්ෂය කොට ඇත.

1.2.2.3. ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය ගිවිසුම් යටතේ අත්පත් කරගත් දේපළ, පිරියත සහ උපකරණ වල අගය ප්‍රාග්ධනික කර ඇත.

1.2.3 ක්ෂය වීම්

දේපළ, පිරියත සහ උපකරණ වල පිරිවැය/ප්‍රත්‍යාගණය කළ අගය, පහත පරිදි ඒවායේ ඇස්තමේන්තු කළ ඵලදායි ජීවිත කාලය පුරා සමාන වාරික වලින් ලියා හැරීම සඳහා ක්ෂය වෙන් කිරීම ගණනය කර ඇත.

**දේපළ, පිරියත සහ උපරකණ වල ඇස්තමේන්තු කළ ඵලදායි ජීවිත කාලය**

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 |
| ලී බඩු හා සවිකිරීම | වසර 10 |
| කාර්යාල උපකරණ | වසර 10 |
| පරිගණක | වසර 04 |
| මෝටර් රථ | වසර 08 |

| | |
|---|---|
| විදුලි උත්පාදන යන්ත්‍ර | වසර 10 |
| කාර්යාල උපකරණ | වසර 10 |
| කාර්යාල ලි බඩු | වසර 10 |
| කාර්මික උපකරණ | වසර 10 |
| එෆ්.එම්.එම්.එස්. උපකරණ | වසර 10 |
| ජංගම නිරීක්ෂණ රථ | වසර 08 |

මිලදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණ වෙන් කිරීමක් සිදුකරන අතර ඉවත් කරන වර්ෂය සඳහා ක්ෂය වෙන් කිරීමක් සිදු නොකරයි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 ට අනුකූලව ප්‍රදානය කරන ලද වත්කම් සඳහා ක්ෂය ගණනය කර ඇත.

1.2.4 ආයෝජන

ආයෝජන, අත්පත් කර ගැනීමේ පිරිවැය මත ප්‍රකාශ කොට ඇත. ආයෝජනයන්හි අගය අඩුවීමක් ස්ථිර ලෙස සිදුවන්නේ යැයි අපේක්ෂා කරන්නේ නම් පමණක් අගය අඩුවීම සඳහා ප්‍රතිපාදනයක් සිදුකරයි.

1.3 වගකීම් සහ වෙන්කිරීම්

ශේෂ පත්‍ර දිනට පවතින සියළුම ප්‍රමාණාත්මක වගකීම් ශේෂ පත්‍රයේ පෙන්වා ඇති අතර, එදිනට පවතින නමුත් වටිනාකම නිවැරදිවම අගය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණපත් වෙන් කිරීමක් සිදුකොට ඇත.

1.3.1 ප්‍රාග්ධන බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම්

ශේෂ පත්‍ර දිනට ඇති ප්‍රාග්ධන බැඳියාවන් සහ අසම්භව්‍ය බැරකම් ගිණුම් සඳහා සටහන් හෙළිදරව් කොට ඇත.

1.3.2 ජාත්‍යන්තර සංවර්ධන සංගමය

ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය පිවිසුම යටතේ ලැබී ඇති අරමුදලේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 ට (රජයේ ප්‍රදාන සහ රජයේ සහයෝගීතාව සඳහා ගිණුම් කිරීම) අනුව ප්‍රාග්ධන ප්‍රවේශය යටතේ ගිණුම් ගත කොට ඇත.

1.4 ආදායම් හා වියදම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 29 අනුව උපචිත පදනම මත මූලික වශයෙන් ආදායම හඳුනාගෙන ඇත.

1.4.1 සෙස් සහ ක්‍රියාකරුවන්ගේ ගාස්තු පිළිවෙලින් ක්‍රියාකරුවන්ගේ පිරිවැටුම සහ අතිරේක අයෝජනයේ මත ප්‍රතිශතයක් ලෙස අයකරන අතර අදාළ ක්‍රියාකරුවන්ගේ මූල්‍ය වර්ෂය අවසානයේදී එකතු කර ගනී.

ක්‍රියාකරුවන්ගේ සහ කොමිසමේ මූල්‍ය වර්ෂය අවසාන වන දිනයන් එකිනෙකට වෙනස් වන හෙයින් සෙස් සහ ක්‍රියාකරුවන්ගේ ගාස්තු පවතින අළුත් තොරතුරු භාවිත කර උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

වර්ෂය තුළ වියදම ඉක්මවූ ආදායම තුළ ඉහත ගිණුම් ඇස්තමේන්තු වල වෙනස්වීමේ බලපෑම ඇතුලත් කර ඇත.

2009 වසර සඳහා එම බලපෑම පහත පරිදි වේ.

| | 2009 වසර සඳහා ඇස්තමේන්තුගත ආදායම(රු) | 2009 වසර සඳහා සත්‍ය ආදාය (රු) | ගිණුම්කරන වෙනස්වීමේ බලපෑම (රු) |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකරු ගාස්තු | 665,678,166.90 | 523,640,022.81 | 132,038,144.10 |
| සෙස් ගාස්තු | 383,433,506.97 | 356,386,556.56 | 27,046,950.41 |

1.4.2 රජයේ ප්‍රධාන
ආදායම හා සම්බන්ධ රජයේ ප්‍රදාන එම ප්‍රදාන ලැබිය යුතු වර්ෂයේ ආදායම් වියදම් ගිණුමේ හඳුනාගෙන ඇත.

**2 දේපළ, පිරියත සහ උපකරණ**

| පිරිවැය | 2010.01.01 දිනට ශේෂය | 2010 වර්ෂය සඳහා එකතු කිරීම් | ඉවත් කිරීම් මාරු කිරීම් | 2010.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් | 136,475,809.75 | 0.00 | 0.00 | 136,475,809.75 |
| කල්බදු ඉඩම් | 345,502.00 | 0.00 | 0.00 | 345,502.00 |
| ගොඩනැගිලි | 133,775,324.95 | 3,043,352.47 | 3,544,522.80 | 133,274,154.62 |
| වාහන | 89,419,738.67 | 51,708,500.00 | 36,971,236.67 | 104,157,002.00 |
| වායු සමීකරණ | 7,571,172.96 | 1,401,400.00 | 0.00 | 8,972,572.96 |
| විදුලි සෝපාන | 4,683,848.00 | 0.00 | 0.00 | 4,683,848.00 |
| විදුලි උත්පාදන යන්ත්‍ර | 2,665,427.50 | 0.00 | 0.00 | 2,665,427.50 |
| පරිගනක | 31,483,550.70 | 3,923,983.09 | 0.00 | 35,407,533.79 |
| වෙබ් සර්වර් | 2,213,660.93 | 0.00 | 0.00 | 2,213,660.93 |
| වෙනත් කාර්යාල උපකරණ | 17,237,889.16 | 276,723.00 | 0.00 | 17,514,612.16 |
| ජංගම දුරකථන | 485,436.12 | 56,650.00 | 0.00 | 542,086.12 |
| කාර්යාලීය ලී බඩු | 9,318,637.35 | 2,143,122.80 | 0.00 | 11,461,760.15 |
| කාර්මික උපකරණ | 11,959,404.78 | 3,641,875.00 | 0.00 | 15,601,279.78 |
| එෆ්.එම්.එම්.එස්. ව්‍යාපෘති නිරීක්ෂණ වාහන | 62,962,960.18 | 4,224,014.26 | 61,386,974.44 | 5,800.000.00 |
| එෆ්.එම්.එම්.එස්. ව්‍යාපෘති උපකරණ | 301,093,624.88 | 2,251,577.18 | 0.00 | 303,615,202.06 |
| වීඩියෝ ඒකක උපකරණ | 6,447,838.88 | 93,636.00 | 0.00 | 6,541,474.88 |
| | 818,139,826.81 | 73,034,833.80 | 101,902,733.91 | 789,271,926.70 |

| ක්ෂය වීම් | 2010.01.01 දිනට ශේෂය | 2010 වර්ෂය සඳහා එකතු කිරීම් | ඉවත් කිරීම් මාරු කිරීම් | 2010.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් | 70,586,709.37 | 6,651,096.84 | 0.00 | 77,237,806.21 |
| වාහන | 54,321,974.16 | 12,936,812.75 | 36,971,236.67 | 30,287,550.24 |
| වායු සමීකරණ | 7,111,073.80 | 387,534.41 | 0.00 | 7,498,608.21 |
| විදුලි සෝපාන | 4,683,848.00 | 0.00 | 0.00 | 4,683,848.00 |
| විදුලි උත්පාදන යන්ත්‍ර | 2,606,058.75 | 59,368.75 | 0.00 | 2,665,427.50 |
| පරිගනක | 23,247,450.10 | 3,999,924.58 | 0.00 | 27,247,374.68 |
| වෙබ් සර්වර් | 2,213,660.94 | 0.00 | 0.00 | 2,213,660.94 |
| වෙනත් කාර්යාල උපකරණ | 11,619,392.40 | 944,660.18 | 0.00 | 12,564,052.58 |
| ජංගම දුරකථන | 260,601.79 | 34,849.72 | 0.00 | 295,451.51 |
| කාර්යාලීය ලී බඩු | 5,634,103.86 | 1,114,906.08 | 0.00 | 6,749,009.94 |
| කාර්මික උපකරණ | 3,464,462.10 | 1,556,594.29 | 0.00 | 5,021,056.39 |
| එෆ්.එම්.එම්.එස්. ව්‍යාපෘති නිරීක්ෂණ වාහන | 61,386,980.45 | 725,000.00 | 61,386,974.44 | 725,000.00 |
| එෆ්.එම්.එම්.එස්. ව්‍යාපෘති උපකරණ | 270,605,643.40 | 31,117,993.36 | 0.00 | 301,723,636.76 |
| වීඩියෝ ඒකක උපකරණ | 5,148,998.88 | 338,078.00 | 0.00 | 5,537,076.84 |
| | 522,890,958.00 | 59,916,818.96 | 98,358,211.11 | |
| ශුද්ධ පොත් අගය | 295,248,868.81 | | | 304,822,366.86 |

සටහන් :
ඉඩම් සඳහා අගය වන රු. 136,475,809.75 තුළ මීගමුව කදිරාන හි පිහිටා ඇති රු. 45,000,000.00 ක් වටිනා ඉඩම් වල අගයද ඇතුළත්ය. එම ඉඩමේ විශාලත්වය අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 කි. ඉඩමේ විශාලත්වයෙන් ආසනන් වශයෙන් 50% ක ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් විසින් අත්පත් කරගෙන ඇත. එම අත්පත් කර ගැනීමෙන් වූ බලපෑම් තවමත් ගිණුම් වලට ගෙන නැත.

## කෙරීගෙනයන වැඩ

| | 2010.01.01 දිනට ශේෂය | 2010 වර්ෂය සඳහා එකතු කිරීම් | ඉවත් කිරීම් මාරු කිරීම් | 2010.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| තාප්පය ඉදිකිරීම - කදිරාන | 8,578,836.94 | 1,059,257.18 | 0.00 | 9,638,094.12 |
| ප්‍රවේශ ශාලාව සහ ප්‍රධාන කාර්යාලය අළුත්වැඩියා කිරීම | 180,000.00 | 0.00 | 0.00 | 180,000.00 |
| වව්නියා කුළුණ ඉදිකිරීම | 5,050,331.73 | 21,252,283.72 | 0.00 | 26,302,615.45 |
| කොකාවිල් කුළුණ ඉදිකිරීම | 90,047,881.47 | 132,186,755.16 | 0.00 | 222,234,636.63 |
| පෑලියගොඩ කුළුණ ඉදිකිරීම | | 82,715.61 | 0.00 | 82,715.61 |
| | 103,857,050.14 | 154,581,011.67 | 0.00 | 258,438,061.81 |

| | | 2009.12.31 |
|---|---|---|
| **ආයෝජන** | | |
| භාණ්ඩාගාර තැන්පතු | 354,000,000.00 | 354,000,000.00 |
| ස්ථාවර තැන්පතු (පාරිතෝෂික වෙන්කිරීම්) | 19,296,380.00 | 15,248,521.64 |
| රාජ්‍ය ආයතන වල තාවකාලික අතිරික්ත භාරකාර | 7,376,369,573.71 | 15,374,515,315.55 |
| අරමුදල | 7,749,665,953.71 | 15,743,763,837.19 |
| **ලැබිය යුතු ගිණුම්** | | |
| වෙළෙඳ ණය ගැතියෝ | | |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු | 2,159,744,355.62 | 4,024,801,269.43 |
| ක්‍රියාකරු ගාස්තු | 603,406,071.13 | 655,678,166.75 |
| සෙස් ගාස්තු | 390,933,786.12 | 383,433,506.97 |
| ආධුනික ගුවන් විදුලි | 22,144,37 | 17,126.03 |
| | 3,154,106,357.24 | 5,063,930,069.18 |
| අඩුකළා: බොල් ණය ගැත්තෝ සඳා වෙන් කිරීම් | (256,362,932.30) | (97,809,698.03) |
| | 2,897,743,424.94 | 4,966,120,371.15 |

| සටහන: | ණය ගැතියෝ | % | වෙන් කිරීම් |
|---|---|---|---|
| බොල් ණය සඳහා වෙන්කිරීම් | | | |
| අවු - 2 ට වැඩි | 254,714,539.85 | 100 | 254,714,539.85 |
| අවු - 1ට වැඩි 2ට අඩු | 16,483,924.48 | 10 | 1,648,392.45 |
| මාස - 6ට වැඩි අවු - 1ට අඩු | 63,134.06 | 0 | 0.00 |
| මාස - 2ට වැඩි 6ට අඩු | 29,096,114.07 | 0 | 0.00 |
| මාස 1 ට වැඩි 2ට අඩු | 636,842,554.55 | 0 | 0.00 |
| මාස 1ට අඩු | 1,222,566,347.87 | 0 | 0.00 |
| | 2,159,766,614.88 | | 256,362,932.00 |

සටහන:

මෙහෙයුම් බලපත්‍ර ගාස්තු සහ සෙස් ගාස්තු ඇස්තමේන්තු ගත දත්තයන් අනුව ගිණුම්ගත කර ඇති බැවින්, බොල් ණය වෙන් කිරීම් සඳහා සැලකිල්ලට ගෙන නොමැත.

| | 2009.12.31 | |
|---|---|---|
| **බැංකු ගිණුම්** | | |
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව | | |
| (තැන්පත් ගිණුම) | | |
| ගිණුම් අංකය: 119/ආර්.එෆ්.සී/එස්.ඒ/යූ.එස්.ඩී/0032 | 54,881,244.62 | 55,316,905.20 |
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව | | |
| ජංගම ගිණුම් අංකය - 119-1-001-4-3693169 | 694,399,600.17 | 31,784,242.59 |
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව | | |
| (ජාත්‍යන්තර විදුලි සංදේශ සංවිධාන බදු) | | |
| ජංගම ගිණුම් අංකය : 119-1-001-3-3693264 | 588,824,192.25 | 57,592,200.99 |
| ලංකා බැංකුව නාරාහේන්පිට ශාඛාව | | |
| ජංගම ගිණුම් අංකය : 2323167 | 136,349,003.83 | 5,891,266.21 |
| | 1,474,454.040.87 | 150,584,614.99 |
| **අතැති මුදල්** | | |
| සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය | 6,572.50 | 10,000.00 |
| සුළු මුදල් - කදිරාන | 2,075.00 | 5,000.00 |
| අතැති මුදල් | 140.00 | 23,098.00 |
| හිමිකම් නොපෑතු සේවක ප්‍රතිලාභ | 7,737.98 | 0.00 |
| | 16,525.48 | 38,098.00 |
| **ගෙවිය යුතු ගිණුම්** | | |
| උපචිත වියදම් | | |
| දුරකථන -කාර්යාල | 315,499.11 | 295,966.73 |
| නිවාස | 58,338.92 | 25,008.00 |
| වැටුප් පාලන ගිණුම (කොන්ත්‍රාත් පදනමේ සේවකයින්) | 749,019.66 | 345,955.00 |
| ගෙවිය යුතු වැටුප් | 74,197.00 | 74,197.00 |
| විදුලිය | 22,626.00 | 756,704.10 |
| ජලය | 14,832.00 | 113,004.80 |
| සනීපාරක්ෂක සේවා | 463,236.89 | 233,101.71 |
| ආරක්ෂක සේවා | 1,375,232.43 | 480,000.00 |
| අතිකාල දීමනා | 688,034.25 | 781,520.00 |
| සේවක අර්ථසාධක අරමුදල | 134,681.25 | 62,522.02 |
| සේවක භාරකාර අරමුදල | 16,161.75 | 7,502.58 |
| අන්තර්ජාලය | 2,848.50 | 2,309.20 |
| වෛද්‍ය රක්ෂණ ඉල්ලීම් | 78,064.46 | 1,050,846.50 |
| කාර්ය මණ්ඩල සුභ සාධනය | 174,067.00 | 144,752.00 |
| පුවත්පත් සහ දැන්වීම් | 37,080.00 | 6,955.00 |
| විගණන ගාස්තු | 1,031,400.00 | 840,000.00 |
| කල්බදු කුලී | 763,089.99 | 48,214,28 |
| ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 0.00 | 59,500.00 |
| රඳවා ගැනීම් | 40,595.00 | 40,595.00 |
| 2/3 පොලී ප්‍රතිපූර්ණය | 124,198.00 | 185,325.90 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 15,776,219.80 | 60,618,278.44 |
| (ආර්ථික සේවා ගාස්තු, | | |
| ජාතිය ගොඩනැගීමේ බදු සහ මුද්දර ගාස්තු) | | |
| වැටුප් වලින් අඩු කිරීම් | 61,305.28 | 12,054.17 |
| ගෙවිය යුතු අලුත්වැඩියා හා නඩත්තු වියදම් | 2,568,171.54 | 6,142,991.65 |
| ගෙවිය යුතු ඉන්ධන ගාස්තු | 33,933.00 | 96,630.60 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 176,139.59 | 169,425.00 |
| ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු | 101,055.80 | 144,198.22 |
| ගෙවිය යුතු සභාපතිගේ වේතනය | 0.00 | 25,000.00 |
| විවිධ මිලදී ගැනීම් හා සැපයීම් (ඇමුණුම 1) | 2,175,519.00 | 28,062,640.00 |
| විවිධ | 70,205.00 | 991,457.00 |
| | 27,125,751.86 | 101,816,684.90 |

| | | |
|---|---|---|
| **8. ආදායම්** | | |
| මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු | 434,632,607.20 | 899,275,180.20 |
| සෙස් ගාස්තු | 340,094,899.59 | 390,570,973.05 |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු | 5,116,864,418.82 | 4,936,331,831.39 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | 6,076,575.28 | 4,926,481.66 |
| ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | 29,513.35 | 67,729.21 |
| නාවික මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | 295,522.34 | 607,668.57 |
| ගුවන් යානා මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | 229,917.20 | 499,982.07 |
| රැහැන් රහිත දුරකථන බලපත්‍ර ගාස්තු | 1,927,122.52 | 1,080,123.11 |
| විභාග ගාස්තු | 7,461.76 | 4,574.55 |
| අයදුම්පත් සැකසීමේ ගාස්තු | 206,186.00 | 1,231,000.66 |
| කෙටි සංකේත ගාස්තු | 3,608,248.00 | 2,603,068.12 |
| අනෙකුත් වියදම් (8A) | 8,829,957.45 | 8,411,245.81 |
| | 5,912,802,429.51 | 6,245,609,858.40 |
| **8A. විවිධ ආදායම්** | | |
| කාර්ය මණ්ඩල ණය වලින් ලද පොලී ආදායම | 3,715,788.96 | 3,855,383.84 |
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම | 5,030,158.73 | 4,409,803.59 |
| විවිධ | 84,009.76 | 146,058.88 |
| | 8,829,957.45 | 8,411,245.81 |
| **8B. විදුලි සංදේශන සංවර්ධන ගාස්තු** | | |
| විදුලි සංදේශන සංවර්ධන ගාස්තු වලින් ආදායම | 836,873,071.96 | 0.00 |
| අඩුකළා : | | |
| විදුලි සංදේශන සංවර්ධන ගාස්තු වලින් භාණ්ඩාගාරයට ගෙවූ 50% | (299,978,117.00) | 0.00 |
| විදුලි සංදේශන සංවර්ධන ගාස්තු වලින් භාණ්ඩාගාරයට ගෙවිය යුතු 50% | (118,458,551.73) | 0.00 |
| | 418,436,403.23 | 0.00 |
| **9. නියාමන වියදම්** | | |
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ වාර්ෂික සාමජික මුදල් | 17,263,718.46 | 17,112,390.71 |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාවේ වාර්ෂික සාමාජික මුදල | 1,438,895.75 | 1,456,304.00 |
| වාර්ෂික පුස්තකාල සාමාජික මුදල් | 95,631.02 | 215,842.09 |
| පොදු රාජ්‍ය මණ්ඩල විදුලි සංදේශ සංවිධානයේ වාර්ෂික සාමාජික මුදල් | 3,506,303.37 | 3,821,421.02 |
| ජාතික අංකන දත්ත බැංකුව | 23,250.00 | 29,000.00 |
| මහජනයා දැනුවත් කිරිමේ වැඩසටහන් | 562,155.52 | 3,923,323.00 |
| නියාමන කටයුතු සඳහා සහභාගීවීම | 14,570,322.55 | 20,820,648.22 |
| නඩු ගොනු කිරීම හා නඩුවලට පෙනී සිටීම | 1,458,146.00 | 1,086,600.00 |
| විදුලි සංදේශනය - සංවර්ධනය පිළිබඳ මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් | 79,583.00 | 166,847.44 |
| ජාල සංවර්ධනය අධීක්ෂණය | 629,429.90 | 483,343.25 |
| පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම | 1,688,750.50 | 500,845.00 |
| ජංගම හා කේබල් රූපවාහිනි අධීක්ෂණය | 45,999.00 | 0.00 |
| ITU (ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය) - NGN මතු පරම්පරා ජාල වැඩමුළුව | 0.00 | 8,976,358.55 |
| SATRC (දකුණු ආසියාතික විදුලි සංදේශ නියාමකයන්ගේ කවුන්සිලය) රැස්වීම | 12,561,417.51 | 8,053,456.66 |
| SATRC (දකුණු ආසියාතික විදුලි සංදේශ නියාමකයන්ගේ කවුන්සිලය) ක්‍රියාකාරී සැලැස්ම සඳහා දායක වීම | 263,973.00 | 1,739,685.50 |
| ටෙලි සෙන්ටර් ව්‍යාපෘතිය | 1,102,977.00 | 1,192,305.37 |

| | | 2009.12.31 |
|---|---|---|
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා සංදේශන පහසුකම් | 314,524.07 | 4,520,065.95 |
| විදුලි සංදේශනය හා සම්බන්ධ සමීක්ෂණය | 0.00 | 104,778.50 |
| 1800 සංඛ්‍යාතය හිස්වීම | 0.00 | 12,978,891.74 |
| විදේශ නියෝජිතයන් පැමිණීම | 1,262,632.57 | 861,794.19 |
| සේවාවේ ගුණාත්මකභාවය පිළිබඳ සමීක්ෂණය | 0.00 | 12,625.00 |
| නව දත්ත බැංකුව (18A වගන්තිය) | 0.00 | 100,000.00 |
| බේරුවල පුහුණු මධ්‍යස්ථානය | 0.00 | 1,301,351.46 |
| 1800 සංඛ්‍යාතය හිස් කිරීම සඳහා වෙන් කිරීම | 7,024,330.72 | 0.00 |
| | 63,894,039.94 | 89,457,877.65 |
| | | |
| 10. ආයතන හා පරිපාලන වියදම් | | |
| වැටුප් | 61,610,354.68 | 57,471,371.69 |
| සේවක අර්ථසාධක අරමුදල (15% දායක මුදල්) | 8,441,246.73 | 8,220,432.30 |
| සේවක භාරකාර අරමුදල (3% දායක මුදල්) | 1,688,249,55 | 1,667,688.22 |
| ජීවන වියදම් දීමනාව | 11,526,503.39 | 9,486,215.56 |
| ප්‍රවාහන දිමනාව | 16,636,122.10 | 16,565,760.71 |
| ගෙවල් කුළී දීමාන | 5,290,865.48 | 4,944,436.59 |
| වෙනත් දීමනා | 153,831.21 | 255,813.69 |
| කාර්ය සාධන දිරි දීමනාව | 13,810,153.08 | 12,232,834.84 |
| අතිකාල | 10,094,054.65 | 8,938,173.18 |
| සභාපතිගේ වේතනය | 300,000.00 | 275,000.00 |
| පාවිච්චි නොකල විවේක නිවාඩු දීමනා | 3,395,212.00 | 3,286,351.56 |
| විශ්‍රාම වැටුප් සඳහා කොමිෂන් සභාවේ දායකත්වය | 162,896.00 | 0.00 |
| දුම්රිය ගාස්තු සහ බාරය | 8,220.00 | 14,380.00 |
| නිවෙස් දුරකථනය | 623,479.94 | 507,948.20 |
| නිල ඇඳුම් | 248,195.00 | 359,266.00 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 4,766,960.97 | 4,680,969.34 |
| ක්‍රීඩා කටයුතු වැඩි දියුණු කිරීම | 599,363,48 | 443,434.42 |
| කාර්ය මණ්ඩල වෘත්තිය සාමාජික මුදල් දායකත්වය | 332,616,58 | 334,317.80 |
| පුහුණු වියදම් - දේශීය | 611,094.19 | 1,574,343.17 |
| කොමිෂන් සභා සාමාජිකයන්ගේ දීමනාව | 7,341.22 | 3,000.00 |
| 2/3 නිවාස ණය පොලී ප්‍රතිපූර්ණය | 3,669,585.99 | 3,629,722.56 |
| ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 227,855.87 | 111,350.00 |
| පාරිතෝෂික | 2,368,570.00 | 3,226,282.50 |
| විදුලිය | 9,958,681.60 | 9,663,528.19 |
| ජලය | 1,232,850.73 | 1,140,747.61 |
| සනිපාරක්ෂක සේවා | 2,621,052.51 | 2,785,250.36 |
| ආරක්ෂක සේවා | 5,414,621.68 | 3,412,440.19 |
| වරිපනම් හා බදු | 0.00 | 808,888.00 |
| ආර්ථික සේවා ගාස්තු | 16,241,497.43 | 51,474,403.68 |
| පුස්තකාල පොත් | 350,043.71 | 453,466.14 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 4,536,295.72 | 3,865,103.99 |
| ඉන්ධන | 5,220,009.00 | 6,253,046.29 |
| විදුලි භාණ්ඩ | 103,781.00 | 91,861.00 |
| තැපැල් ගාස්තු | 557,542,00 | 419,600.29 |
| දුරකථන, ෆැක්ස් සහ පී.ඒ.බී.එක්ස් | 4,417,932.85 | 4,138,839.70 |
| රක්ෂණය (ස්ථාවර වත්කම් සහ වෛද්‍ය) | 18,782,669.50 | 22,293,755.68 |
| අන්තර්ජාල ගෙවීම් | 169,631.83 | 266,256.25 |
| පුවත්පත් හා දැන්වීම් | 5,942,181.45 | 7,679,885.91 |
| උපදේශන ගාස්තු | 0.00 | 128,500.00 |
| සම්මේලන සම්මන්ත්‍රණය | 183,055.00 | 399,564.00 |
| විගණන ගාස්තු | 707,059.00 | 688,841.00 |
| නීති වියදම් | 10,727.00 | 271,019.20 |

| | | 2009.12.31 |
|---|---|---|
| කල් බදු දේපල සඳහා කුලී | 1,827,813.57 | 3,603,617.33 |
| වාහන කුලී | 2,473.00 | 1,175.00 |
| කල්බදු අන්තර්ජාල කුලී | 412,360.00 | 510,875.15 |
| ක්ෂයවීම් | 58,971,221.51 | 48,695,836.92 |
| විවිධ පරිපාලන වියදම් | 2,257,647.63 | 2,988,016.58 |
| විවිධ මිලදී ගැනීම් හා සැපයීම් | 93,904.98 | 187,875.43 |
| විවිධ මෙහෙයුම් වියදම් | 750,774.56 | 585,535.79 |
| | 287,338,563.37 | 311,036,932.01 |
| **අලුත්වැඩියා කිරීමේ හා නඩත්තු වියදම්** | | |
| කාර්යාල උපකරණ නඩත්තු වියදම් | 2,218,854.70 | 1,815,317.60 |
| විදුලි සෝපාන නඩත්තු වියදම් | 364,911.88 | 317,600.50 |
| විදුලි උත්පාදක යන්ත්‍ර නඩත්තු වියදම් | 55,412.37 | 39,989.14 |
| වාහන නඩත්තු වියදම් | 7,151,076.11 | 8,030,069.62 |
| ගොඩනැගිලි නඩත්තු වියදම් | 1,387,271.42 | 2,046,961.79 |
| කාර්මික උපකරණ නඩත්තු වියදම් | 106,863.79 | 366,361.50 |
| මෘදුකාංග නඩත්තු සහ සංවර්ධන වියදම් | 14,468,148.62 | 15,494,360.11 |
| අධීක්ෂණ පද්ධතිය යාවත්කාලීන කිරීම | 8,171,046.94 | 0.00 |
| විවිධ අලුත්වැඩියා හා නඩත්තු වියදම් | 103,838.57 | 56,535.00 |
| | 34,027,414.40 | 28,167,195.26 |
| **මූල්‍ය හා අනෙකුත් වියදම්** | | |
| බැංකු ගාස්තු | 123,745.00 | 123,850.00 |
| බැංකු හර බද්ද | 7,094,895.75 | 6,250,143.85 |
| මුද්දර ගාස්තු | 1,201,764.00 | 1,070,844.00 |
| | 8,420,404.75 | 7,444,837.85 |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. } විවම / 5 / විදාර්සි /එංජ / 2010

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2011 අගෝස්තු 09 දින

සභාපති
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපති වෙත 2011 මැයි 20 දින ඉදිරිපත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම්කිරීම, ක්‍රියාත්මකකිරීම සහ පවත්වාගෙනයාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.

නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07, ශ්‍රී ලංකාව

சுதந்திர சதுக்கம்,
கொழும்பு 07, இலங்கை

INDEPENDENCE SQUARE,
COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone. } 2691151

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2697451

ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

## 1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්‍ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්‍ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරි වන සාක්ෂි නියැදි පදනම මත පරීක්‍ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර, 2010 දෙසැම්බර් 31 දිනට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

3

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.ගි.ප්‍ර)

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම භාරගන්නා බවට ප්‍රකාශයක් මූල්‍ය වාර්තා තුළ අන්තර්ගත කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට අනුව මූල්‍ය ප්‍රකාශනවල වෙනම කොටසක් ලෙස ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) රු. 21,533,040 ක් වූ පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදනය හා ඒ මත කරන ලද රු. 19,296,380 ක් වූ ආයෝජන මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ නමුත් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 ට අනුකූලව විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ පාරිතෝෂිත වගකීම් පිරිවැය පිළිබඳ අදාළ හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඈ) කොමිෂන් සභාව විසින් ආදායම් බදු ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් 2006/2007 හා 2007/2008 තක්සේරු වර්ෂයයන් සඳහා ගෙවිය යුතු දඩ මුදල් සමාලෝචිත වර්ෂය තුළ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් අත්හැර දැමීම පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 24 හි අවශ්‍යතාවයන් පරිදි හෙළිදරව් කර නොතිබුණි. 2010 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කරන බවට විගණකාධිපතිවරයා වෙත 2010 මැයි 20 දින අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා එවා තිබුණි.

(ඉ) දේපල, පිරියත හා උපකරණ විෂයයන් ප්‍රත්‍යාගණිත අගයට ප්‍රකාශ කර ඇතිවිට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව, ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනය, ස්වාධීන තක්සේරු කරුවෙකු යොදාගත්තේද යන්න අයිතමයන්හි සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු කිරීමේදී ව්‍යවහාර කළ ක්‍රම හා වැදගත් උපකල්පන මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් මෝටර් රථ 28 ක් රු. 53,580,000 ක වටිනාකමකට ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධයෙන් එපරිදි හෙළිදරවු කර නොතිබුණි.

4

**2.2.2 ලැබිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව සතු ජංගම වත්කම් අතුරින් 90% ක වටිනාකමක් ණය ගැතියන් නියෝජනය කළ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට මුළු ණයගැති වටිනාකම රු. 3,154,106,357 ක් විය. ණයගැති ශේෂයන් වාර්ෂිකව දිගින් දිගටම වර්ධනය වී තිබුණ අතර රු. 254,714,539 ක ණය ශේෂයන් වසර 02 හා 19 අතර කාල පරාසයක් දක්වා විහිදී තිබුණි. දීර්ඝකාලයක සිට පැවතෙන ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

(ආ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද ලේඛන අනුව ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තුවලට අදාළව ශූන්‍ය ශේෂයයන් සහිත වෙළෙඳ ණයගැතියන් ඇතුළුව 2204 දෙනෙකු පැවතුණු අතර එයින් ණයගැතියන් 866 දෙනෙකුට අදාළව රු. 2,159,744,355 ක මුදලක් ලැබිය යුතු ණය ශේෂ වශයෙන් දැක්වුණි. එම ණයගැතියන් අතුරින් කොමිෂන් සභාව විසින් ශේෂ සනාථ කිරීම සඳහා 298 දෙනෙක් වෙත ලිපි යවා තිබුණු අතර, එයින් ණයගැතියන් 43 දෙනෙකු විසින් පමණක් ශේෂ සනාථ කිරීම් සිදුකර තිබුණි. එම ණය ශේෂයන්ගේ අයවීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීමක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොතිබුණි.

**2.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති, රීති යනාදියට අනුකූල නොවීම් විගණනයේදී අනාවරණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම.** |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත 13 (8) වගන්තිය | 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව පාලක මණ්ඩලය විසින් සලකා බලා ඉදිරිපත් කළ දින සිට මාස 03 ක් ඇතුළත එහි දැක්වෙන කරුණු සම්බන්ධයෙන් සභාව ගැනීමට යෝජනා කරන්නේ කවර පියවරක්ද යන්න පිළිබඳව විගණකාධිපති වෙත දැන්විය යුතු වුවත් 2009 වාර්තාව සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |

5

(ආ) 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම්

(ඇ) මුදල් රෙගුලාසි
   i. මු.රෙ. 371(අ)

   ii. මු.රෙ. 371(ඇ)

   iii. මු.රෙ. 110

ඇත්තේ බොල් ණය වෙන් කිරීම පසුගිය වර්ෂයට වඩා රුපියල් මිලියන 137.097 කින් වැඩිවීමය.

### 3.1.2 මුල්‍ය කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව වසර පුරා අඛණ්ඩව විශාල අතිරික්ත මුදලක් අත රඳවාගෙන පැවතුණි. අවම වශයෙන් රු. මිලියන 216 ක් හා උපරිම වශයෙන් රු. මිලියන 2491 ක් අතර මුදලක් නිරන්තරයෙන් බැංකු ජංගම ගිණුමෙහි රැඳී පැවතුණි. ජාතික ආර්ථිකයට වඩාත් යහපත් ප්‍රතිඵල අත්වන අයුරින් මෙම ඌන උපයෝජිත මුදල් ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

(ආ) 2003 වර්ෂයේ ඉතිරිකිරීමේ බැංකු ගිණුමක තැන්පත් කරන ලද ඇමරිකන් ඩොලර් 420,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ඇමරිකන් ඩොලර් 497,186 ක් හෙවත් රු. 54,881,244 දක්වා වර්ධනය වී ඇතත් එම මුදල පසුගිය වසර 7 1/2 තුළදී උපයෝජනය කර නොතිබුණි. මෙමගින් 2010 වර්ෂය තුළ රු. 1,643,315 ක විනිමය පාඩුවක් සිදු වී තිබුණි.

(ඇ) 2005 මාර්තු 31 දිනැති අංක 1386/24 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව සෑම ක්‍රියාකරුවෙකුගෙන්ම අයකරන විදුලි සංදේශ සංවර්ධන බද්දෙන් 2/3 ක් කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද පරිදි විදුලි සංදේශ ජාල පහසුකම් නොමැති ප්‍රදේශවල හෝ එම පහසුකම් සතුටුදායක

මට්ටමක නොමැති ප්‍රදේශවල විදුලි සංදේශ ජාලය සංවර්ධනය කිරීම සඳහා ආපසු ලබා දීමට හැකිව තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විදුලි සංදේශ ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිවල යෙදෙන බව සනාථ කිරීමෙන් තොරව සිරිතක් ලෙස බද්දෙන් 2/3 ක් තබාගෙන 1/3 ක් පමණක් බදු වශයෙන් ගෙවා තිබුණි. මේ අනුව 2003 මාර්තු 03 සිට 2010 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා එම සමාගම අඩුවෙන් ගෙවා තිබුණු බදු මුදල රු. 6,671,610,884 ක් වූ අතර එම මුදල් අයකර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

## 3.2 මෙහෙයුම් සමාලෝචනය

### 3.2.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 22 (උ) වගන්තිය අනුව සෑම විදුලි සංදේශකරුවෙකු විසින්ම ඔවුන්ට විශේෂිත වර්ෂය වෙනුවෙන් නිකුත් කළ බලපත්‍රය සඳහා සෙස් ගාස්තු හා ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු ඉදිරි වර්ෂයේ ජනවාරි 31 දිනට ප්‍රථම ගෙවිය යුතු වුවද, ආයතන 06 ක් විසින් ගෙවිය යුතු තම සෙස් ගාස්තුව වූ රු. 190,801,708 ක එකතු මුදල මාස 01 සිට මාස 09 ක් දක්වා කාලපරාසයක් තුළද, ආයතන 04 ක් විසින් ගෙවිය යුතු තම ක්‍රියාකරු ගාස්තුව වූ රු. 236,776,650 ක මුදල මාස 03 සිට මාස 09 ක් දක්වා කාල පරාසයක් තුළ ද ප්‍රමාදව ගෙවා තිබුණි. යථෝක්ත ප්‍රමාදය මත අතිරේක ගාස්තුවක් අයකළ හැකි බව ක්‍රියාකරුවන් වෙත ලබාදෙන බලපත්‍රයේ සඳහන්ව ඇතත් එසේ ගාස්තු නිෂ්චය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ක්‍රියාකාරී බලපත්‍ර හා සෙස් ගාස්තු ප්‍රමාද වී ගෙවීම හා නොගෙවීම මත අතිරේක දඩ මුදලක් අයකර ගැනීමේ නීතිමය බලයක් දැනට පවතින විදුලි සංදේශ පනතේ නොමැති අතර එම නීතිමය බලය ලබාගැනීමේ ක්‍රමවේදයන් විදුලි සංදේශ සංශෝධන පනතට ඇතුලත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බවට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් 2011 ජුනි 28 දින විගණකාධිපතිවරයා වෙත එවන ලද 14 (2) (සී) කොටුම්පත් වාර්තාවට අදාල පිළිතුරු ලිපිය මගින් දක්වා තිබුණි.

(ආ) යම් විදුලි සංදේශ උපකරණයක් වෙළඳාමක් වශයෙන් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, පැවරීම, කුලියට දීම, බදුදීම ක්‍රියාකර පෙන්වීම නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම කිසිවෙකු විසින් සිදු කෙරේ නම් ඒ සඳහා 1996 අංක 27 දරන විදුලි සංදේශ පනතින් සංශෝධිත, 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 21 වගන්තිය අනුව කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් ලබාගත යුතු වුවද එසේ බලපත්‍රයක් ලබාගැනීමකින් තොරව දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි ව්‍යාපාරික කටයුතුවල නිරතවන බව නිරීක්ෂණය විය. විගණනයේදී සිදු කරන ලද නියදි පරීක්ෂණයට අනුව එවන් ආයතන 37 ක් බලපත්‍ර නොමැතිව ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන බව නිරීක්ෂණය

විය. මෙවැනි බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාරික කටයුතුවල නියැලෙන ආයතන කවරේද යන්න සොයා බලා ගාස්තු අයකර ගැනීමේ ක්‍රමවේදයක් කොමිෂන් සභාව විසින් යොදා නොතිබෙන බව නිරීක්ෂණය විය.

(ඇ) කොමිෂන් සභාව සතු ගත්මිල රු. 7,304,348 ක් වටිනා මිට්ෂුබිසි වර්ගයේ ජීප් රථයක් තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය වෙත 2005 වර්ෂයේදී මුදාහැර තිබුණි. 2003 ජුනි 02 දිනැති චක්‍රලේඛ අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.3.9 වගන්තියට පටහැනිව මුදාහැර ඇති මෙම වාහනය නැවත කොමිෂන් සභාව වෙත ලබාගැනීමට මෙතෙක් හැකිවී නොතිබුණි.

**3.2.2 සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් කිරීම හා ක්‍රියාකාරී සැලැස්ම.**

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පී.ඊ.ඩී. 47 හා 2007 දෙසැම්බර් 18 දිනැති චක්‍රලේඛය පරිදි සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහපාලනය පිළිබඳව මාර්ගෝපදේශ සංග්‍රහයේ 05 පරිච්ඡේදය පරිදි විස්තරාත්මකව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මක් වර්ෂය ආරම්භයට දින 15 කට ප්‍රථම විගණකාධිපති, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ ලේකම් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලේකම් වෙත එහි පිටපත් ඉදිරිපත් කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. තවද කොමිෂන් සභාව සතුව දැනට පවතින සංයුක්ත සැලැස්මට අනුව කළමනාකරණයේ වගකීම පැහැදිලිව හඳුනාගැනීමට හැකිවන අයුරින් සභාවේ වැදගත් අංශයන් වන මානව සම්පත්, පරිපාලනය, මූල්‍ය හා සැලසුම් යන අංශයන් හඳුනාගෙන සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ආ) සැලසුම් ගත කාලපරිච්ඡේදය තුල ඉටුකරගත යුතු ඉලක්කයන් දැක්වෙන, ක්‍රියාකාරී සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි. තවද පවතින සංයුක්ත සැලැස්ම කාලීනව සංශෝධනය කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේදී ඉටු කර ගැනීමට බලාපොරොත්තු වූ අභිමතාර්තයන් හා ඉලක්ක කවරේද යන වග හා එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය කොතෙක් දුරට ලඟා කරගත්තේද යන්න ඇගයීමට ලක්කර ගත නොහැකි විය.

3.2.3 මතභේදයට තුඩු දුන් ගණුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලබා නොගත් නිවාඩු දීමනාව හා නිවාස ණය පොලියෙන් 2/3 ක් ප්‍රතිපූර්ණය කිරීම යන දීමනා සඳහා පිළිවෙලින් රු. 3,395,212 ක් හා රු. 3,669,585 ක් මහාභාණ්ඩාගාර අනුමැතිය නොමැතිව සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

(ආ) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් 2007 ජුනි 13

දිනැති එහි අංක එන්එස්සීසී/3/ඒබීසී/24 දරන ලිපියෙන් පැහැදිලිව දක්වා තිබුණු පරිදි අදාළ ආයතන විසින් තම සේවකයන් වෙනුවෙන් නිවස කුලියෙන් 10% නොගෙවිය යුතුය. කෙසේ වුවද එම විධිවිධානවලට පටහැනිව කොමිෂන් සභාව විසින් එහි සේවකයන් වෙනුවෙන් නිවාස කුලී වශයෙන් රු. 5,290,865 ක් ගෙවා තිබුණි.

### 3.2.4 නිශ්ක්‍රිය වත්කම්

රු. 30,484,695 ක පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පරිගණක හා තාක්ෂණික උපකරණ උපයෝජනයකින් තොරව පැවැති අතර මේවා පරීක්ෂා කර නැවත ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.2.5 අයවැය ලේඛනමය පාලනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අයවැයගත සංඛ්‍යා සමඟ සැසඳීමේදී සැලකිය යුතු විචලනයන්ගෙන් යුක්ත වූ අතර අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. ඒ පිළිබඳව නිදසුන් කිහිපයක් පහතින් දැක්වේ.

| විෂයය | අයවැය ගත රු. | තථ්‍ය සංඛ්‍යා රු. | වෙනස රු. |
|---|---|---|---|
| ආයතන හා පරිපාලන වියදම් | 141,532,930 | 287,338,563 | (145,805,633) |
| අඩමාන ණය සඳහා වෙන්කිරීම | 104,500 | 158,553,234 | (153,613,234) |
| ඒකාබද්ධ අරමුදලට ගෙවීම | 3,200,000,000 | 3,800,000,000 | (600,000,000) |
| ආයෝජන | 21,104,615,099 | 7,749,665,953 | (13,354,949,146) |
| ගෙවිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | | 118,458,551 | (118,458,551) |
| ගෙවිය යුතු ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු ගාස්තු | 20,742,422,424 | | 20,742,422,424 |

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) අයවැය
(ආ) සංයුක්ත සැලැස්ම
(ඇ) ක්‍රියාකාරි සැලැස්ම
(ඈ) අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම
(ඉ) ණය ගැතියෝ

**එච්.ඒ.එස්. සමරවීර**
වැඩබලන විගණකාධිපති

## සටහන

www.trc.gov.lk

TRC

ශ්‍රී ලංකා
විදුලි සංදේශ නියාමන
කොමිෂන් සභාව

නො. 276, ඇල්විටිගල මාවත, කොළඹ 08, ශ්‍රී ලංකා.
දුරකථන: +94 11 2689345 / 2689351 / 2689352
ෆැක්ස්: +94 11 2689341 ඊමේල්: dgtsl@trc.gov.lk

www.trc.gov.lk